දෙසතිය

පුවත් සඟරාව
2019 අගෝස්තු 01



මීදෙනිය වලව්වේ අත්තම්මා

'මහවැලිය - සංහිඳියාවේ ගංගාව' සහ '95න් පසු මහවැලි' යන ග්‍රන්ථ ද්විත්වය ජනගත කළේ ජනපතිගේ ප්‍රධානත්වයෙන්. ඒ, ජූලි මස 24 වැනි දා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී. කඳුරට, රජරට, උතුරු නැගෙනහිර මතු නො ව අද වයඹත් සිය දියවරින් එක සේ තෙමාලන මහා ගංගාවේ ගමන 'මහවැලිය - සංහිඳියාවේ ගංගාව' ග්‍රන්ථය තුළ අන්තර්ගත යි. සිහිනයක් ව පැවති මහවැලියේ දුෂ්කර ම පරිච්ඡේදය මොරගහකන්ද කළු ගඟ මහා ජලාශය ඇතුළු වියළි කලාපීය වාරි විස්මිතයේ කතාව ප්‍රකාශයට පත් කළේ '95න් පසු මහවැලි' ග්‍රන්ථයෙන්. එය සම්පාදනයේ මූලිකත්වය ගත්තේ මහවැලි අධිකාරිය යි. ග්‍රන්ථ ද්විත්වයේ ම ප්‍රධාන සංස්කාරකත්වය දැරුවේ කේ. ආරියතුංග යි.

පටුන

දෙසතිය
2019 අගෝස්තු 01

කවරයේ කතාව

18 මීදෙනිය වලව්වේ අත්තම්මා

03 පලාලි ගුවන්තොට ජාත්‍යන්තරයට

07 කොළොම්තොට නැත මහලු වී

13 තුන්කොන් කතාබහ උණුසුම්

28 දැක ගන්න සොබාසිරි හිඳ යන්න හෙනරත්ගොඩ

30 ත්‍රස්තවාදය හා මාධ්‍ය භාවිතය සුළුකොට තකන්න බැහැ

32 ස්ත්‍රී අධ්‍යාත්මයට එබුණු ස්ත්‍රිය

35 සංසාරේ දඩයක්කාරයා

38 අවැසි වන්නේ සහෘද සංවේදී නිලදරුවන්

40 සිව් වසරක අපේක්ෂාව ලෝක නෙට්බෝල් ශූරතාව

දෙසතිය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

සංස්කාරක මණ්ඩලය
දු. අ. 011 - 2513757 / 0112 - 513153
විද්‍යුත් තැපෑල - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2515759/ දිගුව - 232

වෙළුම 42, කලාපය 12, 2019 අගෝස්තු 01

උපදේශක සංස්කාරක
නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අධීක්ෂණ සංස්කාරක
තිලකරත්න ලියනපටබැඳි

සංස්කාරක
මාලා මල්කාන්ති පරණගමගේ

සහය සංස්කාරක
මහේෂිකා දිසානායක

ඡායාරූප සංස්කරණය
රූ රටා සහ කවර නිර්මාණය
සංජීව පෙත්තාවඩු

විශේෂාංග ලේඛකයෝ
ආනන්ද ජයසිංහ
ඩොනල්ඩ් සේනාධීර
ශ්‍යාමා සන්ධ්‍යානායකගේ
කාංචනා සිරිවර්ධන
මනෝජා සමරනායක

ප්‍රවෘත්ති නිලධාරි
නිල්මිණි ප්‍රනාන්දු

කළමනාකරණ සහාය
චන්ද්‍රිකා ගුණසේකර

ඡායාරූප උපදේශක
සුදත් සිල්වා

ඡායාරූප ශිල්පීන්
ලක්සිරි සුභාෂණ අල්විස්
යමුනි රශ්මිකා
දර්ශන කරුණාරත්න
තුසිත චන්ද්‍රකුමාර
එල්. ඒ. රෝහණ

පිටකවරයේ ඡායාරූපය
දයාන් විතාරණ

බෙදාහැරීමේ කළමනාකරු
ඩී. කේ. විතානගේ

මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ප්‍රකාශනය හා බෙදාහැරීම
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

විශ්වීය කලාවේ රුව ගුණ දුටු ඇය

වේදිකාව, රිදී තිරය හා පුංචි තිරය එක ලෙස ජය ගත් ඇය නමින් අයිරාංගනී සේරසිංහ. නොබෝදා සිය දිවියේ 92 වැනි සැතපුම් කනුව පසු කළ ඇය තවමත් රංගනයේ නිරත ව සිටින්නේ සමකාලීන හා නව පරපුරට ශක්තියක් වෙමින්. ශික්ෂණයෙන් ලැබූ ඇගේ රංග ප්‍රතිභාව ළමා, තරුණ, මහලු ප්‍රේක්ෂක හදවත් සොරා ගැනීමට යි සමත් වුණේ. එය දෙස්, විදෙස් ප්‍රේක්ෂකාගාර කරා ගෙන යමින් ඔවුන්ගේ කාල්පනික ලෝකයට සාධාරණත්වය ඉටු කිරීමෙන් අයිරාංගනී සේරසිංහ පරමාදර්ශී චරිතයක් වීම ශ්‍රී ලාංකිකයන් ලෙස අප ආඩම්බර විය යුතු කරුණක්.

ඇගේ උපන් පෙළපත, අධ්‍යාපන මට්ටම මෙන් ම ලැබූ සමාජ ඇසුර රංගන දිවියේ සාර්ථකත්වය පිටුපස තිබෙන බව අප හැම දන්නා කරුණක්. එමෙන් ම ඇගේ නිහතමානී ගති පැවතුම් හා ලෙන්ගතු බව කියා පාන්නේ කලාවේ දිගු ගමනක් යන්නට එයින් ලැබෙන විශ්වීය ආශීර්වාදය ඉතා බලවත් බව යි. රංගන ක්ෂේත්‍රයේ ඇය වටා සිටින නම රැන්ඳූ රංගන ශිල්පීන් ඇය පිළිබඳ ඉමහත් ගර්වයෙන් කතා කරන්නේ ඇගෙන් ලද ගුරුහරුකම් වඩාත් කෘතවේදී ව සිහිපත් කරමින්.

කෙසේ වෙතත් අප කනගාටු විය යුතු කරුණක් මේ මොහොතේ සිහිපත් කිරීම කළ යුතු යි. ඇතැම් රංගන ශිල්පීන්, ශිල්පිණියන් හැරුණු විට නව පරපුර මේ වන විට ගමන් කරමින් සිටින්නේ කලාවේ මුඛ්‍ය අරමුණුවලින් බැහැර වූ ගමන්මඟක. එහිදී කැපී පෙනෙන කාරණය වන්නේ රංගනය ආර්ථික ප්‍රතිලාභ මූලික කර ගැනීමත් නිසි හැදෑරීමකින් තොර ව එය විලාසිතාවක් කර ගනිමින් ජනප්‍රියත්වය සොයා යාම යි. අනෙක් අතට ඇතැම් නිර්මාණකරුවන් දැනුමෙන්, කුසලතාවෙන් පෝෂණය නොවීමත් නව පරපුර සතු රංග කුසලතාව හඳුනා ගැනීමට බාධාවක් වී තිබෙනවා. මේ නිසා කලාවේ පැවැත්ම රැක ගැනීමටත් අප ඉදිරියේ තිබෙන්නේ විශාල අභියෝගයක්.

මේ සඳහා අප කළ යුතු කාර්යයන් රැසක් තිබෙනවා. ඒ, වගකිව යුතු පාර්ශ්ව විසින් කලාව යමින් තිබෙන මග නැවතත් වෙනස් කරමින් එහි රූව ගුණ නව පරපුර වෙත යළි ළං කරවීමට පියවර ගැනීම යි. එහිදී 'අයිරාංගනී සේරසිංහ' වැනි යුගයේ දැවැන්ත චරිත මනාව හැදෑරීමට කටයුතු කිරීම වැදගත්. මෙරට රිදී තිරය පමණක් නොව ජගත් රිදී තිරය ද එකලු කරන්නට ඇයට හැකි වූයේ ඇය සතු වූ විශ්වීය රංගනයේ අපමණ ගුණය යි.

මේ නිසා අයිරාංගනී සේරසිංහ නම් වූ මීදෙනිය වලව්වේ අත්තම්මා අද අප ආදරයෙන් වැළඳ ගත යුත්තේ ඇය කලාවේ පරමාදර්ශී චරිතයක් වූ නිසා ම නොවෙ යි. ඇය සතු මානවීය ගුණධර්ම කලාවේ පැවැත්මට ගෙන දුන් ආශීර්වාදය මතුවටත් අපට අවශ්‍ය වන නිසා.

ඇයට චිරං ජයතු !!.

- සංස්කාරක -

පලාලි ගුවන්තොට ජාත්‍යන්තරයට

දයා ලංකාපුර

යාපනයේ පලාලි ගුවන් තොටුපොළ මේ වසරේ සිට ශ්‍රී ලංකාවේ තුන් වැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ බවට පත්වීමට නියමිත යි. ඒ, ලබන සැප්තැම්බර් මාසයේදී ඉන්දියාව ඇතුළු ආසියානු කලාපයේ රටවල් කිහිපයකට සිවිල් ගුවන් සේවා ආරම්භ කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් කටයුතු කරගෙන යන බැවින්.

මේ සඳහා අදියර තුනක් යටතේ පලාලි ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම දැන් ආරම්භ කොට තිබෙනවා. ඒ වෙනුවෙන් කළ ආයෝජනය රුපියල් මිලියන 2250ක්. එයින් රුපියල් මිලියන 1950ක් ශ්‍රී ලංකා රජය වැය කරන අතර රුපියල් මිලියන 300ක ආධාර මුදලක් මේ සඳහා ලබා දෙන්නේ ඉන්දීය රජය විසින්.

පළමු අදියරේදී දැනටමත් ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගැනෙන මීටර් 2305ක් දිග ප්‍රධාන ධාවන පථයෙහි මීටර් 950ක අලුතින් කොන්ක්‍රීට් ඇතිරීම යි සිදු කෙරෙන්නේ. එය නිම වූ පසු ආසන 72ට අඩු 'Bomberdier 100' වර්ගයේ ගුවන්යානා පලාලි ගුවන් තොටුපොළට ගොඩ බැස්සවීමට හැකි වන බව පැවසුවේ ගුවන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය අර්ජුන රණතුංග. ඒ පලාලි ගුවන් තොටුපොළ කලාපීය ගුවන් තොටුපොළ ලෙස සංවර්ධනය කිරීම ආරම්භ කරමින් පසුගියද එහි පැවැති උත්සවයට එක් වෙමින්.

යාපනයේ සිට කිලෝමීටර් 16ක් දුරින් පිහිටි පලාලි ගුවන් තොටුපොළ 1940 වසරේ දෙවැනි ලෝක යුද්ධ සමයේදී බ්‍රිතාන්‍යය රාජකීය ගුවන් හමුදාව විසින් ඉදිකොට තිබෙන්නක්. ඒ, ඔවුන්ගේ යුද ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා යි. එම යුද්ධය අවසන් වීමෙන් පසු බ්‍රිතාන්‍ය ගුවන් හමුදාව මෙය අතහැර දමා ඇති අතර පසුව සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව යටතට යි එය පත් වන්නේ.

මෙහිදී ඉන්දියාව කේන්ද්‍ර කරගනිමින් කලාපීය වශයෙන් සිවිල් ගුවන් සේවා ආරම්භ කිරීමට යි නියමිත. මෙහි පළමු අදියර අවසන් වීමෙන් පසු ඉන්දියාවේ මුම්බායි, හයිද්‍රාබාද්, කොචින් හා බැංගලෝර් ආදී ගමනාන්ත දක්වා ගුවන් ගමන් ආරම්භ කෙරෙනු ඇති. පලාලි ගුවන්තොටුපොළ ශ්‍රී ලංකාවේ තුන්වැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ බවට පත් වනුයේ ඒ අනුව.

පලාලි ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ දෙවැනි අදියරේදී ප්‍රධාන ධාවන පථයේ තවත් කිලෝමීටර් 1.5ක ප්‍රමාණයක් අලුතින් කොන්ක්‍රීට් ඇතිරීම සිදු කෙරෙනු ඇති. ප්‍රධාන ධාවන පථයේ මුළු දුර ප්‍රමාණය වූ කිලෝ මීටර් 2.3 දක්වා සම්පූර්ණයෙන් ම කොන්ක්‍රීට් ඇතිරීම තෙවැනි අදියරේදී සිදු කිරීමට නියමිත බව සිවිල් ගුවන් සේවා අධිකාරිය ප්‍රකාශ කරනවා.

යාපනයේ සිට කිලෝමීටර් 16ක් දුරින් පිහිටි පලාලි ගුවන් තොටුපොළ 1940 වසරේ දෙවැනි ලෝක යුද්ධ සමයේදී බ්‍රිතාන්‍යය රාජකීය ගුවන් හමුදාව විසින් ඉදිකොට තිබෙන්නක්. ඒ, ඔවුන්ගේ යුද ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා යි. එම යුද්ධය අවසන් වීමෙන් පසු බ්‍රිතාන්‍ය ගුවන් හමුදාව මෙය අතහැර දමා

ඇති අතර පසුව සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව යටතට යි එය පත් වන්නේ.

යළි මෙය සක්‍රීය වූයේ 1947 වසරේදී 'එයාර් සිලෝන්' ගුවන් සමාගම පිහිටුවීමත් සමඟ යි. එම සමාගම සඳහා ඩැකෝටා ඩී. සී. 3 (DAKOTA DC 3) වර්ගයේ ගුවන් යානා 3ක් මිල දී ගෙන තිබුණා. 'එයාර් සිලෝන්' ගුවන් ගමන් මෙහෙයුම් සිදු කෙරුණේ රත්මලාන ගුවන් තොටුපොළ කේන්ද්‍ර කරගනිමින්.

මේ සමාගමේ ප්‍රථම මංගල ගුවන් ගමන සිදු කර ඇත්තේ 1947 දෙසැම්බර් 10 දා. 'සීතාදේවී' යනුවෙන් නම් කොට තිබූ එම 'ඩැකෝටා' ගුවන්යානය එදින රත්මලාන ගුවන් තොටුපොළේ සිට මගීන් 16 දෙනකු ද රැගෙන ගුවන්ගත වී පලාලි ගුවන් තොටුපොළට ගොඩ බැස එහිදී තවත් මගීන් ද රැගෙන මදුරාසිය (දැන් චෙන්නායි) බලා පියාසර කළ බව යි ශ්‍රී ලංකා ගුවන් ඉතිහාසය විමසන විට පෙනී යන්නේ.

එම යානයේ නියමුවා වශයෙන් කටයුතු කර ඇත්තේ කපිතාන් පීටර් ප්‍රනාන්දු යි.

දැනට වසර 72කට පෙර ද උතුරේ ජනතාවට පලාලි සිට මදුරාසියට ගුවනින් යාමට හැකි වී තිබුණා පමණක් නොව ඔවුන්ට 'එයාර් සිලෝන්' යානා මඟින් අම්පාර, මඩකලපුව, රත්මලාන හා ත්‍රිකුණාමලයට ද යාමට හැකි වුණා.

මේ අතර උතුරේ කොටි ත්‍රස්තවාදී තර්ජන ආරම්භ වීමත් සමඟ 1976 වසරේ දී පලාලි ගුවන් තොටුපොළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව යටතට යි පත්ව තිබුණේ. යුද්ධයෙන් පසු යළි සිවිල් ගුවන් ගමන් ආරම්භ වීම නිසා 2013 ජනවාරි මස 4 වැනි ද පලාලි ගුවන් තොටුපොළේ නව මගී පර්යන්ත ගොඩනැගිල්ල විවෘත කරනු ලැබුවා.

පලාලි ගුවන් තොටුපොළ කලාපීය ගුවන් තොටු පොළක් ලෙස සංවර්ධනය කිරීමේදී එහි මගී පර්යන්ත ගොඩනැගිල්ල ද නවීකරණය කෙරෙනවා. ඒ අතර රාත්‍රී කාලයේදී ගුවන් යානා ගොඩබැස්සවීමට හැකි වන පරිදි ගුවන් ධාවන පථයේ විදුලි බුබුළු අලුතින් සවි කිරීමට යි නියමිත. ගුවන් යානා නතර කර තැබීම සඳහා අංගනයක් (හැන්ගර්) ද ඉදි කිරීමට නියමිත අතර ගුවන් යානා පාලන කුලුන ද නවීකරණය කෙරෙන බව යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍ය අශෝක් අබේසිංහ පවසන්නේ.

මේ වන විට පලාලි ගුවන් තොටුපොළේ කොටසක් ගුවන් හමුදාව මඟින් ද අනික් කොටස සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව යටතේ ද පාලනය වෙනවා. ගුවන් හමුදාවේ ගුවන් යානා මෙන් ම සිවිල් ගුවන්යානා ද මෙහි සිට මඟින් හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සිදු කරනවා.

මේ අනුව අදියර තුනේ ම සංවර්ධන කටයුතු අවසන් වූ පසු පලාලි ගුවන් තොටුපොළේ පාලන කුලුන මඟින් වර්ග කිලෝමීටර් 1800 ක ගුවන් අවකාශය ආවරණය වන පරිදි ගුවන්යානා හැසිරවීමට හැකි වන බව යි සිවිල් ගුවන් සේවා අධිකාරිය පවසන්නේ.

මෙහි තුන් වැනි අදියර නිම වීමෙන් පසු චීනය, තායිලන්තය සහ ඇතැම් ආසියානු රටවල ඒ 320, ඒ 340 ආදී 'එයාර් බස්' ගුවන් යානාවලට පලාලි ගුවන් තොටුපොළට පැමිණීමට අවස්ථාව හිමි වීමත් සුවිශේෂී කරුණක්.

දුම්කොළ පනත යළි පණගෙන

2003 වර්ෂයේ ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් දුම්වැටි පාලනය සඳහා ප්‍රඥප්තියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා රටවල් 168ක් අත්සන් තබා ඇති බව යි සඳහන් වන්නේ. එක්සත් ජාතීන්ගේ ඉතිහාසයේ වඩාත් පුළුල් ලෙස ම අනෙකුත් රටවල දායකත්වය ලැබුණු ප්‍රඥප්තිය මෙය යි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නූතන සමීක්ෂණ වාර්තාවලට අනුව ලෝක ජනගහනයෙන් බොහෝ පිරිසක් රෝගීන් බවට මෙන් ම මරණයට පත්වන්නේ දුම්කොළ හා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන්. වසරකට ලෝක ජනගහනයෙන් මිලියන 18ක් මියයන බවයි ලෝක සෞඛ්‍ය සංවිධානය අනාවරණය කරන්නේ. ශ්‍රී ලංකාවේ දුම්පානය නිසා වසරකට 20,000කට ආසන්න සංඛ්‍යාවක් සහ මද්‍යසාර භාවිතයෙන් 20,000කට අධික පිරිසක් මිය යන බවත් හෙළි වී තිබෙනවා. මේ නිසා එය ගෝලීය සෞඛ්‍ය ගැටලුවක් ලෙස යි හඳුනාගෙන තිබෙන්නේ.

මෙවැනි පසුබිමක ලෝකයේ විවිධ සම්මුති, එකඟතා, අධ්‍යයන, පර්යේෂණ ඔස්සේ විසඳුම් සෙවීමට පියවර ගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ ඒ සඳහා පෙළ ගැසීම ද විමසා බැලිය යුත්තේ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත පිළිබඳ දිවයින පුරා මේ දිනවල විශේෂ කතාබහක් ගොඩනැගෙමින් තිබෙන නිසා. ඒ, 2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත උල්ලංඝනය කරන පුද්ගලයන් නීතියේ රැහැනට හසුකර ගැනීමට ඉකුත් ජූලි මස තුන්වැනි සතියේ සිට ක්‍රියාත්මක වීමත් සමඟ.

ඒ අනුව, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් මඟින් දිවයින පුරා විශේෂ වැටලීම් සිදු කිරීමට දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය කටයුතු කළා. 2006 වසරේදී දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික පනත ඉදිරිපත් වුව ද වෙළඳසැල් මඟින් වයස 21න් පහළ පුද්ගලයන්ට දුම්කොළ සහ මද්‍යසාර අලෙවි කිරීම සිදුවෙනවා. ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ පුවත්පත් සඟරා ආදියෙහි එම පනත උල්ලංඝනය කරමින් වක්‍ර ලෙස දුම්වැටි සහ මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කිරීමත් දැකිය හැකි යි. මේ අනුව මෙය වළක්වා ගනිමින් ශක්තිමත් ලෙස පනත ක්‍රියාත්මක කිරීමට දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ අධිකාරිය විසින් පියවර ගැනීම පැසසිය යුතු කරුණක්.

2003 වර්ෂයේ ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් දුම්වැටි පාලනය සඳහා ප්‍රඥප්තියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා රටවල් 168ක් අත්සන් තබා ඇති බව යි සඳහන් වන්නේ. එක්සත් ජාතීන්ගේ ඉතිහාසයේ වඩාත් පුළුල් ලෙස ම අනෙකුත් රටවල දායකත්වය ලැබුණු ප්‍රඥප්තිය මෙය යි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති වෛද්‍ය පාලිත අබේකෝන්; ''මේ ප්‍රඥප්තියට පෙර සිට ශ්‍රී ලංකාවේ සාරාංශගත ප්‍රඥප්තියක් මද්‍යසාර හා දුම්වැටි සම්බන්ධයෙන් පැවතුණා. කෙසේ වෙතත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රඥප්තියෙන් පසුව 2006 වර්ෂයේ අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ පනත ප්‍රකාශයට පත්වුණා. 2007 වසරේදී දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පිහිටවූයේ ද මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා යි."

මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ අදහසින් දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම හා සමීක්ෂණය කිරීමෙන් දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත ගැටලු අවම කිරීමටත් ඊට යොමු වන්නන් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් දුම්කොළ නිෂ්පාදනය සහ මද්‍යසාර නිෂ්පාදනය, අලෙවිය සහ පරිභෝජනය කරන්නන් අතරින් විශේෂයෙන් ළමයින් දුම්පානය හා මද්‍යසාර භාවිතයට යොමු වීම අධෛර්යමත් කිරීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීමට දුම්පානය හා මද්‍යසාර නිෂ්පාදනවලට ප්‍රවේශයට ඇති මාර්ග අවහිර කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමටත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම වැදගත්.

පනතට අනුව අවුරුදු 21ට අඩු පුද්ගලයන් මද්‍යසාර හෝ දුම්කොළ නිෂ්පාදනය කිරීම, අලෙවියට ඉදිරිපත් කිරීම හා යෙදවීම සහ ඒ පිළිබඳ ව අනුබලදීම නොකළ යුතු යි. මේ වරද සිදුකරන අයකු රුපියල් 4000කට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීම හෝ යන දෙකට ම යටත් කළ හැකි යි. මෙය දුම්කොළ භාවිතයට එරෙහි ව ගත් වැදගත් පියවරක්. එසේ ම දුම්කොළ නිෂ්පාදන ඇතුළත් සෑම පැකට්ටුවක ම සෞඛ්‍යයට හානිකර බවට අනතුරු ඇඟවීම සහ නිෂ්පාදනවල අඩංගු තාර සහ නිකොටින් ප්‍රමාණය පිළිබඳ සඳහන් කළ යුතු යි. එම ලේබලය පැකට්ටුවේ ප්‍රමාණය අනුව කියවිය හැකි අයුරින් පැහැදිලි ව පෙනෙන සේ දැක්වීම අවශ්‍ය වෙනවා. ඒ විධිවිධාන කඩ කරන කවරකු හෝ රුපියල් 2000 ඉක්මවන දඩයකට හෝ වසරකට නොවැඩි සිරදඬුවමකට හෝ දඩය හා සිර දඬුවම යන දෙකට ම හෝ යටත්විය යුතු බව එම පනතේ සඳහන් වෙනවා.

මීට අමතර ව පුද්ගලයන් 30 දෙනකුට වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවෝචිත පරිදි කොටු කරන ලද ස්ථානයක හෝ ප්‍රදේශයක හෝ දුම්පානය කළ නොහැකි බව ද පනතේ සඳහන්. එම විධිවිධාන කඩ කළ අයකුට රුපියල් 50,000ක දඩයකට සහ අවුරුද්දකට වැඩි සිරදඬුවමකට යන දෙකට ම හෝ මුහුණදීමට සිදුවෙනවා. දුම්කොළ භාවිතය මඟින් රටට අවශ්‍ය ශ්‍රම සම්පත් අහිමිවනවා පමණක් නොව රටේ සංවර්ධනය විශාල පසුබෑමකට ලක්වෙනවා. ඊට හේතුව දුම්කොළ භාවිතයෙන් හෘදයාබාධ, මුඛ පිළිකා, ශ්වසන ආබාධවලට ගොදුරුවීම නිසා පුද්ගලයකු වැඩකරන කාලය, කාර්යක්ෂමතාව පහත බසින අතර ජීවිත හානි වීමෙන් ශ්‍රමබලකාය රටට අහිමිවීම යි. දුම්කොළ සහ මද්‍යසාර භාවිතය අවම කිරීමෙන් දිළිඳුකම තුරණ්වී තිරසර සංවර්ධන ඉලක්ක කරා පහසුවෙන් ළඟාවිය හැකි බව ලෝක සෞඛ්‍ය සංවිධානය අනාවරණය කරනවා. දුම්කොළ සහ මද්‍යසාර හේතුවෙන් රටට දරන්නට සිදුවන පිරිවැය දුම්කොළ සහ මද්‍යසාර තුරන් කිරීම මඟින් රටේ සංවර්ධනයට යොදාගත හැකි බවයි මෙයින් අවධාරණය කරන්නේ.

මේ පිළිබඳ ව අදහස් දක්වන බෝනොවන රෝග ඒකකයේ අධ්‍යක්ෂ තිලක් සිරිවර්ධන; ''ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ බෝනොවන රෝග වළක්වාලීම පිළිබඳ දේශපාලන ප්‍රකාශයේ සඳහන් පරිදි රජය විසින් ක්‍රියාත්මක දුම්වැටි සහ මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සහ වැළැක්වීමේ වැඩපිළිවෙළට සිවිල් සංවිධාන, ප්‍රජාමූල සංවිධාන සහ ස්වේච්ඡා සංවිධාන විසින් පූර්ණ සහාය සහ අනුග්‍රහය ලබාදීමට කටයුතු කළ යුතු යි. වර්තමාන ශ්‍රී ලංකාවේ සිදු වන බෝනොවන රෝග සඳහා රජයට සමස්ත සෞඛ්‍ය වියදමෙන් 90%ක් වැය කිරීමටත් සිදු වෙනවා. මින් වැඩි සංඛ්‍යාවක් සිදු වන්නේ දුම්වැටි සහ මද්‍යසාර භාවිතය නිස යි. වර්තමානයේ බෝනොවන රෝග සමස්ත ලෝකයට ම දැනෙන ගැටලුවක් වී ඇති බැවින් ලෝකයේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන බෝනොවන රෝග වැළැක්වීම සඳහා දස අවුරුදු සැලැස්මක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 'බෝ නොවන රෝග වළක්වාලීම පිළිබඳ දේශපාලන ප්‍රකාශනය' නමින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා ශ්‍රී ලංකාව අත්සන් තබා අවසන්."

රජය විසින් 2025 වන විට ශ්‍රී ලංකාවේ දුම්වැටි භාවිතය මේ වසරට සාපේක්ෂ ව අඩු කිරීමේ ඉලක්ක සහිත ව අවශ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රජා ක්‍රියාකාරකම් සැලසුම් කළ ද සිවිල් සමාජයේ ද සහාය ලබාගෙන දීර්ඝකාලීන මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බව යි සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ පාලිත කරුණාසෝම සඳහන් කළේ. කෙසේ වෙතත් මද්‍යසාර හා දුම්පානය කරන්නන්ට එරෙහි ව සටන් කිරීම වෙනුවට කළ යුත්තේ ඒවායෙහි අනතුරුදායක බව දැනුම් දීම මෙන් ම මද්‍යසාර හා දුම්පානය කිරීමට උත්සාහ කිරීම නවතා දැමීම යි. එනම් ඇබ්බැහි වීම සමඟ සටන් කිරීමට වඩා එය වැළැක්වීම පහසු කාර්යයක්. මේ අනුව දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත නැවත ශක්තිමත් කිරීමට පියවර ගැනීම ඒ සඳහා විශේෂ දායකත්වයක් දෙනු ඇති.

කොළොම්තොට නැත මහලු වී

ප්‍රියන්ජන් සුරේෂ් ද සිල්වා

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවා මේ වසරට වසර 40ක් සපිරෙනවා. එතෙක් වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය හා වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව යන ආයතන තුනක් මගින් මෙහෙයවන ලද කොළඹ වරාය 1979දී අධිකාරියක් බවට පත් කෙරුණේ වඩාත් කාර්යක්ෂම සේවාවක් පවත්වාගෙන යෑමේ අරමුණින්. කිසියම් රටක වරායක් යනු එහි හදවත බඳු යි. කාර්මික විප්ලවයෙන් පසු ලොව සියලු ම රටවල් ජාත්‍යන්තර වෙළෙඳ රැල්ලට හසු වූ හෙයින් ආර්ථික දේහයේ පැවැත්මට හා සංවර්ධනයට රටක වරායකින් සිදුවන්නේ අනල්ප මෙහෙයක්.

දකුණු ආසියාවේ හොඳම වරායවලින් එකක් වන්නේ කොළඹ වරාය යි. උතුරු අක්ෂාංශක 6-57 ත් නැගෙනහිර දේශාංශක 79-51ත් අතර භූගෝලීය පිහිටීමක ඇති කොළඹ වරාය බටහිර හා නැගෙනහිර යා කෙරෙන නැව් ගමනාගමන මාර්ග යක කේන්ද්‍රගත ව පිහිටා තිබීම නිසා අතීතයේ පටන් ම අරාබි, ග්‍රීක, රෝම හා පර්සියානු නාවිකයන් අතර ප්‍රචලිතව පැවතුණා. එදා පෙරදිගට මහත් ධන සම්භාරයක් උරුම කර දුන් සේද පිළි රැගත් චීන යාත්‍රාවන්ගේ හා මධ්‍යධරණී මුහුදේ සැරිසැරූ වෙළෙඳ නෞකාවන්ගේ ඉන්දියානු සයුරේ හුවමාරු මධ්‍යස්ථානය වූයේ ශ්‍රී ලංකාව යි. අලි ඇතුන්, මොණරු, ඇත්දළ, මුතුමැණික් හා කුළුබඩු හුවමාරුව එහිදී සිදු කෙරුණා. එහෙත් බටහිර වෙළෙඳ නාවිකයන් කොළඹ වරාය හඳුනාගත්තේ 1505 පෘතුගීසීන් මෙරටට පැමිණීමෙන් පසුව යි. පෘතුගීසීන් කොළඹ වරාය වාණිජ වරායක් ලෙස භාවිත කළ ද ඔවුන්ගෙන් පසු මෙරට පාලනය කළ ලන්දේසි යුගයේ හා බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාලය තෙක් මෙරට ප්‍රධාන වරාය ලෙස භාවිත වූයේ ගාලු වරාය යි. 1807 වසරේ ජේ. කෝඩ්නර් විසින් තබන ලද සටහනකට අනුව කොළඹ වරාය පරිපූර්ණ වරායක් ලෙස හැඳින්වීමට තරම් සුදුසු තත්ත්වයක් නොතිබී බැව් සඳහන් වෙනවා. කුඩා යාත්‍රා කිහිපයක් පමණක් නවතා තැබීමට පහසුකම් තිබූ එහි ආරක්ෂිත ලෙස යාත්‍රා නවතා තැබිය හැකි වූයේ දෙසැම්බරයේ සිට අප්‍රේල් දක්වා පමණක් බැව් එහි සඳහන්.

1869 වසරේ සූවස් ඇල විවෘත වීමත් සමඟ එම මාර්ගය ඔස්සේ ඈත පෙරදිගට යාත්‍රා කළ නෞකා කෙළින් ම ළඟා වූයේ ගාල්ල වරායට. එම කෙටි මඟ ඔස්සේ ලන්ඩනයේ සිට සති තුනකින් ගාල්ලට ළඟා වීමට හැකි වූ හෙයින් ගල් අඟුරු ලබා ගැනීමට හා වෙළහෙළඳාම් කටයුතු සඳහාත් වඩාත් ප්‍රචලිත වූයේ ගාලු වරාය යි. එහෙත් ගල්පර පිහිටීමත් නිරිත දිග මෝසම් සමයේ දැඩි සුළඟත් නිසා ගාල්ල අනාරක්ෂිත වරායක් වුණා. පී. එන්. ඕ නමැති නැව් සමාගම සතු 'මලබාර්' නමැති නෞකාව ගාලු වරායේදී විනාශ වීමෙන් පසු බොහෝ නැව් එම වරායට පිවිසීමට මැලිකමක් දැක්වූවා. එහෙයින් ගාලු වරාය සංවර්ධනය කිරීම හෝ වෙනත් වරායක් සැලසුම් කිරීම කඩිනමින් සිදුවිය යුත්තක් වුණා.

අරාබීන්ගේ හා පෘතුගීසින්ගේ ප්‍රධාන නැව් තොටක් වුව ද කොළඹ වරායේ වෙරළාසන්න තීරය අනතුරුදායක ප්‍රදේශයක් වුණා. කොළඹ වරායට විශාල නෞකාවලට පැමිණිය නොහැකි අයුරින් විශාල වැලි කඳු ගහණ ව පැවැති අතර එය සූවස් හා ඈත පෙරදිග මාර්ගයෙන් සැතපුම් තිහක් පමණ ඈතින් පිහිටා තිබුණා. එවැනි පසුබිමක් යටතේ වුව ද කොළඹ වරායේ භාණ්ඩ හුවමාරුව සිදු කෙරුණා. 1830දී වෙළෙඳාම පිණිස එහි පැමිණි නැව් සංඛ්‍යාව 130ක් වූ අතර ආනයනය කළ භාණ්ඩ ප්‍රමාණය ටොන් විසි දහසක් පමණ වුණා.

එවක අගනගරය මෙන් ම දේශපාලනික නගරය ද වූයේ කොළඹ. ප්‍රධාන වෙළෙඳ වැවිලි දිස්ත්‍රික්ක හා

බැඳුණු මං මාවත් හා දුම්රිය සේවා සියල්ල කොළඹ හා කේන්ද්‍රගත වී තිබුණා. එහෙයින් කොළඹ වරාය නවීකරණය කිරීමේ වැදගත්කම එවක සිටි ඉංග්‍රීසි පාලකයන්ට වැටහුණ ද ප්‍රතිසංස්කරණ පිරිවැය අතින් ගාලු වරායට වඩා විශාල මුදලක් වැය වන හෙයින් ඔවුන්ගේ නිගමනය වූයේ ගාලු වරාය ප්‍රතිසංස්කරණය කිරීම වැදගත් බව යි. මෙහිදී වැවිලිකරුවන්ගේ සංගමය හා වෙළෙඳ මණ්ඩලය එම මතයට තරයේ විරුද්ධ වුණා. ඔවුනට අවශ්‍ය වූයේ කොළඹ වරාය නවීකරණය කොට ප්‍රධාන වරායක් ලෙස එය භාවිතයට ගැනීම යි.

කෙසේ වෙතත් ඉංග්‍රීසි රජය ඔවුන්ගේ මතයට එකඟ වෙමින් කොළඹ වරාය පුළුල් කිරීමට පියවර ගත්තා. ක්‍රමයෙන් එය ලොව පුරා ප්‍රචලිත වූ අතර ඈත පෙරදිගට ගමන් ගන්නා නෞකා කොළඹට පැමිණීම සිදු වුණා. සූවස් ඇල විවෘත කිරීමෙන් පසු මෙරටට ළඟා වූ පළමු නෞකාව 'විලියම් මිලර්' නමැති නෞකාව යි. ඒ 1870 පෙබරවාරි 10 වැනි දින

නිරිතදිග හා ඊසානදිග මෝසම් සුළඟින් ගාලු හා ත්‍රිකුණාමල වරායනට තරම් බලපෑමක් කොළඹ වරායට ඇති වූයේ නැහැ. ශ්‍රීමත් ජෝන් කුඩිගේ වාර්තාවක් අනුව එය තවදුරටත් සංවර්ධනය කළ යුතු බවට ශ්‍රීමත් හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරවරයා තීරණය කළා. ඒ අනුව කොළඹ ගල්බොක්කේ සිට විහිදෙන දියකඩනයක් ඉදිකිරීම සඳහා වන යෝජනාවක් ඔහු 1871 දී ව්‍යවස්ථාදායක මණ්ත්‍රණ සභාවට ඉදිරිපත් කොට සම්මත කර ගත්තා. එම කාර්යය ක්‍රියාවට නැංවූයේ ඔහුට පසුව පැමිණි ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා විසිනු යි. 1875දී නිරිතදිග දියකඩනය සඳහා එවක වේල්ස්හි කුමාරයා වූ 7 වැනි එඩ්වඩ් රජතුමා විසින් මුල්ගල තැබුවා. ''මා එංගලන්තයෙන් පිටවීමට පෙර යටත් විජිත කාර්යාලයේ පැවැති සාකච්ඡාවකදී විමසුමට ලක් වූ ප්‍රධාන මාතෘකාවක් වූයේ ලංකාවේ වරායන්හි පහසුකම් වැඩිදියුණු කිරීම

සියවසකට අධික කාලයක් පුරා කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු පෞද්ගලික සමාගම් විස්සකට අධික ප්‍රමාණයක් යටතට පත්ව තිබෙනවා. එම කාලයේ වරාය සේවකයන් දැඩි දුෂ්කරතාවනට මුහුණ දුන් බැව් පැවසෙනවා. එහෙයින් දිවංගත අගමැති එස්. ඩබ්ලියු. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා වරායේ නැව් බඩු මෙහෙයුම ජනසතු කිරීමට පියවර ගත්තා.

පිළිබඳව යි. සුළු මුදලකින් ගාලු වරාය අනතුරු රහිත වරායක් බවට පත් කරනවාද? නැතිනම් අධික වියදමක් දරා කොළඹ වරාය ලංකාවේ ප්‍රධාන වරාය බවට පත්කරනවාද යන පැනය අපට තිබුණා. අගමැතිවරයා ඇතුළු ඇමැති මණ්ඩලයේ අදහස වූයේ අවම මුදලකින් ගාලු වරාය සංවර්ධනය කිරීම යි. ඉඩ පහසුකම් සහිත අනතුරු රහිත නවීන වරායක් ඉදි කිරීමෙන් එහි පැමිණිය හැකි නැව් සංඛ්‍යාව පිළිබඳ ව ඔවුන්ගේ අවධානය යොමු වූයේ නැහැ. එහෙත් ගාලු වරායේ අනතුරුදායක තත්ත්වය මා අත්විත්ද. එංගලන්තයේ සිට ගාල්ලට පැමිණ ගොඩබසින්නට යාමේදී මා දියේ නොගිලී බේරුණේ අනූනවයෙන්. මගේ භාණ්ඩවලින් කොටසක් විනාශ වුණා යැ''යි දියකඩනයට මුල් ගල තැබූ අවස්ථාවේ විශේෂ ප්‍රකාශයක් කළ ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා ප්‍රකාශ කළා.

1884 වසරේ අගභාගයේ අඩි හාරදහස් දෙසිය දහයක් දිගැති නිරිතදිග දියකඩනයේ ඉදිකිරීම් අවසන් වුණා. ඒ සඳහා වැය වූ සමස්ත වැය රන්පවුම් හත් ලක්ෂයක්. ක්‍රමයෙන් නැව් විශාල ප්‍රමාණයක් කොළඹ වරායේ නවාතැන් පැතුවා. එහෙයින් තව දුරටත් එය පුළුල් කළ යුතු වුණා. ඒ අනුව 1893 ඉදිරිපත් කෙරුණු සැලසුම් අනුව අඩි 800ක හා 700ක මුවදෙර යුගළක් සහිතව අඩි 1100ක් දිග ඊසානදිග දියකඩනය ද අඩි 2470ක් දිග වයඹදිග දියකඩනය ද නිම කරනු ලැබුවා. එමඟින් ආවරණය කෙරුණු ජලාශ්‍රිත ප්‍රදේශය අක්කර හයසිය හතළිස් තුනක්. කොළඹ වරාය පූර්ණ ආරක්ෂිත වරායක් වූයේ 1906දී ඊසානදිග දියකඩනය හා 1912දී නිරිතදිග දියකඩනය තවත් දිගු කිරීමෙන් පසුව යි. 1882 සිට කොළඹ වරායේ පාලනය පැවතියේ 'හාබර් බෝඩ්' නමැති පරිපාලන මණ්ඩලයෙන්. 1913 පසු එය කොළඹ වරාය කොමිෂන් සභාවට පැවරුණා. 1950 පසු වරායේ පාලන කටයුතු පැවරුණේ 'කොළඹ පරිපාලන පනත' නම් ආඥා පනත යටතට. 1950 දී වරායේ සංවර්ධන කටයුතු ප්‍රංශ සමාගමකට පැවරුණු අතර ඔවුන් යටතේ රැජින පාලම හා ඩෙල්ෆ්ට් තටාකය ඉදිකෙරුණා. එම කටයුතු සඳහා වැය කෙරුණු මුදල රුපියල් 56342270ක්. සියවසකට අධික කාලයක් පුරා කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු පෞද්ගලික සමාගම් විස්සකට අධික ප්‍රමාණයක් යටතට පත්ව තිබෙනවා. එම කාලයේ වරාය සේවකයන් දැඩි දුෂ්කරතාවනට මුහුණ දුන් බැව් පැවසෙනවා. එහෙයින් දිවංගත අගමැති එස්. ඩබ්ලියු. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා වරායේ නැව් බඩු මෙහෙයුම ජනසතු කිරීමට පියවර ගත්තා. ඒ 1958 අගෝස්තු 1වැනි දින ඩෙල්ෆ්ට් තටාකයේ නැංගුරම් ලා තිබූ ස්ටාර්ලයින් එන්ටර්ප්‍රයිස් නම් නෞකාවේ සිට යි. එතැන් සිට 1979 වන තුරු නැව්බඩු මෙහෙයවීමේ කටයුතු භාර වූයේ වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය, වරාය කොමිෂන් සභාව හා වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවට යි. ආයතන තුනක් මඟින් මෙහෙවීම් කටයුතු සිදු කිරීමේදී පැන නැඟුණු දුෂ්කරතා අවම කර ගැනීම සඳහා 1979දී වරාය අධිකාරිය බිහි කෙරුණා. මේ වන විට එය වසර 40ක් සපුරා තිබෙනවා.

නොබිඳෙන බිඳෙන බඳුන්

කාංචනා සිරිවර්ධන

විශ්වවිද්‍යාල, පාසල්, පර්යේෂණ ආයතන, ආරෝග්‍යශාලා ඇතුළු රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා අවශ්‍ය වන විද්‍යාත්මක වීදුරු භාණ්ඩ (Scientific Glassware) ආනයනය කිරීමට ශ්‍රී ලංකාව වාර්ෂික ව වැය කරන්නේ විශාල මුදලක්. මේ වීදුරු භාණ්ඩ ඉක්මනින් බිඳෙනසුලු බැවින් නැවත නැවත ආනයනය කිරීමට ද සිදු වෙනවා.

විද්‍යාගාර තුළ භාවිත වන විද්‍යාත්මක වීදුරු උපකරණ තැනීම සඳහා යොදා ගන්නේ අධික උෂ්ණත්වයට ඔරොත්තු දෙන ඒ වගේම ක්ෂණික උෂ්ණත්ව වෙනස්වීම්වලදී නොබිඳෙන, ඉරි නොතලන විශේෂිත වීදුරු වර්ගයක්.

විද්‍යාත්මක වීදුරු උපකරණ අලුතින් ම නිපදවීමත් කැඩුණු, මිල අධික විද්‍යාත්මක වීදුරු උපකරණ නැවත භාවිතයට ගත හැකි වන සේ සැකසීමත් කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය මඟින් සිදු කෙරෙන්නේ පිටරටට ගලා යන විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කරමින්. ඇතැම් පර්යේෂණ සඳහා අවශ්‍ය වන විශේෂිත විද්‍යාත්මක වීදුරු උපකරණ අවශ්‍යතාව අනුව සකසා දීම ද මෙහිදී සිදු කෙරෙනවා.

විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක රසායන විද්‍යා අංශයේ මහාචාර්ය චන්දිමා ජයසූරිය ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වූයේ මෙලෙසින්; ''විද්‍යාගාර තුළ භාවිත වන විද්‍යාත්මක වීදුරු උපකරණ තැනීම සඳහා යොදා ගන්නේ අධික උෂ්ණත්වයට ඔරොත්තු දෙන ඒ වගේ ම ක්ෂණික උෂ්ණත්ව වෙනස්වීම්වලදී නොබිඳෙන, ඉරි නොතලන විශේෂිත වීදුරු වර්ගයක්. මේ වීදුරු අධික උෂ්ණත්වයකට රත්කර ද්‍රව බවට පත් කිරීමෙන් අවශ්‍ය හැඩය සකස් කරගන්නවා. ඉන්පසු උෂ්ණත්වය ඉතාමත් සෙමින් අඩු කරමින් කාමර උෂ්ණත්වයට යි පත් කරගන්නේ. මේ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ පුහුණු ශිල්පීන් අප මධ්‍යස්ථානය සතු යි. ඇතැම්

පර්යේෂකයන්ට අවශ්‍ය වෙනවා තමන් විසින් නිර්මාණය කරන මෝස්තරය අනුව විශේෂිත වීදුරු උපකරණ සාදවාගැනීමට. මේ මධ්‍යස්ථානයේදී එවැනි විශේෂිත අවශ්‍යතා අනුව වීදුරු උපකරණ සැකසීම ද සිදු වෙනවා. විද්‍යාගාරවල පරිහරණයේදී කැඩීයන මිල අධික වීදුරු භාණ්ඩ පිළිසකර කිරීම කෙටි කාලයක් ඇතුළත සිදු කළ හැකි අතර ඒ සඳහා වැය වන්නේ ද සුළු මුදලක්. මේ සම්බන්ධයෙන් දැනුවත් පිරිස ඒ සේවාව අපෙන් ලබාගන්නවා. මේ පිළිබඳ පුහුණු පාඨමාලා ද අප විශ්වවිද්‍යාලය මඟින් පවත්වන අතර ඉදිරියේදී පුහුණුව සඳහා බඳවා ගන්නා පිරිස වැඩි කිරීමටත් සැලසුම් කර තිබෙනවා.''

විද්‍යාගාරවල පරිහරණයේදී කැඩීයන මිල අධික වීදුරු භාණ්ඩ පිළිසකර කිරීම කෙටි කාලයක් ඇතුළත සිදු කළ හැකි අතර ඒ සඳහා වැය වන්නේ ද සුළු මුදලක්. මේ සම්බන්ධයෙන් දැනුවත් පිරිස ඒ සේවාව අපෙන් ලබාගන්නවා. මේ පිළිබඳ පුහුණු පාඨමාලා ද අප විශ්වවිද්‍යාලය මඟින් පවත්වන අතර ඉදිරියේදී පුහුණුව සඳහා බඳවා ගන්නා පිරිස වැඩි කිරීමටත් සැලසුම් කර තිබෙනවා.

විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රතිපාදන මඟින් විද්‍යාත්මක වීදුරු නිපදවීම සහ පිළිසකර කිරීමේ මූලික පහසුකම් රසායන විද්‍යා අධ්‍යයන අංශය තුළ ස්ථාපිත කෙරුණේ 1990 වසරේදී. ඒ, එවකට රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කළ ආචාර්ය කීර්ති වික්‍රමසිංහගේ සංකල්පයකට අනුව මහාචාර්ය එම්. එම්. ජේ. මාරසිංහ උපකුලපතිවරයාගේ පූර්ණ සහයෝග යෙන්. ඒ ආකාරයෙන් රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ආරම්භ වූ මේ පහසුකම අද වන විට වඩාත් දියුණු වී ඇත්තේ වැදගත් පියවර ගණනාවක් ඔස්සේ.

කැලණිය විශ්වවිද්‍යාලය හා බ්‍රිතාන්‍යයේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලය අතර ස්ථාපිත වූ ජීව රසායන විද්‍යා සහයෝගිතා වැඩසටහන යටතේ යි මේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය ඇරඹෙන්නේ. මෙහිදී බ්‍රිතාන්‍ය කවුන්සිලය මඟින් සැපයූ මුදල් ප්‍රතිපාදන මත රසායන විද්‍යා අධ්‍යයන අංශයේ කාර්මික නිලධාරී එම්. තිලකරත්න යොමු කළේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ සයමස් පුහුණුවකට. ඒ අනුව විද්‍යාත්මක වීදුරු හැසිරවීම පිළිබඳ පුහුණුවක් ලැබූ පළමු ලාංකිකයා ඔහු යි.

1999 වසරේදී විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ හඳුන්වා දුන් ආසියානු සංවර්ධන බැංකු මුදල් ප්‍රතිපාදන ද කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය අද පවතින තත්ත්වයට ගෙන ඒමට අති දැවැන්ත පිටුවහලක් වී තිබෙනවා.

මේ මධ්‍යස්ථානය ජාතික මට්ටමේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයක් බවට පත් කර දකුණු ආසියානු කලාපය තුළ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණය පිළිබඳ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් බවටත් පත්කිරීමේ අරමුණින් කටයුතු කිරීම මෙහි කැපී පෙනෙන කාරණයක්.

ඩොනල්ඩ් සේනාධීර

සැටවස් සැමරූ විදුලකර

කැලණිය විශ්වවිද්‍යාලයට 2019 ජූනි මස 17 වැනි දිනට වසර 60 සැපිරුණා. මේ ලිපිය ඒ නිමිත්තෙන්.

කැලණි සරසවි ඉතිහාසයට ඇත්තේ සුවිශේෂී ගමන් මඟක්. ක්‍රි.ව. 1506 දී සිදු වූ පෘතුගීසි ආක්‍රමණයෙන් පසු එතෙක් පැවති සාමාජික, ආගමික, දේශපාලනික හා සංස්කෘතිකමය සියලු ක්ෂේත්‍ර අඩපණව, අරාජිකව, උදාසීනව පැවැති යුගයක එම බිඳ වැටුණු සියලු ක්ෂේත්‍රවල නව පුනර්ජීවනයක් උදා කරලීමේ උදාර මෙහෙවර
තම දෙවුර මතට ගන්නට ක්‍රියා කළේ ජාතියෙන් දේශයෙන් පිනට පහළ වූ වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් විසින්. උන්වහන්සේ මේ සියලු ක්ෂේත්‍ර නඟා සිටුවූවා පමණක් නොව ලංකාවේ භාෂා ශාස්ත්‍රාදියෙහි ඇති කළ දියුණුව වඩාත් කැපී පෙනෙනවා. ඒ සඳහා ශක්තිමත් ගිහි පැවිදි පඬිවරු විශාල පිරිසක් බිහි කිරීම මෙවැනි අග්‍රගන්‍ය විශ්වවිද්‍යාලයක් බිහි කිරීමේ මූලික අඩිතාලම යි.

එම පරපුරේ උරුමය ලබමින් මෑත කාලයේ බිහි වුණු සංඝ පීතාවරයාණන් වහන්සේ වන්නේ පණ්ඩිතාචාර්ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක ස්වාමීන් වහන්සේයි. උන්වහන්සේ ක්‍රි.ව. 1860 දී රත්මලාන පුරාණ විහාරයේ ප්‍රාචීන ශාස්ත්‍ර ශාලාවක් ආරම්භ කර ගිහි පැවිදි විශාල පිරිසකට ධර්ම ශාස්ත්‍රය ලබා දුන්නා. එහි ප්‍රතිඵලයක් ලෙස ජගත් කීර්තියට පත් පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන 1875 නොවැම්බර් 01 වැනි දින ආරම්භ වූයේ උන්වහන්සේ තැබූ පියවරෙහි නව පරිච්ඡේදයක් ලංකා ඉතිහාසයේ සනිටුහන් කරමින්. එම යුග මෙහෙවර ඉදිරියට පවත්වා ගෙන යාමට ගිහි පැවිදි භාණක පිරිසක් බිහි කරලන්නට පුරා වසර 160ක කාලය තුළ උන්වහන්සේ ගත් අප්‍රතිහත ධෛර්යය අතිශ්‍යයින්ම ප්‍රශංසනීය කාර්යයක්. සංඝරාජ හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍ය රත්නයක් විද්‍යාලංකාර පිරිවෙනෙහි දෙවැනි පරිවේනාධිපතීන් වහන්සේ වූයේත් ඒ ප්‍රශස්ත ගුරු භූමිකාව නිසා. ඒ සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්වාමින් වහන්සේයි. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක ස්වාමින් වහන්සේ අපවත්වීමෙන් 50 වැනි ගුණානුස්මරණ පුන්‍යෝත්සවයේදී ධර්මාලෝක විද්‍යාලයත් ගුරුකුල විද්‍යාලයත් විද්‍යාලංකාර පිරිවෙන් භූමියෙහිම ආරම්භ කිරීම සුවිශේෂී සිදුවීමක්. ඒ හා සමානව ලංකාවේ ප්‍රථමවරට සාහිත්‍යාචාර්ය සහ ත්‍රිපිටකාචාර්ය යන උපාධි පාඨමාලාව ප්‍රදානය කිරීම විද්‍යාලංකාර පිරිවෙන මඟින් සිදු කෙරුණා. ඒ, පණ්ඩිතාචාර්ය ලුණුපොකුණේ ධම්මානන්ද නායක ස්වාමීන් වහන්සේගේ සමයේදී.

1959 ජනවාරි 01 වැනි දින අහිනව විශ්වවිද්‍යාලයක් ලෙස නීතිගත වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පළමු කුලපති ස්වාමින් වහන්සේ වූයේ පණ්ඩිතාචාර්ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නායක හිමිපාණන්. විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය පිණිස සියලු අධ්‍යයන හා අනධ්‍යයන කටයුතු ඉටු කළ සාර්වභෞම පණ්ඩිත ආමවක්‍රවර්ති හික්කඩුවේ ප්‍රඥාරාම නායක ස්වාමින් වහන්සේත් එම කාර්යයන්ට නොමඳ සහයක් ලබා දුන් විනයාචාර්ය නාත්තාන්ඩියේ පඤ්ඤාකර නායක ස්වාමින් වහන්සේත් මේ 60 වැනි

සංවත්සරයේදී අනිවාර්යයෙන් ම සිහි කැඳවිය යුතු යි.

විද්‍යාලංකාර පිරිවෙන බටහිර ආකෘතියේ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම මඟින් රජය විසින් පරමාර්ථ දෙකක් ඉටු කර ගැනීමට අපේක්ෂා කළා. එහි මූලික අභිලාෂය වූයේ සිංහල භාෂාව පරිසමාප්ත අර්ථයෙන්ම රාජ්‍ය භාෂාව බවට පත් කිරීමට ක්‍රියාත්මක වීම යි. ප්‍රථමයෙන් ම ශිෂ්‍යයන් 363 දෙනකු විශ්වවිද්‍යාලයට බඳවාගත් අතර පිරිමි සිසුන් පමණක් එයට ඇතුළත් වුණා. 1972 වසරේ සිට 1978 දෙසැම්බර් 31 වැනිදා දක්වා ක්‍රියාත්මක වූ 1972 අංක 1 දරන පනත අවලංගු කරන තුරු විශ්වවිද්‍යාල පරිපාලන ව්‍යුහය පරිවර්තන ව්‍යුහයක් ලෙස යි පැවතියේ. එම කාල සීමාව නාමකරණය කරන ලද්දේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය ලෙසින්.

විශ්වවිද්‍යාලය ආරම්භ කළ මුල් කාලයෙහි එය පවත්වා ගෙන යනු ලැබුවේ පෑලියගොඩ විද්‍යාලංකාර භූමියේ හා ඊට යාබද ගුරු කුල විද්‍යාලයීය ගොඩනැගිලිවල වීම නිසා විශ්වවිද්‍යාලයේ භෞතික සංවර්ධනයට වූයේ බාධාවක්. එයට විසඳුමක් වශයෙන් 1960 - 1961 වර්ෂවලදී දළුගම 'මයිනර් කැම්ප්' නමැති අක්කර 21 කින් යුතු ඉඩමක් රජය විසින් අත්පත් කරගෙන රසායනාගාර සහිත විද්‍යා ගොඩනැගිල්ලක්, කලා ගොඩනැගිල්ලක්, පුස්තකාලයක්, ශිෂ්‍ය නිවාස ඇතුළු වෙනත් අවශ්‍ය ගොඩනැගිලි ඉදි කළා. ඉන් පසුව යි එම අභිනව භූමියෙහි විශ්වවිද්‍යාලය නිල වශයෙන් ආරම්භ වූයේ. ඒ අනුව 1965 - 1966 අධ්‍යයන වර්ෂය වන විට විද්‍යා හා ශිෂ්‍ය ගොඩනැගිලි ඉදි කර අවසන්ව තිබූ නිසා මධ්‍ය හා අවසාන වර්ෂයේ පන්ති නව භූමියට රැගෙන යාමට යි හැකි වුණේ. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් විශ්වවිද්‍යාල ව්‍යුහය පරිවර්තනයකට ලක්වීම මේ කාලසීමාව තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක්. ඒ අනුව මෙතෙක් 'ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය' ලෙස හැඳින් වූ විශ්වවිද්‍යාලය 1977 ජනවාරි 01 වැනි දින සිට කැලණිය විශ්වවිද්‍යාලය නමින් ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් වුණා. එතැන් සිට උපකුලපතිවරු 17 දෙනකු යටතේ පාලනය වූ කැලණිය විශ්වවිද්‍යාලයෙහි 60 වැනි සංවත්සරය සමරන මොහොතේ එම ධුරය හොබවන්නේ මහාචාර්ය ඩී.එම්. සේමසිංහ යි.

අභ්‍යන්තර සිසුන් දසදහසකට අධික ප්‍රමාණයක් සිටින විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමට විදේශීය සිසුන් දෙසීයකට වැඩි ප්‍රමාණයකට අවස්ථාව හිමි යි. එමෙන් ම බාහිර උපාධි අපේක්ෂකයන් දෙදහස ඉක්මවමින් හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා අපේක්ෂකයන් දෙදහස ඉක්මවමින් කැලණි සරසවියේ අධ්‍යයන කටයුතුවල නියැලී සිටිනවා.

කැලණිය විශ්වවිද්‍යාලය මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ශාස්ත්‍රීය හා භෞතිකමය සංවර්ධන කටයුතුවල ගුණාත්මක අගය අනුව පෙළ ගැහෙන්නේ තුන් වැනි ස්ථානයට. ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පළමු හරිත විශ්වවිද්‍යාලය බවට පත් වූයේ ද එය යි. මෙවැනි සුවිශේෂී අංග රැසකින් යුත් කැලණිය විශ්වවිද්‍යාලයේ නූතන භාෂා හා වෘත්තීයාභිමුඛ පාඨමාලා, විවිධ පර්යේෂණ ක්ෂේත්‍ර පදනම් කරගත් නවීන විෂයයන්ගෙන් යුත් නව අධ්‍යයන පාඨමාලා මේ වන විටත් ක්‍රියාත්මක යි. ඒ, විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන විද්‍යාර්ථීන්ගේ කුසලතා ඔප්නංවා රටේ සංවර්ධනයට දායක වන යහපත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ අරමුණින්. ඊට අමතරව ජාතික සංවර්ධනය වෙනුවෙන් වැදගත් නව සොයා ගැනීම් ගණනාවකට දායකත්වය සැපයීමට ද කැලණිය විශ්වවිද්‍යාලය සමත්ව ඇත්තේ එම පාඨමාලාවල ඵලදායිතාව විදහාපාමින්.

මෙහිදී අදහස් දැක් වූ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ඩී.එම්. සේමසිංහ; ''1959 වසරේදී විශ්වවිද්‍යාලයක් බවට පත් වුවත් එහි මුල් දිව යන්නේ 1875 වසර දක්වා ඈතට. නව දැනුම නිර්මාණය කිරීමටත් තිබෙන දැනුම සෙසු අය අතරේ බෙදා ගැනීමටත් උපරිම ලෙස කැපවීමට යි විශ්වවිද්‍යාලය කටයුතු කරන්නේ. ඉදිරියේ දී මේ අරමුණු තව තවත් වැඩි දියුණු කරමින් රටේ සංවර්ධනාත්මක කාර්යයන්හිදී දායකත්වය ලබාදීමට අප බලාපොරොත්තු වෙනවා. වර්තමානය වන විට විවිධ රැකියා ක්ෂේත්‍රවල අප විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් නියැලී සිටිනවා. ඔවුන්ව දෙස් විදෙස්හි ඉහළම පිළිගැනීමකට ලක් වී සිටීම සතුට දනවන කාරණයක්''

තුන්කොන් කතාබහ උණුසුම්

නිහාල් පීරිස්

අද මෙරිකාව සහ බ්‍රිතාන්‍යයත්, අනෙක් අතින් බටහිර විරෝධී රාජ්‍යයක් වන ඉරානයත් අතර උණුසුම් වෙමින් ඇති ආතතිය ජාත්‍යන්තර දේශපාලන කරළියේ වඩාත්ම අවධානයක් දිනාගත් කාරණාවක් බවට පත්ව තිබෙනවා. ටික කලෙක සිට වර්ධනය වෙමින් තිබූ මේ ගැටුම්කාරී තත්ත්වය ක්‍රමයෙන් වඩාත් උච්ඡ අවස්ථාවක් කරා ළඟා වෙමින් ඇති ආකාරයක් දකින්න පිළිවන්. පසුගිය දිනවල මෙයට අදල තීරණාත්මක සිදුවීමක් වූයේ බ්‍රිතාන්‍ය ධජය යටතේ ඕමාන බොක්ක ප්‍රදේශයේ යාත්‍රා කරමින් තිබූ තෙල් නැවක් ඉරාන හමුද විසින් සිය භාරයට ගනු ලැබීමයි. ස්ටෙනා ඉම්පෙරෝ නමින් හැඳින්වුණු මේ තෙල් නැව එහි සිටි විස්සකට ආසන්න නාවුකයන් පිරිස ද සමඟ ඉරානය යටතට පත්වීමත් සමඟ බටහිර බලවතුන් සහ ඉරානය අතර විශාල ආතතියක් උත්සන්න වීමට පටන් ගත්තා. මේ ලිපිය ලියන අවස්ථාව වනවිටත් ඉරානය මේ නැව හෝ නැවියන් හෝ නිදහස් කිරීමට කටයුතු කර තිබුණේ නැහැ. ඉරානය විසින් ස්ටෙනා ඉම්පෙරෝ නෞකාව මේ ආකාරයෙන් සිය භාරයට ගන්නා ලද්දේ එය ජාත්‍යන්තර නීති උල්ලංඝනය කළ බවක් පවසමින්. එහෙත් බ්‍රිතාන්‍යය මේ චෝදනා පිළිගත් බවක් පෙනුණේ නැහැ.

ඉරානය මේ නැව අල්ලා ගත්තේ බ්‍රිතාන්‍යයට එරෙහිව එකට එක කිරීමක් වශයෙන් බවයි නිරීක්ෂකයන්ගේ අදහස වුණේ. එයට හේතු වූයේ මේ සිද්ධියට සති කිහිපයකට කලින් බ්‍රිතාන්‍ය හමුද විසින් ඉරාන තෙල් නැවක් ද මේ ආකාරයෙන්ම අල්ලා ගැනීමේ මෙහෙයුමකට සම්බන්ධ වී තිබීමයි. ග්‍රේස් 1 යනුවෙන් හැඳින්වුණු මේ ඉරාන නැව ඒ වනවිට සිරියාවට තෙල් රැගෙන යමින් සිටි බවට බ්‍රිතාන්‍යය සැක මතු කර තිබුණා. තවත් බටහිර විරෝධී රාජ්‍යයක් ලෙස සැලකෙන සිරියාවට එරෙහිව මේ වනවිට යුරෝපා සංගමය විසින් විවිධ සම්බාධක පනවනු ලැබ ඇති අතර ඒ අනුව ඔවුන්ට මේ ආකාරයෙන් තෙල් සැපයීම තහනම්. කෙසේ වෙතත් ඉරානය බ්‍රිතාන්‍ය ධජය යටතේ ගමන් කරමින් තිබූ ස්ටෙනා ඉම්පෙරෝ තෙල් නැව ඉරානය තම යටතට ගත්තේ බ්‍රිතාන්‍යයේ ඉහත මෙහෙයුමට ප්‍රතිචාරයක් වශයෙන් බවයි මේ ගැන අවධානයෙන් පසුවන බොහෝ නිරීක්ෂකයන්ගේ අදහස. මේ සිදුවීමත් සමඟ ඉරානය සහ බටහිර කඳවුර අතර ආතතිය වඩාත් ඉහළ යාමට පටන් ගත් අතර ඇමෙරිකාව ද බ්‍රිතාන්‍යයේ සහායට ඉදිරිපත් වීමට සූදනම් බවක් පළ කළා.



තත්ත්වය මෙසේ තිබියදී පසුගිය 23 වැනි දින තවත් ආන්දෝලනාත්මක සිද්ධියක් ගැන ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කර තිබුණා. එයින් කියැවුණේ ඉරානය තුළ ඔත්තු බලමින් සිටි ඇමරිකානු සී.අයි.ඒ සංවිධානයට සම්බන්ධ පිරිසක් ඉරාන ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගනු ලැබ ඇති බවයි. ඔවුන් අතරින් කිහිප දෙනකුට මරණ දඬුවම නියම කර ඇති බව ද මේ පුවත් වාර්තා මඟින් අනාවරණය කර තිබුණා. ඇමරිකාව සහ ඉරානය අතර උත්සන්න වෙමින් ඇති ගැටුම්කාරී තත්ත්වය මේ සිද්ධිය නිසා තවත් වැඩි දියුණු වනු ඇති බවයි පෙනී ගියේ.

ඉරානය සහ ඇමරිකාව අතර දැන් ටික කලෙක සිටම පවතින්නේ උණුසුම් තත්ත්වයක් බව රහසක් නොවෙයි. එයට ආසන්නම හේතුව වූයේ ඉරානය සමඟ අත්සන් කර තිබූ න්‍යෂ්ටික ගිවිසුමකින් ඇමෙරිකාව ඉවත් කර ගැනීමට ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා පසුගිය වසරේ (2018) පියවර ගැනීමයි. 2015 වසරේ අත්සන් කරන ලද මේ ගිවිසුමෙහි එක් පාර්ශ්වයක් වූයේ ඉරානයයි. අනෙක් පාර්ශ්වය ලෙස ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, රුසියාව, චීනය අත්සන් කර තිබුණා. මෙවැනි ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය වූයේ ඒ වනවිට ඉරානය ඉදිරියට ගෙන යමින් සිටි න්‍යෂ්ටික වැඩසටහනක් සම්බන්ධයෙන් බටහිර කඳවුරට ගැටලු මතු වීම නිසායි. ඔවුන් කල්පනා කළේ මේ න්‍යෂ්ටික වැඩසටහන හරහා ඉරානය න්‍යෂ්ටික ආයුධ නිපදවීමට සැලසුම් කරන බව යි. මේ හේතුව මත ඔවුන් ඉරානයට එරෙහිව විවිධ සම්බාධක පැනවීමට කටයුතු කළ අතර ඒ හරහා ඉරානය මත පීඩනයක් ඇති කිරීමට පියවර ගත්තා. මේ සම්බාධක නිසා ඉරාන ආර්ථිකයට ලොකු බලපෑමක් ඇති වුණා. ඒ නිසා සම්බාධක ලිහිල් කර ගැනීමට ඉරානයට ද අවශ්‍ය වූ අතර 2015 ගිවිසුම අත්සන් කෙරුණේ ඒ අනුවයි. මේ ගිවිසුම අනුව ඉරානය ඔවුන්ගේ න්‍යෂ්ටික කටයුතුවල යම් යම් සීමා ඇති කිරීමට එකඟ වුණා. බටහිර පාර්ශ්වය ද සම්බාධක ලිහිල් කිරීමට කැමැත්ත පළ කළා.

එහෙත් 2017 වසරේ ඩොනල්ඩ් ට්‍රම්ප් ඇමරිකාවේ ජනාධිපති ධුරයට පත් වීමෙන් පසු තත්ත්වය තරමක් වෙනස් වීමට පටන් ගත්තා. ඔහුගේ අදහස වුණේ ඉහත කී ගිවිසුම ලිහිල් වැඩි බවයි. ඒ නිසා කවද හෝ දිනෙක ඉරානය න්‍යෂ්ටික අවි නිපදවීමේ

ඉරානය සහ ඇමරිකාව අතර දැන් ටික කලෙක සිටම පවතින්නේ උණුසුම් තත්ත්වයක් බව රහසක් නොවෙයි. එයට ආසන්නම හේතුව වූයේ ඉරානය සමඟ අත්සන් කර තිබූ න්‍යෂ්ටික ගිවිසුමකින් ඇමෙරිකාව ඉවත් කර ගැනීමට ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා පසුගිය වසරේ (2018) පියවර ගැනීමයි. 2015 වසරේ අත්සන් කරන ලද මේ ගිවිසුමෙහි එක් පාර්ශ්වයක් වූයේ ඉරානයයි.

හැකියාවක් ඇති බව ඔහුගේ අදහස බැව් පෙනුණා. එමෙන්ම මැද පෙරදිග කලාපයේ සිටි සෞදි අරාබිය, ඊශ්‍රායලය වැනි ඇමෙරිකාවේ මිත්‍ර පාර්ශ්වවලට එරෙහිව කටයුතු කරන ඇතැම් ත්‍රස්තවාදී සංවිධානවලට ඉරානය උදව් කරන බවට ද ඇමෙරිකාව පැත්තෙන් චෝදනා එල්ල වෙමින් තිබුණා. මේ තත්ත්වය මත ට්‍රම්ප් පැවසුවේ ඇමරිකාව ඉහත ගිවිසුමෙන් ඉවත් කරගැනීමට තමන් පියවර ගන්නා බවයි. මේ ගිවිසුමට වඩා ශක්තිමත් ගිවිසුමක් අවශ්‍ය බවද ඔහු කියා සිටියා. මේ අනුව ඇමෙරිකාව පසුගිය වසරේ මේ ගිවිසුමෙන් ඉවත් වූ අතර එයින් පසු නැවතත් ඉරානයට එරෙහිව දැඩි සම්බාධක පැනවීමට ඔවුන් කටයුතු කළා. මේ නිසා දැන් නැවතත් ඉරාන ආර්ථිකයට විශාල බලපෑමක් ඇති වීමේ තත්ත්වයක් මතු වී තිබෙනවා. ඒ නිසා ඔවුන් ද තරමක් දැඩි ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට සූදනම් වන බවක් පෙනෙන්නට තිබුණා. එහිදී ඉරානය පැවසුවේ ගිවිසුම යටතේ කලින් සීමා කර තිබූ ඇතැම් න්‍යෂ්ටික කටයුතු නැවත ඇරඹීමට තමුන් ද පියවර ගන්නා බවයි. මේ නිසා ඉරානයත්, ඇමරිකාවත් අතර ගැටුම්කාරී තත්ත්වය තවදුරටත් උත්සන්න වීමට පටන් ගත් අතර යුදමය ගැටුමක් පවා ඇති විය හැකි ද යන සැකය ඇතැම් පාර්ශ්ව මතු කරමින් සිටිනවා.

දැන් ඇති වී තිබෙන තෙල් නැව් පිළිබඳ ප්‍රශ්නය ද මේ සිදුවීම් දමයේම කොටසක් ලෙස සැලකිය හැකියි. සති කිහිපයකට පෙර බ්‍රිතාන්‍ය හමුදාවල සහභාගිත්වයෙන් ඉරානයේ ග්‍රේස් 1 නැව අල්ලා ගැනීම ඇමෙරිකාවේ වුවමනාව මත සිදුවන්නට ඇති බව සමහර නිරීක්ෂකයන්ගේ අදහසයි. (ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය යනු ඉතා සමීප මිතුරන් දෙදෙනකු බව ද අමුතුවෙන් කිව යුතු කාරණයක් නොවෙයි.) ඉරානය තවදුරටත් අපහසුතාවට පත් කිරීම එහි අරමුණ වන්නට ඇති බවයි ඔවුන් පෙන්වා දෙන්නේ. කෙසේ වෙතත් ඉරානය ද එයට ප්‍රතිචාර දක්වමින් බ්‍රිතාන්‍ය නැව සිය භාරයට ගැනීමත් සමඟ මේ කලාපයේ නැව් ගමනාගමනය සම්බන්ධයෙන් ද අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙමින් තිබෙනවා. ඕමාන බොක්ක ප්‍රදේශයේ ඇති හෝමුස් සමුද්‍ර සන්ධිය ආසන්න කලාපයේයි මේ තත්ත්වය වර්ධනය වෙමින් තිබෙන්නේ. මෙය තෙල් ප්‍රවාහනයේදී තීරණාත්මක ලෙස බලපාන කලාපයක් ලෙසත් සැලකෙනවා. එහි ඇති වී තිබෙන මේ උණුසුම් තත්ත්වය නිසා තෙල් සැපයුම්වලට බාධා ඇති වීමෙන් ඉදිරියේදී තෙල් මිල ඉහළ යාමේ අනතුරක් ඇති විය හැකි බවටත් මේ වනවිට අනාවැකි පළවෙමින් තිබෙනවා.

තෙරේසා ළඟට බොරිස්

නිහාල් පීරිස්

තමා අගමැති ධුරයෙන් ඉල්ලා අස්වන බව බ්‍රිතාන්‍යයේ හිටපු අගමැතිනි තෙරේසා මේ පසු ගිය ජූනි මාසයේ නිවේදනය කිරීමත් සමඟ කා තුළත් කුතුහලය දැන වූ කාරණය වුණේ එරට ඊළඟ අගමැතිවරයා කවුරුන් වනු ඇත් ද යන්න යි. මාස එකහමාරකට ආසන්න කාලයක් තිස්සේ ඇදී ගිය ක්‍රියාවලියකින් අනතුරුව දැන් එරටට අලුත් අගමැතිවරයකු ලැබී තිබෙනවා. ඔහු කලක් තෙරේසා මේ ගේ කැබිනට් මණ්ඩලයේ විදේශ ලේකම්වරයකු ලෙස ද කටයුතු කළ බොරිස් ජොන්සන්. බොරිස් පසුගිය ජූලි 24 වැනි දින දෙවැනි එළිසබෙත් මහ රැජින හමු වී බ්‍රිතාන්‍යයේ නව අගමැතිවරයා ලෙස වැඩ භාරගත්තා. හිටපු අගමැතිනි තේරේසා මේ ද ඊට පෙර මහ රැජිණ මුණ ගැසී තමාගේ ඉල්ලා අස්වීම ගැන නිල වශයෙන් දැනුම් දුන්නා.

කෙසේ වෙතත් ඇය මුහුණ දුන් අර්බුදයට පසුබිම් වූ ගැටලු තවමත් විසඳී නොමැති අතර බොරිස්ට ද ඉදිරියේදී ඉතා අසීරු අභියෝග රැසකට මුහුණ දීමට සිදුවනු ඇති බව රහසක් නොවෙ යි. තෙරේසා මේ ධුරයෙන් විසි වී යාමට බලපෑ ප්‍රධානම කාරණය වූයේ බ්‍රෙක්සිට් (Brexit) හෙවත් බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයේ සාමාජිකත්වයෙන් ඉවත් වීමේ ක්‍රියාවලියට නිසි ආකාරයෙන් නායකත්වය දීමටත් එය කළමනාකරණය කර ගැනීමටත් ඇය අසමත් වීම යි. දැන් කව්රුත් බලා සිටින්නේ ඇයට පැනගත නොහැකි වූ මේ කඩුල්ල ජය ගැනීමට බොරිස් ජොන්සන් සමත් වනු ඇත් ද කියා යි.

තෙරේසා මේට තව වසර 3 කට කිට්ටු කාලයක් අගමැති ධුරයේ කටයුතු කිරීමට ඉතිරි ව තිබියදී ඇයට හදිසියේ එම ධුරයෙන් ඉල්ලා අස්වීමට සිදු වූයේ මන්ද යන්න ද මෙහිදී සිහිපත් කිරීම වැදගත්. බොරිස් ජොන්සන් හමුවේ ඇති අභියෝග තේරුම් ගත හැකි වන්නේ ද මෙතෙක් දිග හැරුණු එම සිදුවීම් දමය අවබෝධ කර ගැනීමෙන් පමණ යි. එහි වැදගත් ම අවස්ථාවක් වූයේ 2016 වසරේ එරට පැවැති ජනමත විචාරණය යි. එහිදී ඡන්දදයකයන්ගෙන් විමසා බලන ලද්දේ බ්‍රිතාන්‍යය තවදුරටත් යුරෝපා සංගමයේ සාමාජිකයකු ලෙස සිටිය යුතු ද නැද්ද යන්න යි. බ්‍රිතාන්‍ය ජනතාවගෙන් බහුතරයක් තීරණය කළේ එම සාමාජිකත්වයෙන් ඉවත් විය යුතු බව. රටවල් 28 කින් සමන්විත යුරෝපා සංගමය තුළ සිටීමෙන් බ්‍රිතාන්‍යයේ ආර්ථික නිදහස, සංස්කෘතික අනන්‍යතාව වැනි කාරණාවලට බලපෑමක් එල්ල වන බව පොදු පිළිගැනීම වුණා.

ජනමත විචාරණයෙන් පසුව තෙරේසා මේ අගමැතිනියට පැවරුණු විශාලම වගකීම වූයේ බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් වෙන්වීමට අදළ ගිවිසුම් සකස් කිරීමේදී බ්‍රිතාන්‍ය පාර්ශ්වයට නායකත්වය දීම යි. දීර්ඝ සහ වෙහෙසකර ක්‍රියාදමයකින් පසු මෙයට මාස කිහිපයකට පෙර මේ පිළිබඳ ගිවිසුම් කෙටුම්පතක් සකස් කෙරුණා. කිහිප වරක් ම මේ කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී පරාජයට පත් වූ අතර අවසානයේ හිටපු අගමැතිනිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මෙන් ම පක්ෂයේ ද වැඩි පිරිසකගේ විශ්වාසයක් නැති බව පෙනුණා. පක්ෂයේ නායකත්වයෙන් මෙන් ම අගමැති ධුරයෙන් ද ඉවත් වීමට ඇයට බල කෙරෙන තත්ත්වයක් ඇති වූයේ මේ පසුබිම තුළ යි.

කෙසේ වෙතත් තෙරේසා මේ ගේ නායකත්වයෙන් යුතුව සකස් කළ ගිවිසුමට වඩා හොඳ ගිවිසුමක් සකස් කර ගැනීමට බොරිස් ජොන්සන්ට හැකි වේවි ද? මෙය ඉතා සංකීර්ණ ප්‍රශ්නයක්. එයට එක් හේතුවක් නම් මේ ගිවිසුම සම්බන්ධයෙන් යුරෝපා සංගමය ද ඉතා දැඩි ස්ථාවරයක සිටීම යි. ඔවුන් දැනට තිබෙන ගිවිසුමේ සංශෝධන සිදු කිරීමට එතරම් කැමැති බවක් පෙනෙන්නට තිබුණේ නැහැ.

එය තෙරේසා මේ ද මුහුණ දුන් ගැටලුවක් වුණා. බොරිස් ජොන්සන් පවසන්නේ ඔවුන් එයට සූදනම් නැතිනම් ගිවිසුමකින් තොරව බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් කර ගැනීමට තමුන් පියවර ගන්නා බව යි. නමුත් මෙවැනි පියවරක් වුව ද බ්‍රිතාන්‍යයට හිතකර නොවනු ඇති බවට ඇතැම් පාර්ශ්ව වෙතින් අදහස් පළවෙනවා. එසේ නම් කළ යුත්තේ කුමක් ද? බොරිස් ජොන්සන් මේ අර්බුදය කවරාකාරයෙන් ජයගනු ඇත් ද යන්න දැන් බ්‍රිතාන්‍ය ජාතිකයන් පමණක් නොව ජාත්‍යන්තර කාරණා ගැන උනන්දුව දක්වන කවුරුත් කුතුහලයෙන් යුතුව බලා සිටින කාරණයක් බවට පත්ව තිබෙනවා.

හඳට පැන්න යෝධ පිම්ම

නිහාල් පීරිස්



පෘථිවියෙන් පිටත සැතපුම් ලක්ෂ ගණනක් ඈත පිහිටි වෙනත් 'ලෝකයකට' ගොඩ බහින්න මිනිසුන්ට හැකි වනු ඇතැ යි ඈත අතීතයේ විසූ අපේ මුතුන් මිත්තන් කිසිවිටෙක නොසිතන්නට ඇති. එහෙත් ඒ සිතිවිලි බොරු කරමින්, සැතපුම් 240,000 ක් (කි.මී. 380,000ක්) ඈත අහසේ අප වටා ගමන් කරමින් තිබෙන සඳ මත පා තැබීමට මෙයට වසර 50 කට පෙර පළමු වතාවට මිනිසුන් දෙදෙනකු සමත් වුණා. එය මිනිස් වර්ගයා ලැබූ අතිදැවැන්ත ජයග්‍රහණයක්. අභ්‍යවකාශ ගවේෂණයේ සහ එයට අදාළ තාක්ෂණයේ යෝධ ඉදිරි පිම්මක් සනිටුහන් කිරීමට මේ සිද්ධිය සමත් වූ බව කිව හැකි යි.

නීල් ඇල්ඩන් ආම්ස්ට්‍රෝන් සහ එඩ්වින් ඉයුජින් ඕල්ඩ්‍රින් යන ඇමරිකානු අභ්‍යවකාශ ගාමීන් දෙදෙනා මේ ආකාරයෙන් පළමු වරට සඳ මත පා තැබුවේ 1969 ජූලි මස 21 වැනිද යි. ඔවුන් දෙදෙනා තවත් ගමන් සගයකු වූ මයිකල් කොලින්ස් ද සමඟ පෘථිවියෙන් පිටත් වූයේ ජූලි 16 වැනිද යි. ඇමරිකානු අභ්‍යවකාශ ආයතනය වන නාසා ආයතනයේ මෙහෙයුමක් වූ මේ ව්‍යාපෘතිය හැඳින්වුණේ 'ඇපලෝ 11' යනුවෙන්. ඊට පෙර කිසි ද අත්හද බලා නොතිබුණු මේ ගමන සැබැවින්ම ජීවිතය පරදුවට තබා යා යුතු ගමනක් වුණා. ඒ නිසා මේ අභ්‍යවකාශගාමීන්ගේ ආත්ම විශ්වාසය, එඩිතරබව සහ ධෛර්යය ද විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණා. යම් හෙයකින් කුමක් හෝ අකරතැබ්බයක් සිදු වී නීල් සහ එඩ්වින් දෙදෙනා සඳ මත කොටු වුණා නම් කුසගින්නේ මිය යාමට හෝ දිවි නසා ගැනීමට ඔවුන්ට සිදුවන්නට තිබුණු බව මේ චාරිකාවෙන් පසු එක් නිලධාරියකු සඳහන් කර තිබුණා.

ජූලි මස 16 වැනිද පෘථිවියෙන් පිටත් වූ නීල්, එඩ්වින් සහ මයිකල් තිදෙනා සඳෙහි කක්ෂයට ළඟා වූයේ දින තුනකට පසුව, එනම් ජූලි 19 වැනිද යි. එයින් පසු මයිකල් කොලින්ස් ප්‍රධාන යානය සඳ වටා පදවාගෙන යමින් සිටියදී නීල් සහ එඩ්වින් දෙදෙනා එයට සම්බන්ධ කර තිබූ තව කුඩා යානයකට ඇතුළු වුණා. ඔවුන් දෙදෙනා සඳ මත ගොඩ බසින්නට නියමිත ව තිබුණේ මේ කුඩා චන්ද්‍ර යානයෙන්. එය නම් කර තිබුණේ 'ඊගල්' (රාජාලියා) යනුවෙනු යි. අනතුරු ව මේ

චන්ද්‍ර යානය 'කොලොම්බියා' නමින් හැඳින්වුණු මව් යානයෙන් වෙන් කෙරුණු අතර එය සෙමෙන් පහතට ගමන් කර ජූලි මස 20 වැනි දින සඳ මතට ගොඩ බැස්සා. ඊගල් යානය ප්‍රධාන යානයෙන් වෙන් වී සඳ දක්වා ගමන් කරන අතරතුර ඉතා ත්‍රාසජනක අවස්ථා කිහිපයකටම මුහුණ දීමට එහි සිටි දෙදෙනාට සිදුව තිබුණා. වරක් යානය තුළ තිබූ පරිගණකවලින් එක දිගටම වාගේ අනතුරු ඇඟවීම් සංඥා නිකුත් වීමට පටන් ගත් බවත් එය විසඳා ගත නොහැකි වූ තැන සඳ මත ගොඩබැසීම අවලංගු කර නැවත පැමිණෙනවාද යන අදහස පවා මතු වූ බවත් සඳහන් වෙනවා. එහෙත් අනතුරු ඇඟවීමේ සංඥා පරිගණකයේ යම් ගැටලුවක් නිසා මතු වූ ඒවා බව සොයා ගැනීමත් සමඟ ලොකු අනතුරක් නැති බව වටහා ගැනීමෙන් පසු යානය සඳ මත ගොඩ බැස්සවීමට තීරණය කළා. ඊගල් යානය ගොඩ බැස්සවීමට සිතාගෙන සිටි ස්ථානයට එය ගොඩ බැස්සවීමට නොහැකි වීමෙන් ද යම් ව්‍යාකූලත්වයක් මතුව තිබූ අතර යානයේ ඉන්ධන මට්ටම අඩු වීමේ ගැටලුවක් ද ඇති වී තිබුණා. පසුව එහි දෙර විවර කර ගැනීමේ ප්‍රශ්නයක් පැන නැගුණු බවත් සඳහන් වෙනවා. කෙසේ වෙතත්, මේ කිසිවක් ලොකු ප්‍රශ්න බවට පත් නොවූ නිසා පළමු සඳ ගමන කිසිදු ගැටලුවකින් තොරව සාර්ථක කර ගැනීමට හැකි වුණා. එහෙත් යානය තුළ ඉහත කී ගැටලු මතු වෙද්දී නීල් සහ එඩ්වින් දෙදෙනා තරමක් නොසන්සුන් වී සිටි බවක්ද වාර්තා වෙනවා.

ඔවුන් දෙදෙනා ඊගල් යානයේ දෙර විවර කරගෙන ඉන් පිටතට විත් සඳ මත පා තැබුවේ ජූලි මස 21 වැනි දින ග්‍රිනිච් වේලාවෙන් අලුයම් කාලයේයි. සඳ මත පා තැබූ පළමු මිනිසා වීමේ ගෞරවය හිමි වූයේ නීල් ආම්ස්ට්‍රෝන්ට යි. ඒ වන විට 39 වැනි වියෙහි පසු වූ ඔහු ඉතා පළපුරුදු, දක්ෂ නියමුවකු ලෙසයි සැලකුණේ. සමස්ත සඳ ගමනේ ප්‍රධාන අණ දෙන නියමුවා ලෙස කටයුතු කළේත් ඔහු යි. මයිකල් කොලින්ස් 'කොලොම්බියා' යානයේ නියමුවා වූ අතර ඕල්ඩ්‍රින් ඊගල් යානයේ නියමුවා ලෙස කටයුතු කළා. මේ සඳ ගමන සඳහා පුහුණුවීම් සහ අත්හදා බැලීම්වල නිරතව සිටිය දී ඊට පෙර වසරේ (1968) වරක් නීල් ආම්ස්ට්‍රෝන් මරණයෙන් ගැල වී තිබුණේ අනූ නවයෙන්. යම් අත්හදාබැලීමක් සඳහා යානයක් පදවමින් සිටියදී එහි පාලක පද්ධතිවල ඇති වූ දෝෂයක් හේතුවෙන් යානය ඔහුගේ පාලනයෙන් ගිලිහී ගියා. එය පොළොවට කඩා වැටෙන්නට ආසන්න ව තිබියදී නීල් ඔහුගේ පැරෂුටය ආධාරයෙන් පිටතට පැන ගැනීමට සමත් වූ අතර ඊට මොහොතකට පසු යානය කඩා වැටී ගිනි ජාලාවක් බවට පත්ව තිබුණා.

නීල් ආම්ස්ට්‍රෝන් ජූලි මස 21 වැනි දින සඳ මත පළමු පා සටහන තබමින් පැවසූ වදන් එක රැයින් ලොව

ඊගල් යානය ගොඩ බැස්සවීමට සිතාගෙන සිටි ස්ථානයට එය ගොඩ බැස්සවීමට නොහැකි වීමෙන් ද යම් ව්‍යාකූලත්වයක් මතුව තිබූ අතර යානයේ ඉන්ධන මට්ටම අඩු වීමේ ගැටලුවක් ද ඇති වී තිබුණා. පසුව එහි දෙර විවර කර ගැනීමේ ප්‍රශ්නයක් පැන නැගුණු බවත් සඳහන් වෙනවා.

පුරා ප්‍රසිද්ධියට පත් වුණා. 'මෙය එක් මිනිසකුගේ කුඩා පියවරක් පමණයි. එහෙත් මිනිස් සංහතිය පිනූ යෝධ පිම්මක්' යැයි ඔහු එහිදී ප්‍රකාශ කළා.

නීල් සහ එඩ්වින් පැය 2 කුත් විනාඩි 12 ක පමණ කාලයක් යානයෙන් පිටත ගත කළා. එහිදී යම් යම් පර්යේෂණ සිදු කිරීමට කටයුතු කළ අතර සඳෙහි පස් සහ ගල් සාම්පල රැගෙන ඒම ද ඔවුන් වෙත පැවරී තිබූ කටයුත්තක්. මේ දෙදෙනා සඳ මත සිටිය එකල ඇමරිකාවේ ජනාධිපති පදවිය දැරූ රිචඩ් නික්සන් ධවල මන්දිරයේ සිට ඔවුන් සමඟ දුරකතනයෙන් කතාබහක නිරත වූ බවද පැවසෙනවා. මෙය ධවල මන්දිරයේ සිට ගන්නා ලද ඓතිහාසිකම දුරකතන ඇමතුම වනු ඇතැයි ඔහු එහි දී සඳහන් කර තිබෙනවා. නික්සන් ජනාධිපතිවරයා මේ අභ්‍යවකාශගාමීන්ගේ කටයුතු මහත් සේ අගය කරමින් කතා කර තිබුණත් ඒ වනවිට වැඩි දෙනකු නොදැන සිටි තවත් කතාවක් ඔහු සූදානම් කරගෙන සිටි බවයි පැවසෙන්නේ. යම් හෙයකින් ගමන වැරදී නීල් සහ එඩ්වින් දෙදෙනා සඳහටම සඳ මත කොටු වූවා නම් ඔහු ජාතිය අමතා කරන්නට සිටි කතාවයි ඒ. අජටාකාශගාමීන් දෙදෙනාට සඳ මත ජීවිතය පුද කිරීමට සිදුවන තත්ත්වයක් ඉරණම විසින් තීන්දු කරනු ලැබ ඇති බව එහි සඳහන් වුණා. තමන් බේරා ගැනීම ගැන බලාපොරොත්තු තැබිය නොහැකි බැව් නීල් සහ එඩ්වින් දන්නා බවත්, එහෙත් ඔවුන් කළ පරිත්‍යාගය මිනිස් වර්ගයා වෙත බලාපොරොත්තු රැසක් ඉතිරි කරන්නක් බවත් එහි සඳහන් වුණා.

කෙසේ වෙතත් එවැනි කිසිදු ආපදාවක් සිදු නොවූ අතර නීල් සහ එඩ්වින් නැවත සිය චන්ද්‍ර යානයෙහි නැඟී සඳෙන් පිටත් වුණා. චන්ද්‍ර යානය සඳ මත තිබූ මුළු කාලය පැය 21 කුත් විනාඩි 36 ක් බව සඳහන් වෙනවා. ඊළඟට තිබුණේ චන්ද්‍ර යානය නැවත කොලොම්බියා මව් යානය සමඟ සම්බන්ධ කිරීමයි. ඉතා තීරණාත්මක කටයුත්තක් වූ මෙය ද සාර්ථකව නිම කිරීමට හැකි වූ අතර ඉන්පසු නීල්, එඩ්වින් සහ මයිකල් තිදෙනා ජූලි මස 24 වැනි දින නැවත පෘථිවිය වෙත සේන්දු වුණා.

'ඇපලෝ 11' පළමු සඳ ගමන එලෙස සනිටුහන් කළත් එය එකම සඳ ගමන වූයේ නැහැ. මිනිසුන් සඳ වෙත රැගෙන ගිය තවත් ව්‍යාපෘති කිහිපයක්ම එයින් පසුව ද ක්‍රියාත්මක වුණා. එහි අවසන් ව්‍යාපෘතිය වූයේ 1972 වසරේ ක්‍රියාත්මක වූ ඇපලෝ 17 ව්‍යාපෘතියයි. නීල් සහ එඩ්වින් දෙදෙනාගෙන් පසු තවත් අජටාකාශ ගාමීන් 10 දෙනකු සඳ මත පා බන්නට සමත් වුණා.

ඡායාරූපය - දයාන් විතාරණ

මීදෙනිය වලව්වේ අත්තම්මා

අයිරාංගනී සේරසිංහ

ප්‍රියන්ජන් සුරේෂ් ද සිල්වා

ඇය රේඩාවේ කතිරිනා. බක්මහ දීගේ ළමාතැනී. යශෝරාවයේ සුදු හාමිනේ. දූදරුවෝහි ඩල්සි ආච්චි. මේ සියලු චරිත එක ම රූපකායක කැටි වූ බහුවිධ චරිත. ඇය අයිරාංගනී රොක්සානා මීදෙනිය. විවාහයෙන් පසු සේරසිංහ බවට පත් ඇය සිංහල හා ඉංග්‍රීසි වේදිකාව, සිනමාව සහ රූපවාහිනිය යන කලා මාධ්‍යය තුන ම ජයගත් තවමත් රංගනයේ යෙදෙන අප අතර සිටින වයොවෘද්ධ ම එමෙන්ම දක්ෂතම චරිතාංග නිළිය යි. විශ්වවිද්‍යාල උපාධියක් අතැතිව සිනමාවට පිවිසි ප්‍රථම නිළිය වන්නේද ඇයයි.

සවස් යාමයේ ඇය තම නිවසේ ආලින්දයේ අසුන් ගෙන අවට පරිසරයෙන් නැඟෙන කුරුලු කූජනයට සවන් දී සිටිනවා. නිවෙස ඉදිරිපස ඇති විසල් ඇසළ ගසින් ගිලිහෙන මල්පෙති මිදුල පුරා පාවඩ එලා ඇති සේයි. පෙර මෙන් කඩිසර ව වැඩකටයුතුවල නිරත විය නොහැකි වුව ද ඇය තවමත් තම රංගන දිවියට නැවතීම තබා නැහැ. හුදෙකලාවේ සිතිවිලි අතර කිමිදෙන සෑම මොහොතක ම ඇගේ සිතිවිලි ස්පර්ශ කරන්නේ රුවන්වැල්ලේ මූදුගොමුව ගම්මානයේ මීදෙනිය වලව්වේ ගෙවුණු තම ළමා වියයි. මාවවුලන්ගේ, කොරවක්කන්ගේ තොරතෝංචියක් නැති කෑගැසීම්, ගැමි ගෙදරක අත්තම්මා කෙනකු බණ පොතක පිටුවක් කියවන හඬ, ගුරුගොඩ ඔයේ පාරු පදින්නන්ගේ පාරු කවි ඇගේ මතකයට නැඟෙනවා. ඒ සියල්ල සිහිනෙන් ගෑ සුවඳක් යැයි ඇයට හිතෙනවා. මේ වන විට ඇය 92 හැවිරිදි අත්තම්මා කෙනෙක්. තම ජීවිතය තමාටම පහනක් කොට නොගත් ඇය තමා උපන් බිමේ ජනතාව වෙත ද ඒ ආලෝකය රැගෙන ගියා. පාසල් වේදිකාවෙන් රංගනයට පිවිසි ඇය තවමත් තම රංගන කුසලතාවෙන් සුවහසක් රසිකයන්ගේ ජීවිත ආලෝකයෙන් පුරවාලනවා.

ඇය රේඩාවේ කතිරිනා. බක්මහ දීගේ ළමාතැනී. යශෝරාවයේ සුදු හාමිනේ. දූදරුවෝහි ඩල්සි ආච්චි. මේ සියලු චරිත එක ම රූපකායක කැටි වූ බහුවිධ චරිත. ඇය අයිරාංගනී රොක්සානා මීදෙනිය.

විවාහයෙන් පසු සේරසිංහ බවට පත් ඇය සිංහල හා ඉංග්‍රීසි වේදිකාව, සිනමාව සහ රූපවාහිනිය යන කලා මාධ්‍යය තුන ම ජයගත් තවමත් රංගනයේ යෙදෙන අප අතර සිටින වයෝවෘද්ධ ම එමෙන්ම දක්ෂතම චරිතාංග නිළිය යි. විශ්වවිද්‍යාල උපාධියක් අතැතිව සිනමාවට පිවිසි ප්‍රථම නිළිය වන්නේද ඇය යි.

1927 ජූනි 21 වැනි දින රුවන්වැල්ලට ආසන්න මූදුගොමුව ගම්මානයේ මීදෙනිය වලව්වේ උපත ලද අයිරාංගනී මීදෙනිය කොළඹ සාන්ත බ්‍රිජට් කන්‍යාරාමයෙන්, බිෂොප් විද්‍යාලයෙන් හා මහනුවර උසස් බාලිකා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා. සාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ කුඩා දැරියක ලෙස පාසල් වේදිකාවේ 'වෝටර් බේබීස්' නම් නාටකයේ රඟන විට ඇගේ වයස අවුරුදු 6යි. පසුව මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ උසස් පෙළ හදරන අවදියේ පාසල් වේදිකාවට ගෙන ආ බර්නාඩ් ෂෝගේ 'පිග්මෙලියන්' නාට්‍යයේ ප්‍රධාන චරිතය රඟපෑවේ ඇය යි. උසස් පෙළ සමත් වූ ඇයට 1947 දී විශ්වවිද්‍යාලයට පිවිසීමේ වරම් හිමි වුණා. එහෙත් ඇගේ පියා වූ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ උගත් මීදෙනිය රටේ මහත්තයා තම

දියණිය විශ්වවිද්‍යාලයකට යනවාට එතරම් කැමති වුණේ නැහැ. ''ඔබ ඒ විෂමතාවෙන් පිරුණු ගෘහාවට යනවට මං කැමති නැහැ'' යන්න ඇගේ පියාගේ මතය වුණා. ඒ වන විටත් ඇගේ ඥාති සොහොයුරකු විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබමින් සිටි අතර ඔහු රටේ මහත්තයාට අයිරාංගනී විශ්වවිද්‍යාලයට යවන මෙන් කරන ලද ඇවිටිලි නිසා අවසානයේ ඇයට ඒ සඳහා අවසර ලැබුණා. ඇය විශ්වවිද්‍යාලයේ පළමු වසර ගෙවද්දී ඇගේ පියා මෙලොව හැර ගියා.

යොවුන් වියේ පටන් ඇය තුළ සමාජවාදී අදහස් වැඩෙන්නට වුණා. ඊට බලපෑවේ ඇගේ ඥාතියකු වූ වමේ ව්‍යාපාරයේ බලකණුවක් ව සිටි එස්මන්ඩ් වික්‍රමසිංහ හා ඇගේ ඥාති සොහොයුරන්ගේ ආභාසය යි.

ලංකා විශ්වවිද්‍යාලය ඇගේ දක්ෂතා ඔප්නංවා ගැනීමට කදිම තෝතැන්නක් වුණා. එහි නිෂ්පාදනය කළ බොහෝ ඉංග්‍රීසි නාට්‍යවලට ඇය රංගනයෙන් දායක වී තිබෙනවා. විශ්වවිද්‍යාල නාට්‍යවල රඟපානවාට පවුලෙන් විරෝධයක් මතු වුණේ නැහැ. එහි නාට්‍ය සංගමය සෑම වසරක ම උසස් නාට්‍යයක් රංගගත කළා. ඒ සෑම නාට්‍යයකට ම ඇය රංගනයෙන් දායක වුණා. මහාචාර්ය ඊ. එෆ්. සී ලුඩොවයික් යටතේ ඇයගේ දක්ෂතා ඔප් නැංවුණු අතර මෙරට සිටි සුප්‍රකට මුදනාට්‍ය ශිල්පියකු වූ චිත්‍රසේනගෙන් නැටුම් හදරන්නට ද ඇයට හැකි වුණා.

මහාචාර්ය ලුඩොවයික්ගේ සහයෙන් ලන්ඩනයේ බ්‍රිස්ටල් ඕල්ඩ්විච් නාට්‍ය පාසලට ද ඇය සම්බන්ධ වුණා. එහි වසරක කාලයක් අධ්‍යාපනය ලද ඇය තවත් වසර දෙකක් ලන්ඩන් රංග කලා හා කථන පුහුණු ආයතනයේ අධ්‍යාපනය ලැබුවා.

නාට්‍ය කලා අධ්‍යාපනය ලබා යළි මෙරටට පැමිණි ඇය මහාචාර්ය ලුඩොවයික් හා ඔස්ට්‍රියානු යුදෙව් නාට්‍ය අධ්‍යක්ෂවරයකු වූ නිව්මන් ජුබාල්ගේ වේදිකා නාට්‍යවලට දායකත්වය ලබා දුන්නා. එතෙක් කොළඹ වේදිකාගත කළ නාට්‍ය රඟ දැක්වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ ජෝජ් රාජ ශාලාවේ. 1953 දෙසැම්බර් 12 වැනි දින කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහල විවෘත කළ දිනයේ වේදිකාගත වූ ජුබාල් විසින් නිෂ්පාදනය කළ මැක්සිම් ගෝර්කිගේ 'ලෝවර් ඩෙප්ත්ස්' නාට්‍යයේ නාස්ටියාගේ චරිතය රඟපෑවේ අයිරාංගනී සේරසිංහ යි. ඉන්පසු ඇය සිංහල වේදිකාවට ද පිවිසුණා. හෙන්රි ජයසේනගේ 'අපට පුතේ මගක් නැතේ', ධම්ම ජාගොඩගේ 'වෙස් මුහුණු', 'පෝරිසාදයා' වැනි නාට්‍ය ඉන් කිහිපයක්.

අයිරාංගනී එංගලන්තයේ නාට්‍ය කලාව හදරන සමයේ එරට මාධ්‍යවේදියකු ලෙස කටයුතු කළ ලෙස්ටර් ජේම්ස් පීරිස් හඳුනා ගන්නට ඇයට හැකි වුණා. පසු කලෙක ලෙස්ටර් ලංකාවට පැමිණ රජයේ චිත්‍රපට අංශයට සම්බන්ධ වුණා. ඇය මුලින් ම කැමරාවක් ඉදිරියේ රඟපෑවේ රජයේ චිත්‍රපට අංශය මඟින් නිර්මාණය කළ ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'බී සේෆ් ඕ බී සොරි' නමැති වාර්තා චිත්‍රපටයේ. එහි ඇය රියැදුරුවරියක ලෙස රඟපෑවා.

ලෙස්ටර් තම ප්‍රථම වෘත්තාන්ත චිත්‍රපටය වූ රේබාව සඳහා ඇයට ඇරියුම් කළේ ඇයගේ රංගන කුසලතාව මැනවින් හඳුනාගත් බැවින්. ඇය 1950 හා හාපුරා කියා වෘත්තාන්ත චිත්‍රපටයකට සම්බන්ධ වන විට ඇගේ වයස අවුරුදු 23 යි. ඒ පිළිබඳ ව ඇය වරක් මෙලෙස සඳහන් කළා. ''මට ඒ දවස කවදාවත් අමතක වෙන්නෙ නැහැ. ඒ පිළිබඳ සිතනකොට දැනුත්

කිසියම් ආස්වාදජනක හැඟීමක් ඇති වෙනවා. සිංහල සිනමාවේ හැරවුම් ලක්ෂයක් බඳු රේඛාවේ රඟපාන්න ලැබීම මහත් භාග්‍යයක්.''

රේඛාවෙන් පසු ඇය ලෙස්ටර්ගේ සන්දේශය, දෙලොවක් අතර, රන්සළු, ගෝඩ් කිං, අවරගිර, වෑකන්ද වලව්ව වැනි චිත්‍රපටවලට දායක වුණා. ගම්පෙරළිය චිත්‍රපටයේ මාතර හාමිනේ ලෙසද ඇය තෝරාගත්තත් ඇගේ සිරුරේ හැඩය එම චරිතය සඳහා නොගැළපුණු හෙයින් ලෙස්ටර් ශාන්ති ලේඛා තෝරා ගත් බව වරක් ඇය සඳහන් කර තිබුණා.

ඇය වෙනත් අධ්‍යක්ෂවරුන්ගේ චිත්‍රපට රසකට ද දායක වුණා. දයානන්ද ගුණවර්ධනගේ 'බක්මහ දීගේ' ටයිටස් තොටවත්තගේ 'තෙවත', අමරනාත් ජයතිලකගේ 'ප්‍රියංගා', ගාමිණී ෆොන්සේකාගේ 'සාගරයක් මැද', එච්. ඩී. ප්‍රේමරත්නගේ 'දෙවැනි ගමන', වසන්ත ඔබේසේකරගේ 'දඩයම', චන්ද්‍රන් රත්නම්ගේ 'ආදර කතාව' සහ 'පොරොන්දුව', සුමිත්‍රා පීරිස්ගේ 'ලොකු දුව', සුනිල් ආරියරත්නගේ 'සුදු සෙවනැලි' රන්ජිත් කුරුප්පුගේ 'පවන රළු විය' වැනි චිත්‍රපට ඇයගේ රංගනයෙන් ඔප් නැංවුණු චිත්‍රපට. ඒ අතර ස්ටීවන් ස්පීල්බර්ගේ 'ඉන්ඩියානා ජෝන්ස් ටෙම්පල් ඔෆ් ඩූම්', දීපා මේතාගේ 'වෝටර්' වැනි ජාත්‍යන්තර චිත්‍රපට ද වනවා. 1950 රේඛාවෙන් ඇරඹී ඇයගේ සිනමා දිවියේ මේ වන විට රඟ පා ඇති චිත්‍රපට සංඛ්‍යාව 37 ක්. 2019 තිරගත වූ 'සුළඟ අප රැගෙන යාවි' චිත්‍රපටයේ ද ඇය අත්තම්මා ලෙස අපූරු රංගනයක යෙදෙනවා.

ඇයගේ රූපවාහිනී අගමනය සිදු වූයේ පරාක්‍රම නිරිඇල්ලගේ යශෝරාවය ටෙලි නිර්මාණයෙන්. එහිදී සුදු හාමිනේ ලෙස අතිප්‍රබල රංගනයක යෙදෙමින් ඇය දැක් වූ දක්ෂතා සුවිශේෂ යි. ජී. ඩබ්ලිව්. සුරේන්ද්‍ර වැනි දක්ෂ චරිතාංග නළුවකු සමඟ ජීවිතයේ දුක් ගැහැට විඳින මවකගේ චරිතය ඇය එම ටෙලිනාට්‍යයේ අපූරුවට නිර්මාණය කළා. එතැන් සිට ඇය පුංචි තිරයේ නොමැකෙනසුළු චරිතයක් වුණා. යශෝරාවයෙන් පසු ඇයගේ රංගන කුසලතා ප්‍රේක්ෂකයන් අතරට ආවේ නාලන් මෙන්ඩිස්ගේ 'දූදරුවෝ' ටෙලි නාට්‍යයේ ඩල්සි ආච්චිගේ චරිතයෙන්. බර්ට්‍රම් නිහාල්ගේ 'ගම් පෙරළිය', මෙන් ම 'නෑදෑයෝ', 'අම්මයි තාත්තයි', 'සත්පුර වැසියෝ' 'මුතු කිරිල්ලී', 'අමන්ද', සහ 'තාත්තා' යන ටෙලි නාට්‍ය රසක විවිධ චරිතවලට ඇය පණ දුන්නා.

අයිරාංගනී සේරසිංහ මියුසියස් විද්‍යාලයේ ඉංග්‍රීසි සහ ඉතිහාසය පිළිබඳ ගුරුවරියක ලෙසත්, ටයිම්ස් පුවත්පතේ හා ගුවන්විදුලියේ මාධ්‍යවේදිනියක ලෙසත් සේවය කළා. පසුව සංචාරක කර්මාන්තයට එක් වූ ඇය මැක්වුඩ්ස් ආයතනයේ කනිෂ්ඨ විධායක නිලධාරිනියක ලෙස ද කටයුතු කළා. 1960 දී මෙරට සිටි දක්ෂ වේදිකා නළුවකු වූ වින්ස්ටන් සේරසිංහ හා විවාහ වූ ඇය පුතුන් දෙදෙනකුගේ මවක්. ඔවුන් දෙදෙනා ලෙස්ටර්ගේ රේඛාව චිත්‍රපටයේ රඟ පා තිබුණා. අයිරාංගනීගේ එක් පුත්‍රයකු අකාලයේ මිය යෑම ඇගේ ජීවිතයට ගෙන දුන්නේ විශාල වේදනාවක්.

ලංකා විශ්වවිද්‍යාලය ඇගේ දක්ෂතා ඔප්නංවා ගැනීමට කදිම තෝතැන්නක් වුණා. එහි නිෂ්පාදනය කළ බොහෝ ඉංග්‍රීසි නාට්‍යවලට ඇය රංගනයෙන් දායක වී තිබෙනවා. විශ්වවිද්‍යාල නාට්‍යවල රඟපානවාට පවුලෙන් විරෝධයක් මතු වුණේ නැහැ.

පරිසරයට බෙහෙවින් ආදරය කරන ඇය පරිසරය රැකගැනීමේ අරමුණින් 'රුක් රැකගන්නෝ' නමින් සංවිධානයක් 1975 දී ආරම්භ කළා. ස්වේච්ඡා සේවයක් වූ එය ගස්වැල් රැකගැනීම පිළිබඳ ව බිම් මට්ටමින් ජනතාව දැනුම්වත් කරන සංවිධානයක්. ඇය තවමත් ගමේ නිසංසල පරිසරයට කැමති යි. තම මෝටර් රථය පැදවිය හැකි සමයේ මද විවේකයක් සොයා ඇය බෙලිහුල්ඔය පඹහින්නේ පිහිටි නිවහනට ගොස් වෙහෙස නිවාගන්නට කැමැත්තක් දැක්වූවා. එහි ඇති විසල් රුක් ගොමු අතර හුදෙකලාවේ සිටින්නට ඇය කැමති වූවා. එහෙත් ඇයට දැන් තනිව එහි යා නොහැකි යි. ඇය තවමත් කැමති නගරයේ ඝෝෂාවෙන් මිදී සිත නිවන තැනක රැඳෙන්නට යි.

කලා කීර්ති සහ '2017 ශ්‍රී ලංකන් ඔෆ් ද ඉයර්' සම්මානයෙන් පුද ලද මේ ගෞරවාන්විත මාතාව රිදී තිරයේ හා රූපවාහිනියේ අම්මා. අත්තම්මා. වසර 70කට ආසන්න කාලයක් රංගන ක්ෂේත්‍රයේ නිරත වන ඇය මෙරට නිළි පරපුරට ම ආදර්ශයක් දුන් කාන්තාවක්.

ඇගයීම ප්‍රමාණවත් නැහැ

සුමිත්‍රා පීරිස්
ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ

සිනමාව සහ නාට්‍යය පිළිබඳ හැදෑරීමක් ඇති ව විශේෂයෙන් එංගලන්තයේදී ඒ පිළිබඳ උපාධියක් ද ලබාගෙන මේ ක්ෂේත්‍රයට පිවිසි ප්‍රථම නිළිය වන්නේ අයිරාංගනී සේරසිංහ යි. ඒ ශාස්ත්‍රීය පසුබිම ඇගේ රංගන දිවියේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වූ බව කිව යුතු ම කාරණයක්. ඇගේ රංගන ජීවිතය වැඩිපුර ම ගෙවුණේ මට වඩා ලෙස්ටර් සමඟ. රේඩාව චිත්‍රපටයෙන් ඇරඹි එම ගමන ලෙස්ටර්ගේ වැකන්ද වළව්ව චිත්‍රපටය දක්වා ම පැමිණියා. ඔහුගේ චිත්‍රපට 10ක පමණ ඇය රඟ පා තිබෙනවා. බොහෝ රංගන ශිල්පීන්, ශිල්පිණීන් සිටියත් අයිරාංගනී වඩාත් කැපී පෙනුණේ චරිතයට කිඳ බසිමින් ඇය උගත් දැනුමින් ඒ චරිතයට ඉටු කළ සාධාරණත්වය හා එම චරිතය තුළ දැක් වූ රංගන කුසලතාව නිසා. ඇය තරම් රංගනයේ විශිෂ්ට රංග ප්‍රතිභාවක් පෙන් වූ නිළියක් මා දැක නැහැ. ඇය සමඟ මේ ක්ෂේත්‍රයේ බොහෝ දුරක් එන්නට ලැබීමත් අපේ පිනක්.

මා අධ්‍යක්ෂණය කළ චිත්‍රපට අතර ඇය මුලින් ම රංගනයට එක් වූයේ දුවට මවක මිස චිත්‍රපටයෙන්. ඉන් පසු ලොකු දුව චිත්‍රපටයේ සිට මා අවසන් වරට අධ්‍යක්ෂණය කළ වෛෂ්ණවී චිත්‍රපටයේ රඟ පෑවා. කෙසේ වෙතත් ඇයගේ තරුණ කාලයේ මට ඇයත් සමඟ චරිතයක් කරන්නට ලැබුණා නම් එය මගේ භාග්‍යයක්. එය මට නොලැබුණත් ඒ අවස්ථාව ලෙස්ටර්ට සහ ගාමිණීට ලැබුණා. මට මතක යි වැකන්ද වළව්ව චිත්‍රපටයේ කොමඩි සිදුවීමකට ඇය රංගනයෙන් දයක වූ ආකාරය. ආසාවෙන් එය ඉතා සීරුවෙන් ඇය කළා. මා සිතන්නේ නැහැ ගැහැනු චරිතයක් තුළින් එවැනි රංගනයක් සිනමාවට සිදු කර ඇති කියලා.

පුද්ගලයකු විදිහටත් ඇය සියල්ලෙන් ම පොහොසත්. පැළැන්තියෙන්, උගත්කමින් වගේ ම මනුස්සකමිනුත් ඇය ඉහළ තලයක සිටිනවා. පරිසරය ගැන නිරන්තරයෙන් උනන්දුවක් දක්වන රට ගැන කැක්කුමක් තිබෙන ඒ ගැන අවබෝධයෙන් කතා කරන කාන්තාවක් ඇය. එවැනි සුවිශේෂ චරිතයක් ලංකාවේ බිහි වෙන්න තව බොහෝ කලක් ගත වේවි. මගේ ජීවිත කාලය තුළ නම් එවැන්නක් සිදු වේ යැයි කියන්න අමාරු යි. එහෙත් ඇගේ චිත්‍රපට රංගන ඉතිහාසය හදරන මතු පරම්පරාව කල් ගිහින් හෝ ඇගේ ඒ සුවිශේෂත්වය හඳුනා ගනීවි. මා සිතන්නේ ඇය වැනි රංගනයේ සුවිශාල චරිතයක් ඇගයීමට පාත්‍ර වුණා මදි කියලා. මීට වඩා ඇගයීමක් ඇයට ලබා දිය යුතු යි. දෙසතිය සඟරාවෙන් ඇගේ රංගන ප්‍රතිභාවට ලබා දෙන මේ ඇගයීම මා ඉතා අගය කරනවා.

මාලා මල්කාන්ති පරණගමගේ

දෙලොවක් අතර
සිනමා පටයෙන්

විශ්වවිද්‍යාල ජීවිතයෙන් පසු අයිරාංගනී මට හමුවුණේ ලයනල්වෙන්ඩ්ට් රඟහලේදී. ඇය ඒ වනවිටත් බොහොම සුන්දර තරුණියක්. ඇය වේදිකා රංගනයට පිවිසියේ බිෂොප් විද්‍යාලයෙන්. ඒ, 'My Fair Lady' ඉංග්‍රීසි නාට්‍යයේ පිරිමි චරිතයකට පණ පොවමින් මහාචාර්ය හිගින්ස්ගේ චරිතයට යි. එකල වළව් පැළැන්තියක් සහිත ඇය පැවති සමාජ, සංස්කෘතික වටපිටාවට අභියෝග කරමින් වේදිකාවට ගොඩවුණේ බොහො ම නිර්භය ව.

වේදිකා නාට්‍ය කලාව යි එකල ප්‍රධානතම දෘශ්‍ය කලා මාධ්‍යය ලෙස පැවතියේ. ඒ හේතුවෙන් නාට්‍ය නරඹන ප්‍රේක්ෂක පිරිසක් නිර්මාණය වුණේ ඉහළ පැලැන්තිය වගේ ම මධ්‍යම පාන්තිකයන් ද නියෝජනය වන අයුරින්. මොවුන් එකල ජනප්‍රිය ඉංග්‍රීසි නාට්‍යය ද අත්නොහැර නරඹන්න පුරුදු වී සිටියා. මහාචාර්ය ලුඩොවයික්ගේ නාට්‍යවලින් වේදිකාවේ පියවර මැන ගිය අයිරාංගනී පසුව රංගනයෙන් එක් වූයේ පර්සිකොලිම්තෝම්ගේ නාට්‍යවලට.

සොලිසිටර් ජනරාල්වරයකු ලෙස මෙරට සේවය කළ ඔහු

වෘත්තීය සංයමය ප්‍රබලව දියුණු කළ නිළියක්

නාමෙල් වීරමුණි
කලා කීර්ති, නාට්‍ය කීර්ති,
අධිනීතිඥ

නාට්‍ය කලාවට දැක් වූ ප්‍රියතාව නිසා ම අයිරාංගනිය හා මා ඔහු සමඟ ඉතා කිට්ටුවෙන් නාට්‍ය වැඩකටයුතුවලට සම්බන්ධ වුණා. ඒ, ලයනල්වෙන්ඩ්ට් රඟහල ආරම්භ කළ මුල් කාලයේදී. ලුඩොවයික්ගෙන් හා පර්සිකොලිම්තෝම්ගෙන් පසුව බිහි වූ ඉංග්‍රීසි නාට්‍ය ගණයේ අග්‍රගණ්‍ය නිෂ්පාදකවරයා වූයේ අර්නස්ට් මැකින්ටයර්. ඔහුගේ නාට්‍යවලට මා මෙන් ම අයිරාංගනිය රංගනයෙන් දායක වුණා. ස්පාඤ්ඤ නාට්‍යකරුවකු වූ ගාර්ෂියා ලෝර්කා අයිරාංගනියගේ රංගන කුසලතා උරගා බැලූ තවත් එක් නාට්‍ය නිෂ්පාදකවරයෙක්. ඉතා ම ගැඹුරු ජීවන දර්ශනයක් ඉදිරිපත් කළ බර්නාඩා නාට්‍යයේ ඇය නියළුණේ ප්‍රශස්ත රංගනයක.

ශේක්ස්පියර්ගේ ඔතෙලෝ, මැක්බත් යනාදී විදේශීය නාට්‍යවලට ද ඇය සතු නිසඟ රංගන කුසලතා එක් කළා. ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ නිපුණ බව මේ නාට්‍යවල චරිතවලට පණ පෙවීමේදී වඩ වඩාත් ඇය තුළින් කැපී පෙනෙන්නට වුණා. එංගලන්තයේ Royal Grmatic Academyයේ නාට්‍ය කලාව පිළිබඳ ව විධිමත් ව හැදෑරූ ඇය ලංකාවෙන් බිහි වූ විශිෂ්ට නිළියක් වග නොපමාව කියා පෑවේ ඔපමට්ටම් වූ ඇගේ එම රංගන කෞෂල්‍යයෙන්.

ඉංග්‍රීසි නාට්‍යවලින් පසුව ඇය ලෙස්ටර්ගේ චිත්‍රපට රැසකට ම රංගනයෙන් දායක වුණා. ඊටත් පසුව යි අයිරාංගනිය ටෙලි තිරයේ අපට දකින්න ලැබුණේ. වේදිකාවේ, සිනමාවේ, ටෙලිනාට්‍යයේ ඇය කුමන චරිතයකට පිවිසියත් ඒ සෑම චරිත නිරූපණයක් ම ඇය කළේ ඉතා ම අග්‍රගණ්‍ය ආකාරයෙන්. ඉංග්‍රීසි නාට්‍ය වේදිකාවේ රැජින වූයේ අයිරාංගනිය යි. ඉතා දක්ෂ නළුවෙකු වූ ඇගේ ස්වාමි පුරුෂයා වන වින්සන්ට් සේරසිංහ සමඟ අයිරාංගනිය එක් ව රඟපෑවේ නොයෙක් නිර්මාණවල විවිධ චරිත නිරූපණය කරමින්. ඇගේ කලා ජීවිතය තව තවත් ආලෝකමත් වුණේ මේ දෙදෙනාගේ සුසංයෝගය නිසා. හිමි වූ චරිතය මුලින් ම තමන්ගේ කරගත් ඇයගේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ අදාළ චරිතයට ආවේශ වීම යි. චරිත ලක්ෂණ වඩාත් හොඳින් ග්‍රහණය කරගත් ඇය චරිත නිරූපණයෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීමට යි කැප වුණේ. පුහුණුවීම් අතරතුර ඕපාදූප කතාබහේ යෙදුණු පිරිසෙන් මිදුණු ඇය පොතකට නැඹුරු වෙන්නේ චරිතය පිළිබඳ ව හොඳ සූදානමකින්.

මා නිරීක්ෂණය කළ අයිරාංගනිය වෘත්තීය සංයමය ප්‍රබලව දියුණු කළ නිළියක්. චරිත නිරූපණයේ ආරම්භයේ සිට අවසානය දක්වා ම අවධානය නොබිඳී තබා ගැනීමට ඇය සමර්ථයක්. සුහද බව, සරල චාම් ගත් පැවතුම් හා අවංක කතාබහ ඇය කෙරෙන් විද්‍යමාන වූ මිනිසත්බවේ ගුණ සුවඳ යි. ඇයත් අපේ ජාතික වස්තුවක්. මෙවැනි සොඳුරු මිනිසුන්ගේ නොමියෙන කලා නිර්මාණ වෙනුවෙන් කලාගාරයක් හෝ කලා කෞතුකාගාරයක් නිර්මාණය කළ යුතු යි. ඒ අපේ අනාගත පරපුර වෙනුවෙන්.

මහේෂිකා දිසානායක

මා දුටු විශිෂ්ට චරිතාංග නිළිය ඇය යි

දු දරුවෝ ටෙලි නාට්‍යයෙන්

නාලන් මෙන්ඩිස්
ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ

මේ සිදුවීම වුණේ 'දූ දරුවෝ' ටෙලිනාට්‍යය අධ්‍යක්ෂණය කළ කාලයේදී යි. දිනක් මා නින්දෙන් අවදි කරවමින් මධ්‍යම රාත්‍රියේ නිවසේ දුරකථනය නාද වුණා. දුරකථන ඇමතුම ලබාදුන් තැනැත්තා වෛද්‍යවරයෙක්. ඔහු තමන්ව හඳුන්වා දෙමින් කියා සිටියේ 'දූදරුවෝ' ටෙලිනාට්‍යයේ රංගන ශිල්පිනියක් ඒ මොහොතේ ඔහු වෙත පැමිණ සිටින බව යි. අධි රුධිර පීඩනයෙන් පෙළෙන ඇයට දින කිහිපයක් විවේකයෙන් ගත කරන ලෙස උපදෙස් ලබා දුන්න ද ඇය පසු දා උදෑසන පටිගත කිරීම්වලට යා යුතු ම බව පවසමින් මුරණ්ඩු වන බව කියා සිටි වෛද්‍යවරයා මගෙන් ඉල්ලා සිටියේ හැකි නම් ඇයට උපදෙසක් ලබා දෙන මෙන්. පසුව මා දුරකථනයෙන් අමතා පටිගත කිරීම් කල්දමාගත හැකි බව පෙන්වා දීමෙන් අනතුරුව යි ඇය විවේක ගැනීමට එකඟ වූයේ. ඒ මොහොතේ එම වෛද්‍යවරයා අසළ සිටි රංගන ශිල්පිනිය අන් කිසිවකු නොව අයිරාංගනී සේරසිංහ මහත්මිය යි. එය මා ඇගේ කැපවීමේ තරම හඳුනාගත් එක් කුඩා සිදුවීමක් පමණ යි.

අයිරාංගනි සේරසිංහ මට මුලින් ම හමු වූයේ 1978 වසරේදී. ලයනල් වෙන්ඩ් රංග ශිල්ප ශාලිකාවේ ධම්ම ජාගොඩ මෙහෙය වූ නාට්‍ය පාඨමාලාවකට මා ද සම්බන්ධ වී සිටියා. ඇය වරක් එම පාඨමාලාවට සහභාගි වූයේ උපදේශකවරියක් ලෙස. 1986 වසරේදී මට අවස්ථාවක් ලැබුණා 'ගම්පෙරළිය' ටෙලිනාට්‍යයේ ඇය සමඟ වැඩ කරන්න. ඇය කෙතරම් සැලසුම් සහගත ව කටයුතු කරන රංගන ශිල්පිනියක් ද යන වග මා අවබෝධ කර ගත්තේ ඉන්පසුව යි. ඇය පසුතලයට පැමිණෙන්නේ පිටපත හොඳින් අධ්‍යයනය කිරීමෙන් අනතුරු ව තමන්ගේ චරිතය පිළිබඳ ව පූර්ව සූදානමක් ඇති ව. 1990 වසරේ සිට දීර්ඝ කාලයක් මුළුල්ලේ මා අධ්‍යක්ෂණය කළ 'දූදරුවෝ', 'නෑදෑයෝ', 'සත්පුර වැසියෝ' වැනි නාට්‍ය ගණනාවකදී මට අවස්ථාව ලැබුණා ඇය ඉතා සමීප ව ඇසුරු කිරීමට. එහිදී මා දුටුවා නිර්මාණයකට සම්බන්ධ වීමේදී ඇයට කල්තියා පිටපතක අවශ්‍යතාව පවතින බව. ටෙලිනාට්‍යක මූලික පදනම තිබෙන්නේ පිටපතේ. පිටපත සමඟ හොඳින් ගනුදෙනු කර තමන්ගේ චරිතය පිළිබඳ ව මනා අවබෝධයකින් පසුතලයට පැමිණෙන ඇය වැනි කලාකාරිනියන් සමඟ කටයුතු කිරීම අධ්‍යක්ෂකවරයකුට බොහොම පහසු යි. 'අම්මයි තාත්තයි','පාරාදීසය','ඔබ කවුද','දූවරු' වැනි ටෙලිනාට්‍යවලදී එය මා හොඳින් අත්දුටුවා.

යම් ජවනිකාවක් පළමු අවස්ථාවේ ම නිවැරදි ව කැමරා කාවයේ සටහන් කිරීමට හැකි අන්දමේ රංග ප්‍රතිභාවක් ඇය සතු බව මා දන්නේ අත්දැකීමෙන්. අනිකුත් රංගන ශිල්පීන් සමඟ පවත්වන සම්බන්ධතාව විශේෂයෙන් අගය කළ යුතු යි. ජ්‍යෙෂ්ඨ හා නවක නළුනිළියන් යනුවෙන් වෙනසක් නැතිව ම ඇය සියල්ලන් සමඟ කටයුතු කරන්නේ ඉතාමත් සුහද ව. ඇය දෙබස් උච්චාරණය කරන ආකාරය නවකයන්ට හොඳ අභ්‍යාසයක් ලබාදෙනවා. යම් නිර්මාණ කටයුත්තකට සම්බන්ධ වූ පසු ඉතා ම සහයෝගයෙන් කටයුතු කරන කලා ශිල්පිනියක් විදිහට යි මා ඇයව හඳුනාගන්නේ.

වෛද්‍ය උපදෙස් නොතකා ඇය මෑතක් වනතුරු ම රංගන

"ටෙලිනාට්‍යක මූලික පදනම තිබෙන්නේ පිටපතේ. පිටපත සමඟ හොඳින් ගනුදෙනු කර තමන්ගේ චරිතය පිළිබඳ ව මනා අවබෝධයකින් පසුතලයට පැමිණෙන ඇය වැනි කලාකාරිනියන් සමඟ කටයුතු කිරීම අධ්‍යක්ෂකවරයකුට බොහොම පහසු යි."

කටයුතුවල නිරත වූයේ රංගනය තරමට සතුටක් ගෙනදෙන තවත් යමක් ඇයට නොවූ බැවින්. වයස්ගත වීමත් සමඟ ඇතිවන ශාරීරික දුබලතා පවා මඟහරවා ගනිමින් තමන් භාරගත් නිර්මාණ කටයුත්තට උපරිම සාධාරණයක් ඉටු කිරීමට ඇය කරන කැපකිරීම ප්‍රශංසනීය යි. නව පරපුරේ කලාශිල්පීන්ට සහ ශිල්පිනියන්ට ඇයගේ ජීවිතයෙන් උකහාගත හැකි ගුණාංග බොහෝමයක් තිබෙනවා.

ටෙලිනාට්‍ය ක්ෂේත්‍රය තුළ ඇය ව නිරන්තරයෙන් තෝරා ගැනුණේ මවගේ චරිතයට. එසේ වුවත් එහි සුවිශේෂත්වය වූයේ ඇය නිරූපණය කළ සියලු මව්වරුන්ගේ චරිත එකකට එකක් හාත්පසින් ම වෙනස් ස්වරූපයක් ගැනීම යි. විවිධ සමාජ පන්තිවල මව්වරුන්ගේ චරිත ඇය නිරූපණය කර තිබෙනවා. 'දූදරුවෝ' ටෙලිනාට්‍යයේ ඇය නිරූපණය කළේ මධ්‍යම පාංතික පවුලක මවකගේ චරිතයක්. 'නෑදෑයෝ' ටෙලිනාට්‍යයේ ඉහළ මධ්‍යම පාංතික පවුලක මවක්. ඇය ඒ ඒ සමාජ පංති පිළිබඳ මනා අවබෝධයක් ඇතිව යි ඇයට හිමි චරිතය නිරූපණය කළේ. මෙලෙස පිටපතෙන් තමන්ට පැවරෙන චරිතය කුමන පංතියක කුමන තරාතිරමක චරිතයක් ද? යන්න මැනවින් අවබෝධ කරගෙන සාධාරණ චරිත නිරූපණයක් කිරීමේ හැකියාව ඇය සතු යි. ඇගේ ප්‍රශස්ත රංගනය ප්‍රේක්ෂක මතකයෙන් ගිලිහී නොයනු ඇතැ යි යන්න යි මගේ විශ්වාසය.

කාංචනා සිරිවර්ධන

තාත්වික රංග ප්‍රතිභාව ප්‍රේක්ෂක හද සොරා ගත්තා

'රේබාව' සිනමා නිර්මාණයෙන් අයිරාංගනී සේරසිංහ රංග කලාවට ලබාදුන්නේ සුවිශේෂ වටිනාකමක්. ප්‍රථම වතාවට අප සිංහල රිදී තිරයේ තාත්වික රංගනය දුටුවේ ඇයගෙන්. අතිශයෝක්තිය, භාවාතිෂය වූ රංගන විලාසය තුළ සිර ව සිටි අප ව එයින් ගලවා ගනිමින්, පොළොවේ පය ගසා ජීවත් වන මිනිසුන්ගේ සැබෑ ස්වරූපය සිනමාවට ප්‍රථමයෙන් ම ඇතුළු කළේ ද ඇය යි. ඉතා ම කුඩා අවදියේ නැරඹූ 'රේබාව' සිනමාපටයේ අයිරාංගනී සේරසිංහ නිරූපණය කළ බිත්තර වෙළෙන්දියගේ චරිතය අද ද මා සිහිපත් කරන්නේ මෑතක නැරඹූ සිනමාපටයක චරිතයක් ලෙසින්. එතැන් පටන් හෙළ සිනමාව තුළ ඇය නිරූපණය කළ භූමිකාවල වූ විවිධත්වය සහ ඇය ඒ ඒ චරිතවලට ජීවය දුන් ආකාරය දේශීය සිනමා වංශකතාවේ පමණක් නොවෙ යි විශ්ව රංගන ඉතිහාසයේත් සටහන් වන්නේ නොමැකෙන අයුරින්.

රවීන්ද්‍ර රන්දෙනිය
ප්‍රවීණ රංගධර

ඇය වරෙක මට ගුරුවරියක ද වූ වග මා විශේෂයෙන් සඳහන් කළ යුතු යි. මා ලයනල් වෙන්ඩ්ට් රංග ශිල්ප ශාලිකාවේ රංගනය හදෑරූ අවධියේ ඇය අපට කටහඬ හැසිරවීම සම්බන්ධයෙන් බොහෝ දේ කියා දුන්නා.

'සාගරයක් මැද' සිනමාපටයේ පරම්පරා කුල ගර්වයෙන් හිස උදුම්මාගත් වයස්ගත රදළ කාන්තාවකගේ ස්වරූපය ඇය විසින් නිරූපණය කරන්නේ ද විශිෂ්ට අන්දමින්. රිදී තිරයේ මෙන් ම පුංචි තිරයේ ද ඇය ඉදිරිපත් කළේ ප්‍රශස්ත සේ ම ප්‍රශංසනීය රංගනයක්. 'දූදරුවෝ ' වැනි ටෙලිවෘත්තාන්තවල දරිද්‍රතාවෙන් ම නොපෙළුණ ද පහළ මධ්‍යම පාංතික පවුලක සියල්ල දරා සිටින කාන්තාවක ලෙස ඇගේ චරිත නිරූපණය අතිවිශිෂ්ට යි. මා ඇය සලකන්නේ දේශීය සිනමාවේ අග්‍රගණ්‍ය රංගන ශිල්පිනියක වශයෙන්. ඇගේ චරිත නිරූපණයේ නිරන්තරයෙන් හඳුනාගත හැකි සුවිශේෂත්වය වන්නේ චරිතයේ ස්වරූපය කුමක් වුණත් ඇය එම චරිතය අප අතර ජීවත් වන සජීවී චරිතයක් තරමට අපට සමීප කරවීම යි. චරිතය කවරක් වුවත් ප්‍රේක්ෂක හදවත අභ්‍යන්තරයට ඇය පිවිසෙන්නේ සජීවී රූපකායක් ලෙසින්. තාත්විකත්වයට ඒ තරමට ම සමීප වීමේ හැකියාව රංගන ශිල්පිනියකට හෝ ශිල්පියකුට ලැබෙන විශාල භාග්‍යක් ලෙස යි මා සලකන්නේ. 1956 සිට අද දක්වා ම ක්‍රියාකාරී ව රංගනයේ නියැළෙන අයිරාංගනී සේරසිංහ ප්‍රේක්ෂක හද

'රන්සළු' වැනි සිනමාපටවල ඇය ජීවය දුන් ඉහළ මධ්‍යම පාංතික කුල කාන්තාවකගේ චරිතය සේ ම

සන්තානයේ හැම විට ම ඉහළ තලයක ඔසවා තැබුවේ ඇගේ විශිෂ්ට රංග ප්‍රතිභාව යි.

ඇය වරෙක මට ගුරුවරියක ද වූ වග මා විශේෂයෙන් සඳහන් කළ යුතු යි. මා ලයනල් වෙන්ඩ්ට් රංග ශිල්ප ශාලිකාවේ රංගනය හදෑරූ අවධියේ ඇය අපට කටහඬ හැසිරවීම සම්බන්ධයෙන් බොහෝ දේ කියා දුන්නා. රංගන ශිල්පියකුගේ කටහඬ හැසිරවීම, හඬ භාවිතය එහිදී විශේෂ යි. ඉතාමත් ම විද්‍යාත්මක පසුබිමක කටහඬ හැසිරවීම අපේ ගුරුතුමිය අතින් මැනවින් ඉටුවුණා. ගුරුවරියක වශයෙන් ඈ තුළ වූ ශ්‍රේෂ්ඨත්වය සහ යමක් පැහැදිලි ව අවබෝධ කරදීමට ඇය ගත් උත්සාහය විශිෂ්ට යි. රංගනය සඳහා තමන්ගේ කටහඬ භාවිතය පිළිබඳ එංගලන්තයේ 'ලන්ඩන් ඇකඩමි ඔෆ් ඩ්‍රාමා ඇන්ඩ් ස්පීච්' ආයතනයේ විශේෂ පාඨමාලාවක් හැදෑරූ ඇය රංගනයට සේ ම රංගනය ඉගැන්වීමට විශේෂ සුදුසුකම් ලබාසිටි කාන්තාවක්.

ඇය සිනමා රංගනයේ දී කිහිපවරක් ම මගේ මවගේ චරිතයට පණදුන් බව අමතක කළ නොහැකි යි. එසේ ම කිසිවකුත් නොසිතන අන්දමින් 'හිම කතර' සිනමාපටයේ ඇය මගේ භාර්යාව ලෙස චරිත නිරූපණයෙන් දායක වුණා. අතීතයේ දවසක ඇයත් මමත් චිත්‍රපට දෙකක චරිත නිරූපණ වෙනුවෙන් හොඳ ම නිළිය සහ හොඳ ම නළුවා සම්මාන දිනාගත්තේ එක ම වේදිකාවක. රංගන ශිල්පිනියක ලෙසින් ඇය ව ඉතාමත් සමීප ව ඇසුරු කිරීමට මා ලැබුවේ වටිනා අවස්ථාවක්. ඒ සමීප ඇසුර නිසා ඇය කෙරෙහි නිරන්තරයෙන් ම පැවති සහ දැනටත් දිනෙන් දින වර්ධනය වන ගෞරවයත් ඇය අපේ වෘත්තියේ සාමාජිකාවක් වීම පිළිබඳ දැනෙන අභිමානයත් සදා මා සිහිපත් කරන්නේ ගෞරවයෙන්. ඇය අපේ ශ්‍රේෂ්ඨතම රංගවේදිනිය බව යි මා අදහන්නේ.

කාංචනා සිරිවර්ධන

ඇය දැන සිටියා රංගනය තිබෙන්නේ විඥානයේ බව

යම් කිසි කලා කෘතියක් අවසන් වන්නේ සතුටකින් නම් එම කලා කෘතිය පවතින සමාජ ක්‍රමයට උදව් කිරීමට නැතිනම් එය යුක්තිසහගත කිරීමට උපකාරී වන බවත් යම් කලා කෘතියක් ශෝකයකින් කෙළවර වෙනවා නම් එය පවතින ක්‍රමය විවේචනය කරන බවත් Theodor Adorno නම් ජර්මානු විචාරකයා පවසා තිබෙනවා. මෙහිදී අයිරාංගනී සේරසිංහගේ රංග ප්‍රතිභාව තුළින් අප බොහෝ විට දකින්නේ ශෝකය මුසු රංගනයක් නිසා පවතින පහළ මධ්‍යම පාන්තික සමාජ රටාවට ගෙනෙන විවේචනයක් ඇගේ රඟපෑම තුළ ඉස්මතු වෙනවා. එහිදී ඇගේ තාත්වික රංගනය එයට ඉටු කරන සාධාරණත්වය වෙනත් රංග ශිල්පීන් තුළින් මතු වන්නේ නැහැ.

ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය සහ සිංහල රංග කලාවට බොහෝ විට

අවතීර්ණ වන්නේ පහළ මැද පන්තිය යි. එහෙත් අයිරාංගනී සේරසිංහ රංගනයට පිවිසෙන්නේ ඉහළ පන්තිය නියෝජනය කරමින්. ඇය ලබා ගත් අධ්‍යාපනය වගේ ම ඇගේ සමාජ පන්තියේ ශිෂ්ටත්වයත් ඇගේ සාර්ථක රංගනයට හේතුවක්. යම්කිසිවකු අවිඥානික ව යමක් ඉෂ්ට කර ගැනීමට වචන භාවිතා කිරීමෙනු යි ශිෂ්ටත්වයට පැමිණෙන්නේ. එහිදී වචනවල ආධිපත්‍යය වැඩි යි. මැද පන්තියේ ස්වභාවය එය යි. බොහෝ නළු නිළියන් එහිදී වචනවල අර්ථයට වඩා විනෝදයට යි මුල් තැන දෙන්නේ. එහෙත් අයිරාංගනී සේරසිංහ වචනයේ අර්ථයට මුල් තැන දෙන අතර විනෝදයට යි දෙවැනි තැන ලබා දෙන්නේ.

අයිරාංගනී සේරසිංහ රඟපෑම සම්බන්ධයෙන් ලබාගෙන තිබෙන විදෙස් පුහුණුව ඇයගේ රංගන ජීවිතයේ සාර්ථකත්වයට බලපාන ප්‍රධාන කාරණාවක්. තිර පිටපතට අනුව රඟපෑම වර්තමානයේ බොහෝ විට දැකි ය හැකි යි. එහෙත් රංගනය පිළිබඳ එවැනි විශේෂ හැදෑරීමක් කළ කෙනකුට පිටපතට භාවමය රංගනය එක් කළ හැකි යි. රංගන ශිල්පියකුගේ හෝ ශිල්පිනියකගේ කාර්යය වන්නේ පිටපතේ රංග ස්වභාවය මතු කරලීම යි. භාව උත්පාදනය ප්‍රේක්ෂකයන්ට අයිති කාර්යයක්. පුහුණුව මඟින් රංග ශිල්පියකුට භාව නිරූපණය දෘෂ්ටිමය වශයෙන් පෙන්විය හැකි අතර නරඹන්නාට එහි ආභාසය ලබමින් භාව චලනය සිදු කර ගත හැකි යි. අවසානයේ එම භාවය ඥානයෙන් කෙළවර කර ගැනීම යි සුවිශේෂ වන්නේ. කෙසේ වෙතත් දක්ෂ නිළියක් යනු යම්කිසි කෘතියක් මඟින් තමන්ගේ ප්‍රේක්ෂකයා වෙනසකට භාජනය කිරීම යි. එය ලැබෙන්නේ විධිමත් රංග අධ්‍යයනයකින් පමණ යි. මේ සම්බන්ධයෙන් ලංකාවේ ලලිත කලා පුහුණුව දියුණු මට්ටමක නොමැතිවීම කනගාටුවට කරුණක්.

සහජය පසුව යි හඳුනා ගැනෙන්නේ. එය ඉන්දියානු රස නිෂ්පත්තිය නැතහොත් සෞන්දර්යවේදයෙනු යි පැමිණෙන්නේ. එහෙත් රස නිෂ්පත්තියට වඩා නූතන කලා කෘතිවල සෞන්දර්යය (Esthetic) නැතහොත් වින්දනයට යි තැන ලැබෙන්නේ. සුචරිත ගම්ලත්ගේ සිට බොහෝ දෙනා මතු කළේ කලා කෘතියක සප්‍රයෝජනවත්භාවය සහ වින්දනය යි. දේශපාලන කියවීමක් කලා කෘතියකට කරනවා නම් දැන් තිබෙන්නේ නිර්වින්දනය කරන කලා කෘති (Anesthesia) යි. මේ නිසා

දීප්ති කුමාර ගුණරත්න
සිනමා විචාරක

සහජය මා සලකන්නේ සොබාවික උරුමයක් ලෙස නොව සංස්කෘතික නිර්මාණයක් ලෙස යි.

නාර් සිනමා කලාව 1940 දශකයේ දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ඇමරිකාවේ ප්‍රචලිත වූවක්. අඳුරු හෙවත් නිශාචර සිනමා කලාව යනුවෙන් හඳුන්වන මෙහි දක්නට ලැබෙන්නේ පවුල් අර්බුදය නැතිනම් පවුලේ බිඳ වැටීම භාවමය වශයෙන් නිරූපණය කිරීමක්. 'නිධානය', 'දෙලොවක් අතර', 'වැලි කතර' වැනි චිත්‍රපට බිහිවන්නේ මේ සිනමාවේ ආභාසය ලබමින්. මධ්‍යම පන්තිය ඝානරය කොට ගත් නාර් සිනමා කෘතිවල එලිසබෙත් ටේලර් වැනි බටහිර නිළියන්ගේ රංගන ආභාසය ද අයිරාංගනීට ලැබුණා.

ඇය කලාව වෙනුවෙන් කැප වූ කෙනෙක්. තමන්ට සීමා පනවා ගනිමිනු යි ඇය රංගනයෙහි නිරත වුණේ. අද පරපුරේ තිබෙන්නේ පරිභෝජන සංස්කෘතියක්. කිසිවක් පරිත්‍යාග කිරීමට කැමති නැහැ. ඔවුන් රංග මූලය ලෙස සලකන්නේ ඇඳුම්, පැළඳුම්, වාහන විලාසිතා සහ ශරීර අලංකරණය යි. එහෙත් අයිරාංගනී දැන සිටියා රංගනය තිබෙන්නේ විඥානයේ බව. එහෙත් ඇය මෙන් අනෙක් නිළියන් රංගනයේ ආභාසය උරුමයක් කොට ගන්නේ නැහැ. එහි වියැකී යාමකු යි දක්නට ලැබෙන්නේ.

ලෙස්ටර් වැනි අධ්‍යක්ෂවරු යටත් විජිත යුගයේ අධ්‍යාපනය මනාව හැදෑරූ අය. ඔවුන් ඇසුරේ කටයුතු කිරීමට අයිරාංගනී සේරසිංහට හැකිවීමත් ඇයගේ රංගන කෞෂලය දියුණුවීමට බලපෑවා. අද ඇය වැනි දක්ෂ නිළියන් බිහි නොවීමට ඍජු ව බලපාන්නේ එවැනි නිර්මාණකරුවන්ගේ අඩුව යි.

නූතන ධනවාදයට කලාව අවශ්‍ය නැහැ. එහෙත් කලාව පවතින ඇමරිකාව, එංගලන්තය වැනි ධනවත් රටවල මේ සඳහා ඉහළ වටිනාකමක් තිබෙනවා. මේ නිසා අවශ්‍ය වන්නේ සවිඥානික පාලකයන් බිහි කර ගනිමින් කලාවට පුනරුත්පත්තිය දීමට අපේක්ෂා කිරීම යි.

ලංකාවේ ලලිත කලා අධ්‍යාපනය විශ්වවිද්‍යාල මට්ටමින් විධිමත් කිරීම අවශ්‍ය යි. එම පාඨමාලා ඔස්සේ ශික්ෂණය ලබන විද්‍යාර්ථීන් බිහි විය යුතු යි. මෙරට ලලිත කලා ලෙස හඳුනා ගන්නේ උඩරට නැටුම්, පහත රට නැටුම්, කොහොඹ කංකාරිය ආදිය යි. එහෙත් නූතන මිනිසාගේ මනෝභාව විශ්ලේෂණය කිරීමට අවශ්‍ය න්‍යායයන් තිබෙනවා. මේ නිසා විදේශීය විද්වතුන්ගේ ද සහාය මත මේ ආයතන හා පාඨමාලා ප්‍රතිසංස්කරණ කිරීම අවශ්‍ය යි.

මාලා මල්කාන්ති පරණගමගේ

දැක ගන්න සොබාසිරි හිඳ යන්න හෙනරත්ගොඩ

එල්. ඩබ්ලිව්. ආරියරත්න

ඉංග්‍රීසි ජාතික සර් හෙන්රි වෝර්ඩ් ආණ්ඩුකාරතුමා විසින් කොළඹ - නුවර කන්ද උඩරට දුම්රිය මාර්ගය ආරම්භ කළේ 1853 අගෝස්තු මස 03 වැනි දින යි. මේ වසරේ අගෝස්තු මස 03 වැනි දිනට එයට වසර 166ක් සම්පූර්ණ වෙනවා.

මේ දුම්රිය මාර්ගයේ ඉදි වූ සෙසු ප්‍රධාන දුම්රිය ස්ථාන කිහිපයෙන් හෙනරත්ගොඩ දුම්රිය ස්ථානය ද ඉතා විශේෂිත යි. කොළඹ - නුවර ප්‍රධාන දුම්රිය මාර්ගය ඉදිකර නිමා වූයේ වසර හයකට පසු. එවකට හෙනරත්ගොඩ දුම්රිය ස්ථානය ද සාදා නිම කර තිබූයෙන් 1864 දෙසැම්බර් මස 27 වැනි දින පළමුවරට මේ මාර්ගයේ ධාවනය කළ දුම්රිය හෙනරත්ගොඩ දුම්රිය ස්ථානයේ ද නතර කරනවා. මේ අවස්ථාව හෙනරත්ගොඩ අවට ගම්වාසීන්ට විශ්මයජනක දර්ශනයක් වූවාට සැක නැහැ.

හෙනරත්ගොඩ උද්‍යානය පසුකාලීන ව නම් වූයේ හෙනරත්ගොඩ උද්හිද උද්‍යානය නමින්. හෙනරත්ගොඩ දුම්රිය ස්ථානය එද ස්ථාපිත කිරීම නිසා පසුකාලීන ව ගම්පහ නගරය ද ජනාකීර්ණ ප්‍රදේශයක් බවට යි පත් වුණේ. එද අද මෙන් මගී ප්‍රවාහන බස් සේවා නොවූයෙන් ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වූයේ දුම්රිය.

යුරෝපා පුනරුදයත් සමඟ යුරෝපා ජාතීන් වර්ෂ 1400 කාල වකවානුවේ සිට ක්‍රියා කළේ දේශ ගවේෂණය කරමින් ආගම ප්‍රචලිත කිරීමටත් කුළු බඩුවල වාණිජ බලය තහවුරු කර ගැනීමටත්.

පෘතුගීසි හා ලන්දේසි ජාතිකයන්ගෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණියේ බ්‍රිතාන්‍ය ජාතිකයන්. ඔවුන්ගේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු වූයේ වැවිලි ආර්ථිකයට ඒ හේතුවෙන් 1870 වසර පමණ වන විට ලංකාවේ ප්‍රධාන ධනෝපායන මාර්ගය වූයේ කෝපි. ඒ වන විට දිවයිනේ ආර්ථික කටයුතු සියල්ල ම කෝපි කර්මාන්තය මත යි රඳා පැවතියේ.

එහෙත් කඳුකර පාරවල් ඔස්සේ කොළඹට කෝපි ප්‍රවාහනය කිරීම දුෂ්කර වූවා සේ ම වියදම් අධික කාර්යයක් ද වුණා. එම නිසා ඉක්මන් හා ලාභදායි ආකාරයට කෝපි පටවා එවීමේ ක්‍රම අවශ්‍ය වුණා. යුරෝපයේ බොහෝ රටවල දුම්රිය පාරවල් සෑදීම ආරම්භ කර තිබූ නිසා ලංකාවේ ද දුම්රිය පාරක් සෑදීමේ අවශ්‍යතාව බ්‍රිතාන්‍ය පාලකයන්ට පෙන්වා දුන්නේ වැවිලිකරුවන් විසින්. ඒ උඩරට වතුකරයේ සිට අඩු මිලට කෝපි පටවා එවීමට දුම්රිය මාර්ගයක් නැති වුවහොත් කෝපි කර්මාන්තය පිරිහෙනු ඇතැ යි වැවිලි කරුවන් කල්පනා කළ නිසා. එම අවශ්‍යතාව සපුරා ගැනීමට වැවිලිකරුවන් උද්ඝෝෂණයක් කිරීමට යි කටයුතු කළේ.

මේ කරුණ මුල්කරගෙන ලංකාවේ ප්‍රථම වරට වාර්තා වන්නේ වැවිලි කරුවන්ගේ මේ උද්ඝෝෂණය යි. මේ හේතුවෙන් කොළඹ සිට මහනුවර දක්වා දුම්රිය පාරක් සෑදීමේ කර්මාන්තය පැවැරුණේ ඉංග්‍රීසි වෙළෙඳ සමාග මකට.

ඒ අනුව ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ගයක් තැනීමේ ඓතිහාසික අවස්ථාව සනිටුහන් වූයේ 1858 අගෝස්තු

මස 03 වැනි දින. ඒ, හෙන්රි වෝඩ් ආණ්ඩුකාරතුමා දුම්රිය පාර සෑදීමේ ප්‍රථම පස් පිඩැල්ල කැපීමත් සමඟ. එහෙත් 1861 වසරේදී එහි වැඩ නතර කරන ලද්දේ අවාසනාවන්ත ලෙස යි.

ඊට හේතුව වූයේ දුම්රිය පාර වෙනුවෙන් බලාපොරොත්තු වූ වියදමට වඩා තුන් ගුණයක් පමණ වියදම්වන බව පෙනී ගියෙන්. පසුව 1863 වසරේදී නැවත වැඩ ආරම්භ කළේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ම මේ කර්මාන්තය කළ යුතු යැයි තීරණය කළ නිසා. එම දුම්රිය මාර්ගයේ වැඩ නිමාකර ලංකාවේ ප්‍රථම වරට දුම්රියක් ධාවනය කරවන ලද්දේ 1864 දෙසැම්බර් 27 වැනිද. ලංකාවට පැමිණි බෙල්ජියමේ ඔටුන්න හිමි කුමාරයා වූ බ්‍රැබන්ට්හි ආදිපාදතුමා රැගත් මේ විශේෂ දුම්රිය ධාවනය වූයේ කොළඹ සිට අඹේපුස්ස දක්වා. 1867 දී කොළඹ සිට මහනුවර දක්වා දුම්රිය මාර්ගය සාද අවසන් වූ හෙයින් කොළඹ හා නුවර අතර දුම්රිය ගමනාගමනය ආරම්භ වුණා.

මේ වන විට ඝන කැලෑවක් ව පැවති ගම්පහ එළි පෙහෙළි කර එළිමහන් කිරීම 1815න් පසු ආරම්භ වූ බවට සාක්ෂි දරන්නේ යටත් විජිත සමයේ ලේඛන. ඒ ලංකාවේ ඉංග්‍රීසි ජාතික පස්වැනි ආණ්ඩුකාරවරයා වූ සර් එඩ්වඩ් බාන්ස් මහතාගේ කාලයේදී.

1825 දී කොළඹ- නුවර මහා මාර්ගය තැනීමේ කටයුතු ආරම්භ කිරීමේ අවස්ථාවේදී බාන්ස් ආණ්ඩුකාරවරයා ගම්පහට ද පැමිණි බව සඳහන් වෙනවා. එඩ්මඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගේ සමයේදී දැනට ගම්පහ නගරය පිහිටි ස්ථානයේ පැවැතියේ ඝන කැලෑවක් තුළින් වැටී තිබූ අඩිපාරවල්. ඒ මඟෙහි ලන්තෑරුම් සවිකරගත් බර කරත්ත මහනුවර සිට කොළඹ දක්වා කෝපි රැගෙන ගමන් කළ අතර කරත්තකරුවන් ගිමන් හැරීමට විවේක ගත් ස්ථානය වර්තමානයේ හැඳින්වෙන්නේ මිරිස්වත්ත නමින්.

දුම්රියෙන් ගමන් කළ ඉංග්‍රීසි ජාතිකයන්ට ගමන් විඩාව මඟහරවා ගැනීම පිණිස එකල භාවිතා කළේ හෙනරත්ගොඩ ප්‍රදේශය. ඒ හේතුවෙන් එහි වනෝද්‍යානයක් ඉදිකිරීමට පියවර ගත්තේ ඉංග්‍රීසි ජාතිකයන් විසින්. එහෙත් උයනේ සිරි නරඹා විඩාව සන්සිඳුවා ගැනීමට දුම්රියෙන් බැස වනෝද්‍යානය වෙත යාමට සිදු වුණා. දුම්රිය නැවතුම් ස්ථානයක් හෙනරත්ගොඩ ඉදිකිරීමට ඉංග්‍රීසි පාලකයන් ක්‍රියා කළේ එහි ප්‍රතිඵලයක් වශයෙන්. හෙනරත්ගොඩ දුම්රිය ස්ථානය ස්ථාපිත වන්නේ එලෙස යි.

හෙනරත්ගොඩ උද්‍යානය පසුකාලීන ව නම් වූයේ හෙනරත්ගොඩ උද්හිද උද්‍යානය නමින්. හෙනරත්ගොඩ දුම්රිය ස්ථානය එද ස්ථාපිත කිරීම නිසා පසුකාලීන ව ගම්පහ නගරය ද ජනාකීර්ණ ප්‍රදේශයක් බවට යි පත් වුණේ. එද අද මෙන් මගී ප්‍රවාහන බස් සේවා නොවූයෙන් ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වූයේ දුම්රිය.

පැරණි හෙනරත්ගොඩ දුම්රිය ස්ථානය පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානයක් වශයෙන් ගැසට් කර සංරක්ෂණය කරන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින්. මේ පෞරාණික ස්ථානයේ වටිනාකම් දැන කියා ගැනීමේ අයිතිය අනාගත පරපුරට හිමි යි.

ත්‍රස්තවාදය හා මාධ්‍ය භාවිතය සුළුකොට තකන්න බැහැ

ගැටුම් කළමනාකරණය නම් විශාල විෂය පථය තුළ ඇති එක් ක්ෂේත්‍රයක් ලෙස ත්‍රස්තවාදය සහ මාධ්‍ය හඳුනාගත හැකි යි. මෙහිදී වැඩි සැලකිල්ලක් දැක්විය යුත්තේ ත්‍රස්තවාදී ක්‍රියාවන් ආවරණය කිරීමේදී මාධ්‍යවේදීන් සන්නද්ධ විය යුතු ආකාරය පිළිබඳව යි.

ත්‍රස්තවාදීන්ට අවශ්‍ය වන්නේ සමාජය තුළ වියවුලක් ඇති කොට විනාශයක් සිදු කිරීමට යි. මේ නිසා විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ කටයුතු කරන මාධ්‍යවේදියකුට ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදීන්ගේ මාධ්‍ය භාවිතය පිළිබඳ තිබිය යුත්තේ නිවැරදි ආකල්පයක්. ත්‍රස්තවාදීන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ඉඩ නොදී මාධ්‍යකරණයේ යෙදිය හැක්කේ එවිට යි. මෙහිදී ත්‍රස්තවාදීන් සහ මාධ්‍ය අතර ඇති සම්බන්ධයත් ත්‍රස්තවාදීන් මාධ්‍ය භාවිත කරන ආකාරයත් මැනවින් වටහා ගත යුතු යි.

නූතන ත්‍රස්තවාදය සමඟ ප්‍රංශ විප්ලවයට ඇත්තේ පැහැදිලි සම්බන්ධයක්. ප්‍රංශ විප්ලව සමයේ විශාල පිරිසක් වෙත ළඟා විය හැකි ජනමාධ්‍ය පැවතුණේ නැහැ. පසු කලෙක සිදු වූ ජනමාධ්‍යයේ ප්‍රගමනයේදී අරාජිකවාදීන් ත්‍රස්තවාදය භාවිත කළ ආකාරයත් සමඟ යි නූතන ත්‍රස්තවාදය ක්‍රමානුකූලව ඉදිරියට පැමිණියේ.

1800 මුල් දශකයේ පැවතුණේ වාණිජ පුවත්පත්. ඒ පුවත්පත් පවත්වාගෙන ගියේ දැන්වීම්වලින් ලැබෙන ආදායමෙන්. ඒ කාලයේ ම දේශපාලන පක්ෂ විසින් ද පුවත්පත් පළ කළා. ඒවා දැන්වීම් මත යැපුණේ නැහැ. මුද්‍රණය කළේ දේශපාලන පක්ෂවලින් ලැබෙන අරමුදල්වලින්. ඒ පුවත්පත්වල සාකච්ඡා කළේ යම්කිසි පක්ෂයකට අදාළ දේශපාලන මතවාද ගැන. විශේෂයෙන් ම ඒවායේ පළ වුණේ රාජ්‍ය බලය එක් පුද්ගලයකු වටා කේන්ද්‍රගත වීමට විරුද්ධව ධනේෂ්වර පංතියේ ප්‍රජාතන්ත්‍රවාදී අදහස්. මේ සිදුවීම් සියල්ල විශාල විප්ලවයකට ලක්වුණේ රොටරි ප්‍රෙස් තාක්ෂණය සොයාගැනීමත් සමඟින්. එහි ආරම්භයත් සමඟ ම 'යෙලෝ ජර්නලිසම්' නමින් ජනමාධ්‍ය සම්ප්‍රදායක් ඇති වූයේ ඇමරිකාව මූලික කරගෙන.

යෙලෝ ජර්නලිසම්වලදී පුවත්පත් යැපුණේ දැන්වීම්වලින් හෝ දේශපාලන දර්ශන සමාජගත කිරීමෙන් හෝ නොවෙ යි. පුවත්පත් අයිතිකරුවන් වටහා ගත්තා පුවත්පත් විකිණීම මඟින් විශාල ආදායමක් ලැබිය හැකි බව. ඒ නිසා අපරාධ, යුද්ධ සහ ලිංගිකත්වය වැනි දේවල් විකුණන්න පටන් ගත්තා. පුවත්පත්වල බිය, කුතුහලය ඇති කරන පුවත් පළ වුණේ ලොකු අකුරෙන්. ඒවායින් ඇතැම් පුවත් අර්ධ සත්‍ය යි. යෙලෝ ජර්නලිසම්වල අරමුණ වුණේ වගකීමක් ඉටු කිරීම නොව අලෙවිය වැඩි කරගැනීම යි. මිනිසුන්ගේ හැඟීම්, ආවේග, කුතුහලය, භය, ආශාව පාවිච්චි කරමින් පුවත්පත් විශාල වශයෙන් අලෙවි වුණා. මෙය වර්තමානයේ ද දැකිය හැකි තත්ත්වයක්.

යෙලෝ ජර්නලිසම්වල ව්‍යාප්තියත් සමඟ ඉහළ ප්‍රවෘත්ති වටිනාකමක් ඇති ප්‍රවෘත්ති මාධ්‍ය විසින් අනිවාර්යෙන් පළ කරන බව පෙනීයෑමෙන් අරාජිකවාදීන් තේරුම් ගත්තේ යම්කිසි ප්‍රවෘත්ති වටිනාකමක් ඇති ක්‍රියාමාර්ගයක් ඇති කළහොත් මාධ්‍යට එය වාර්තා නොකර සිටිය නොහැකි බැවින් එවැනි සිද්ධියකින් ලැබෙන අවධානය භාවිත කර තමන්ගේ මතවාදය සමාජගත කළ හැකි බව යි. ඒ අනුව ඔවුන් සිදු කරන්නේ ජනමාධ්‍ය ආකර්ෂණය කරගැනීමට ප්‍රචණ්ඩත්වය පාවිච්චි කරමින් ඒ හරහා තමන්ගේ පණිවිඩය සමාජගත කිරීම.

නූතන ත්‍රස්තවාදයට මාධ්‍ය නැතිව පැවතිය නොහැකි යි. මාධ්‍ය ඉලක්ක කරගෙන යි ත්‍රස්වාදීන් ප්‍රචණ්ඩත්වය ඇති කරන්නේ. වින්දිතයකු ඉලක්ක කරමින් ජීවිත සහ දේපළ විනාශ කිරීමේදී ත්‍රස්තවාදියාගේ අවසාන අරමුණ සහ මූලික අරමුණ වන්නේ වින්දිතයාට වන හානිය පාවිච්චි කරමින් යම්කිසි ග්‍රාහක පිරිසකට පණිවිඩයක් දීම යි.

ත්‍රස්තවාදියා, වින්දිතයා හා ග්‍රාහකයා ත්‍රස්ත ප්‍රහාරයක ඉතා ම වැදගත් අංග තුනක්. ප්‍රචණ්ඩත්වය ඇති වූ තැනකට මාධ්‍ය ඇදෙන්නේ ප්‍රචණ්ඩත්වයට ඉහළ ප්‍රවෘත්ති වටිනාකමක් ඇති නිසා. අලෙවිය සඳහා ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති ප්‍රචණ්ඩත්වය අවශ්‍ය බැවින් ප්‍රචණ්ඩත්වය හරහා ත්‍රස්තවාදීන් මාධ්‍ය අවධානය දිනාගැනීමෙන් තම අරමුණ ඉෂ්ට කරගැනීමට කටයුතු කරනවා.

මෙහිදී ත්‍රස්තවාදීන්ට අවශ්‍ය වන්නේ ඉලක්කගත ග්‍රාහකයාගේ හැසිරීම වෙනස් කිරීම යි. ප්‍රචණ්ඩත්වය මඟින් හැසිරීම වෙනස් කළ හැකි යි බලකිරීමෙන්. ප්‍රචාරණයට හැකියාව තිබෙනවා පෙළඹවීමෙන් මිනිසුන්ගේ හැසිරීම වෙනස් කිරීමට. මේ අනුව ප්‍රචණ්ඩත්වය සහ ප්‍රචාරණය දෙක ම භාවිත කිරීමෙන් ත්‍රස්තවාදයෙන් බලාපොරොත්තු වන්නේ සමාජය මෙතෙක් කල් හැසිරුණු ආකාරය යම් ආකාරයකට වෙනස් කිරීම යි.

සාම්ප්‍රදායික මාධ්‍ය සහ නූතන මාධ්‍යයට අමතර ව ත්‍රස්තවාදීන් තම ප්‍රචාරණය සඳහා කටකතා, දේශන, කුඩා කණ්ඩායම් සඳහා සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම වැනි අවිධිමත් ප්‍රචාරණ උපක්‍රම ද භාවිත කරනවා. කෙසේ වෙතත් මාධ්‍ය, ත්‍රස්තවාදීන් භාවිත කරන එක මෙවලමක් පමණ යි.

අල්කයිඩා සංවිධානයේ නියෝජ්‍ය නායකයකු ව සිටි Ayman all - Zawahiri වරක් ප්‍රකාශ කර ඇත්තේ ''අප සටනක යෙදිලා ඉන්නෙ. ඒ සටනේ බාගයක් ම සිද්ධ වෙන්නේ මාධ්‍ය සටන් බිමේ...'' යනුවෙන්. මේ අනුව මාධ්‍යවේදීන්ට ඇත්තේ ත්‍රස්තවාදීන්ගේ උපකරණයක් බවට පත්වීමේ විශාල අවදානමක්.

බිල්ලාඩන් කියා සිටියේ "මේ සියවසේ මාධ්‍ය යුද්ධය ප්‍රචාරක අරගලය දිනාගැනීමේ ශක්තිමත් ම මාධ්‍ය යි. එහි අනුපාතය මූලික සටන් සූදානමින් 90%ක් දක්වා විය හැකි යි." යනුවෙන්. ත්‍රස්තවාදීන්ගේ ම දෘෂ්ටි කෝණයෙන් බලන විට ත්‍රස්තවාදය සම්බන්ධයෙන් මාධ්‍ය භාවිතය සුළුකොට තකන්නට බැහැ.

ත්‍රස්තවාදීන්ගේ ශක්තිය සහ බලාධිකාරියේ අවදානම් සහගත බව සහ නොහැකියාව පෙන්වීමත් රජයේ මර්දන තමන්ගේ වාසියට හරවා ගැනීමත් ත්‍රස්තවාදීන්ගේ සතුරන් අධෛර්ය කිරීම සහ ඔවුන්ට සහය දක්වන පිරිස්වල චිත්ත ධෛර්ය වර්ධනය කිරීමත් ත්‍රස්තවාදීන්ගේ අරමුණු වෙනවා. එසේ ම සංවිධානය වෙනුවෙන් ජනතා කැමැත්ත ලබාගැනීම සහ වර්ධනය කරගැනීමත් ජනතාව රැඩිකල්භාවයට පත් කිරීම සහ භීතිය, ව්‍යාකූලත්වය ඇතිවන ලෙස දේශපාලන වාතාවරණය බෙදීමකට ලක්කිරීමත් මෙන් ම වීරත්වය අවධාරණය කිරීම සහ ප්‍රචණ්ඩත්වය අත්‍යවශ්‍ය බව ඒත්තු ගැන්වීමත් ඊට අයත්.

එම අරමුණු ඉටුකර ගැනීමට ඔවුන් භාවිත කරන උපක්‍රම ලෙස මූලික ව හඳුනාගත හැක්කේ ප්‍රචණ්ඩ ක්‍රියාව ප්‍රවෘත්තිමය වටිනාකමක් මූලික කරගෙන සිදු කිරීම, සංවිධානයට තවත් පිරිස් බඳවා ගැනීමට ප්‍රචාරණ

දිනේෂ් දෙඩන්ගොඩ
ජනාධිපති ජ්‍යෙෂ්ඨ
මාධ්‍ය උපදේශක

සිදු කිරීම, ත්‍රස්තක්‍රියා සඳහා වඩාත් ම සුදුසු වේලාව සහ ස්ථානය තෝරාගැනීම, ප්‍රහාරයකට පසුව නිවේදන නිකුත් කරමින් උපක්‍රමික ලෙස තමන්ගේ අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් භාවිත කිරීම, මාධ්‍යවේදීන් සමඟ සබඳතා පැවැත්වීම, ත්‍රස්තක්‍රියා සම්බන්ධයෙන් වගකීම භාරගැනීම සහ විශාල වශයෙන් සංකේත භාවිතා කිරීම හරහා සන්නිවේදනය සිදු කිරීම යි.

ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා පළමුවෙන් ම ත්‍රස්තවාදීන්ට ඒත්තු ගැන්විය යුතු යි ඔවුන්ට ජයග්‍රහණය කළ නොහැකි බව. දෙවැනි ව ඔවුන්ට ලබාදිය යුතු යි දිගින් දිගට ම ප්‍රහාර එල්ල කිරීමට ඔවුන් සතු මානව සම්පත් සහ භෞතික සම්පත් ප්‍රමාණවත් නැතැ යි යන අදහස. ඒ, ප්‍රතිත්‍රස්ත ව්‍යාපාරයකදී නිර්මාණය කළ යුතු මානසික අරමුණු යි. කෙසේ වෙතත් පාස්කු ප්‍රහාරයෙන් පසු ව අල්බග්ඩාඩි නිකුත් කළ වීඩියෝව මෙරට මාධ්‍ය මඟින් ප්‍රචාරය නොකිරීම සතුටට කරුණක්. අල් බග්ඩාඩි එම වීඩියෝවේ කියා සිටින්නේ ''අල්ලා දෙවියන් අපට කිව්වෙ ජිහාඩ් යුද්ධය ක්‍රියාත්මක කරන්න යි. එය ජයග්‍රහණය කරන්න කියලා කිව්වෙ නැහැ.'' යනුවෙන්. එමඟින් ඔහු ඉවත් කරදැමීමට උත්සාහ ගන්නේ පෙර කී පළමු මානසික අරමුණ යි.

ප්‍රතිත්‍රස්ත ව්‍යාපාරයකදී එම ත්‍රස්තවාදය නියෝජනය කරන ජන කොට්ඨාසයට ආණ්ඩුවෙන් සිදු වන සත්‍ය හෝ කල්පිත හෝ අසාධාරණය දේශපාලන, සමාජ සහ සංස්කෘතිය පිළිබඳ ගැටලු මතු කිරීමට හේතුවක් වන බව විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු යි. කෙසේ වෙතත් ත්‍රස්තවාදය මර්දනයේදී මාධ්‍යයට යම් සීමාවක් දක්වා පමණ යි ක්‍රියාත්මක විය හැක්කේ. ත්‍රස්ත සංවිධානයේ පැවැත්ම සහ විනාශය පිළිබඳ විශාල ම වගකීම ඇත්තේ ආණ්ඩුවට. මේ අතර මාධ්‍ය වගකීමක් නැතුව හැසිරෙන බවට දොස් නඟමින් මාධ්‍ය වාරණය ගැන ද කතාබහක් ඇති වුණා. ත්‍රස්තවාදී ව්‍යාපාරයක් පැවතියදී මාධ්‍ය සම්බන්ධයෙන් අනුගමනය කළ හැකි පිළිවෙත් තුනක් හඳුනාගන්න පුළුවන්. ඒ, මාධ්‍යට අවැසි ලෙස කටයුතු කිරීමට ඉඩහැරීම, වාරණ පැනවීම සහ තමන්ගේ වගකීම පිළිබඳ ව අවබෝධයෙන් ස්වයං වාරණයක් ඇති කරගැනීමට ජනමාධ්‍යවේදීන් ව පෙළඹවීම යි.

ජෙරී ඇඩම්ස් කියා සිටියේ "මාධ්‍ය, ත්‍රස්තවාදීන්ට ඔක්සිජන් සැපයූවත් වාරණය විෂ මත්ද්‍රව්‍යයක බලපෑම ආණ්ඩුවට සපයනවා" යනුවෙන්. මාධ්‍ය වාරණය සැබවින් ම විෂ මත්ද්‍රව්‍යයක්. එනිසා සිදු කළ යුත්තේ සාකච්ඡා සහ වැඩමුළු හරහා ත්‍රස්තවාදයට මුහුණදීමේදී මාධ්‍යවේදියාගේ වගකීම කුමක්ද යන්න පිළිබඳ නිසි අවබෝධයක් ඔවුන්ට ලබාදීම යි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවති මාධ්‍ය සම්මන්ත්‍රණයක් ඇසුරින්.

කාංචනා සිරිවර්ධන



ස්ත්‍රී අධ්‍යාත්මයට එබුණු ස්ත්‍රිය

සුභා රත්නායක
බාහිර කථිකාචාර්ය (හින්දි)
මොරටුව විශ්වවිද්‍යාල

රුසියන් භාෂාව යැයි කියූ පමණින් සාහිත්‍යය අප සිහියට නැගුණ ද හින්දී කියූ විගස අප මතකයට නැගෙන්නේ හින්දී ගීත සහ චිත්‍රපට යි. ඒ තරමට හින්දී සිනමාව පොදු කලාවක් සහ විනෝදයක් බවට ලෝකය පුරා පත්ව තිබෙනවා. හින්දී සිනමාව තරමට හින්දී සාහිත්‍යය ලෝකය වැළඳ නොගත්තත් එය විවිධ සාහිත්‍ය ධාරා ඔස්සේ වැඩෙමින් පැතිරෙමින් සමාජ, ආර්ථික, සංස්කෘතික මෙන්ම දේශපාලනික පසුබිම් හා ගැටුණා. එමෙන් ම විවිධ දෘෂ්ටිවාද ඔස්සේ ගමන් කරමින් නව ප්‍රවණතා සකසා ගනිමින් ලෝකයට පුළුල් දර්ශනයක් දායාද කළ විපුල සාහිත්‍යයක්.

හින්දී සාහිත්‍යයේ නූතන යුගයේ මුදුනින්ම සිටින සාහිත්‍යධාරිනියක වන ඌෂා ප්‍රියන්වදා ස්ත්‍රී ආත්මය, ස්ත්‍රියගේ පැවැත්ම සහ ස්ත්‍රියගේ සමාජ භාවිතය සුක්ෂම සහ සංවේදී ලෙස විදාරණය කිරීමට උත්සාහ ගත් කලාකාරිනියක් ලෙස යි වඩාත් කැපී පෙනෙන්නේ. ඌෂා ප්‍රියන්වදා සහ ඇගේ කෙටිකතාව පිළිබඳ කුඩා සිතුවමක් මතු කරගැනීමට යි මේ ඇරඹුම.

ඉන්දියාවට නිදහස උදා වීමෙන් පසු ඇරඹෙන නව කෙටිකතා ව්‍යාපාරය හඳුන්වන්නේ 'නයී කහානි' ලෙස යි. එම සාහිත්‍ය සම්ප්‍රදායට නව මුහුණුවරක් ලබාදීමේදී 'ඌෂා ප්‍රියන්වදා' ගේ භූමිකාව අද්විතීය යි. හින්දී සාහිත්‍යයේ විශේෂ ධාරාවක් වන ප්‍රවාසී සාහිත්‍යයේ ද (විදෙස් රටක පුරවැසිභාවය ලැබූ ඉන්දියානුවන් විසින් එම රටවල සිට හින්දි බසින් ලියන ලද සාහිත්‍යය ප්‍රවාසී සාහිත්‍ය යි.) ප්‍රමුඛ පුරුකක් වන ඇය තම නිර්මාණශීලි ලේඛනය සමාජගත කරන්නේ කෙටිකතාව හා නවකතාව ඔස්සේ යි. ඉන් වඩාත් කැපී පෙනෙන්නේ කෙටිකතාව යි.

නූතන හින්දී කෙටිකතාව ආකෘතිකමය වශයෙන් මෙන්ම භාවමය වශයෙන් ද වෙනසකට භාජනය කිරීමට ඌෂා සමත් වුණා. නව කෙටිකතා ධාරාව තුළ ඇගේ කෙටිකතාව මඟහැර යා නොහැකි වන්නේ ඒ හේතුවෙන්.

ඌෂා ප්‍රියන්වදාගේ සාහිත්‍යය මුල් අවධිය සහ පසු අවධිය ලෙස කොටස් දෙකකින් යුතුව ඇගයීමටත් විමර්ශනයටත් ලක් කළ හැකි යි. තම මව් රටේ වෙසෙමින් තමා ජීවත් වූ පරිසරය පසුබිම් කරගනිමින් ලියූ කෙටිකතා ඇගේ මුල් යුගයේ කෙටිකතා ගොන්නට අයත්. ද්විත්ව පුරවැසිභාවය ලබමින් ඇමරිකාවේ වෙසෙමින් ඇය ලියූ කෙටිකතා අයත් වන්නේ පසු යුගයට.

ඉන්දියානු සංස්කෘතිය තුළ ස්ත්‍රියක් වීම නිසා ම ගැහැනිය මුහුණ දෙන අභියෝග, අවහිරකම් සහ පීඩාව නිරූපණය කිරීමට ඇගේ මුල්කාලීන කෙටිකතාවේ වැඩි අවකාශයක් වෙන්වෙනවා. මේ ඊට උදාහරණ සපයන ඇගේ මුල්කාලීන කෙටිතාවකින් කොටසක්.

"තාත්තා මාව ගිහින් දැම්මා ඉස්පිරිතාලෙට..... මට දරුවෙකුත් හම්බවුණා. එයා පුතෙක්. දරුවව අනාථ නිවාසෙට භාර දුන්නට පස්සේ අවුරුද්දක් යනකම් මට ඉගෙන ගන්න සල්ලි දුන්නේ තාත්තා. ඒත් ගෙදර ඉඳන් නෙවේ. ගෙදර මිනිස්සුන්ට තාමත් මම මැරිච්ච කෙනෙක්. එදා ඉඳන් මම හැමෝගෙන්ම වහන් වෙවී ජීවත් වෙනවා. දරුවා යශ් වගේමයි. ජීවත් වෙලා ඉන්නවා නම් දැන් අවුරුදු හය හමාරක් වෙලා ඇති." නිරායාසයෙන්ම ගලා යමින් තිබූ කඳුළු ඇය පිස නොදැමුවා ය. (විසිරුණු කැබලි ළා දල්ලක් - ඌෂා ප්‍රියන්වදා)

ඌෂා ප්‍රියන්වදා

ඇමරිකාවේ ජීවත්වෙමින් පරිණත ගැහැනියක් ලෙස ජීවිතයට මුහුණදෙන විට ඇය අත්විඳි සැබෑම අත්දැකීම් ස්වකීය නිර්මාණකරණය උස්-මහත් කරගැනීමට ඇයට උපකාරී වෙනවා. ඌෂාගේ ජීවන දෘෂ්ටිය පෙර තිබූ පටු සීමාව අතික්‍රමණය කර පෘථුල සීමාවකට සේන්දු වන්නේ එතැනදී.

ඌෂා ප්‍රියන්වදා උපන්නේ ඉන්දියාවේ උත්තර ප්‍රදේශ් ප්‍රාන්තයේ කාන්පූර් නගරයේ මධ්‍යම පාංතික පවුලක. ඒ 1930 දෙසැම්බර් 24 වැනි දා යි. ඇගේ පියා දේශපාලනයට සම්බන්ධ, උගත්, ඉඩම් හිමි පවුලක වැඩිමලා. පොත පත ඇසුර සහ සාමාන්‍ය ගැහැනු දරුවකුට වඩා වෙනස්ව සිතීමේ පුරුද්ද සහ හැකියාව ඇයට ලැබෙන්නේ පිය උරුමයෙන්. පියාගේ හදිසි අභාවය නිසා යම් යම් ආර්ථික අපහසුතාවලට මුහුණ දෙන්න ඇයට සිදුවෙනවා. එහෙත් ඇයට වඩාත් දුෂ්කර වූයේ ගැහැනු දරුවකු වීම නිසා ම සමාජ සංස්කෘතික පටු රාමුව තුළ සිරවීමට සිදුවීම යි. උසස් අධ්‍යාපනය ලැබීමට ඇය දුටු සිහිනය, නව මං පෙත් ඔස්සේ ජීවිතය දිගහැරවීමට තිබූ ලාලසාව සපුරා ගැනීමට ඇයට පළමුව අරගලයක යෙදෙන්නට සිදු වූයේ පවුල තුළින්ම යි.

ඉලහාබාද් විශ්වවිද්‍යාලය, ශාස්ත්‍රීයව මෙන්ම දෘෂ්ටිමය වශයෙන් ද ඌෂාව සන්නද්ධ කළ තෝතැන්න යි. ඉලහාබාද් ගිය ඌෂාට දැනුණේ ටැංකියක සිරවී සිටි මාළුවකු, ගඟකට දැමීමට පසු ඇතිවන හැඟීම යි. නූතන හින්දී සාහිත්‍යයේ විශිෂ්ට බලකනු ඇසුරු කිරීමට ඇයට අවස්ථාව උදාවන්නේ එහිදී යි. තම කෙටිකතා සංග්‍රහයක පෙරවදනේදී ඇය මෙහෙම ලියනවා.

"ඉලහාබාද්වල සෑම සවස්වරුවක්ම මා ගත කළේ හරි වංශ්‍රායි බච්චන්, සුමිත්‍රානන්දන් පන්ත්, ධර්මවීර් භාරතී වැනි විශිෂ්ටයන් සමඟ. නව විෂයන්, නව සංකල්ප, අලුත් පොත්පත් මා වටකරගත්තා. මා මානසික ව පැසුණු පුද්ගලයකු බවට පරිවර්තනය වුණා. මගේ චින්තනය නව දෘෂ්ටියකින් ආලෝකමත් වුණා. මගේ පළමු කෙටිකතාව බිහිවන්නේ එහි ප්‍රතිඵලයකින්."

ඉලහාබාද් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි ආචාර්යවරියක වශයෙන් සේවයට එක්වීමෙන් පසු ඇය ඇමරිකාව බලා පිටත්වන්නේ පශ්චාද් අධ්‍යාපන කටයුතු සඳහා හිමිකරගත් ශිෂ්‍යත්වයකින්. 1965 දී ඌෂා ඇමරිකාවේ විස්කාංසීන් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු අධ්‍යයන අංශයේ, ඉන්දියානු සාහිත්‍යය පිළිබඳ මහාචාර්යවරියක ලෙස වැඩ ආරම්භ කරනවා. ඌෂාගේ ඉදිරි ජීවිතය ම ගෙවෙන්නේ ලොව බලවත්ම රාජ්‍යයේ යි. එහෙත් ඇගේ හස්තයෙන් නිමුවුණු සෑම සාහිත්‍ය කටයුත්තකම මාධ්‍යය වූයේ ඇගේ මව්බස. එනම් හින්දී භාෂාව.

ඇමරිකාවේ පදිංචි වූ විගස ම හින්දී කෙටිකතා සංග්‍රහ දෙකක් පළ කළත් පාඨක-විචාරක යන දෙපර්ශ්වයේ ම සමාගමත් සම්භාවනාවත් අහිමිවීම හේතුවෙන් ඇය අකර්මණ්‍ය වෙනවා. නව සංස්කෘතික ජීවිතයට පිවිසීම, නව සමාජ සම්බන්ධතාවලට ආකර්ෂණය වීම, ආර්ථික ස්වාධීනත්වය සහ ඇමරිකාවේදී ඇය අත්විඳි අසීමිත නිදහස නිසා ඇගේ හස්තයෙන් ලේඛන කලාව ටිකින් ටික ගිළිහී යනවා. ඇය ම පවසන විලස, "ලේඛිකාවක ලෙස මා යටපත් වූ සෑම අවස්ථාවක ම මම සිත සනසාගත්තේ සාහිත්‍යයට වඩා ජීවිතයේ අංශුමාත්‍රය ද වටින්නේ ය යන තාගෝර්ගේ කියමන සිහිකරගනිමින්."

භාවමය ප්‍රබන්ධ අතරේ පැටලී තිබූ ඌෂාගේ කෙටිකතා සාහිත්‍යය, ක්‍රමයෙන් නිශ්චිත සන්ධිස්ථානයකට රැගෙන එන්නේ ඇමරිකාවේ ගෙවූ ජීවිතය තුළ ඇය ලැබූ අත්දැකීම් සහ ඒ ඔස්සේ උස් මහත් වූ ඇගේ චින්තනය යි. ඌෂාගේ මුල්කාලීන කෙටිකතාවේ කේන්ද්‍ර බිංදුව වූයේ ස්ත්‍රියට එල්ලවූ සමාජ සහ සංස්කෘතික විරෝධය යි. පසුකාලීන ඇගේ කෙටිකතාව ද ස්ත්‍රිය වටා එතී තිබුණත් එහි ස්ත්‍රී චරිතවල ස්වභාවය සහ ස්ත්‍රී ආත්මය විග්‍රහ කිරීම, පෙරට වඩා හාත්පසින්ම වෙනස් මුහුණවරක් ගන්නවා. මිනිස් ජීවිතවලට කඩා වැදුණු

ධනවාදය විසින් මිනිසාට උරුම කළ උදාසීනත්වය, හුදකලාව, තරඟ කාරිත්වය, ආත්මීය සම්බන්ධතාවල දියාරු බව අතරේ ස්ත්‍රී ආත්මයේ ප්‍රවේශය මනෝවිශ්ලේෂණාත්මකව නිරූපණය කිරීමේදී ඇය දැක්වූ යථාර්ථාවබෝධය හා පරිපූර්ණ නිර්මාණවේශය ප්‍රශංසනීය යි. ඇගේ පසුකාලීන කෙටිකතාවල 'ස්ත්‍රියගේ මුහුණුවර' සළු පොටට මුවාවී කදුළු සඟවන සාම්ප්‍රදායික සිතුවමට හාත්පසින්ම වෙනස්. ඒ වෙනුවට අපට හමුවන්නේ ඉන්දියානු සංස්කෘතික සෙවණැල්ලට සම්පූර්ණ ලෙස යට නොවුණු, ආර්ථික වශයෙන් ස්වාධීන, ඉංග්‍රීසි උගත්, මත්පැන් පානය සම්භාව්‍ය ජීවන විලාසයක් බවට පත්කරගත්, 'විවාහය' ජීවිතයේ සිදුවූ අත්වැරදීමක් යැයි සිතන, දරුවකු බිහිකිරීම ජීව විද්‍යාත්මක සංසිද්ධියක් පමණක් යැයි විශ්වාස කරන, විවාහයෙන් පසු ද විකල්ප ප්‍රේම සහ ලිංගික සබඳතාවලට පිවිසෙන නූතන හිස්ටරික ගැහැණු චරිත. 'කිරන්' ඌෂා ප්‍රියංවදාගේ පසුකාලීන කෙටිකතාවක කතා නායිකාව යි. විශ්වවිද්‍යාල ආචාර්යවරියක් වන කිරන් ඇමරිකාවේ වෙසෙන දෙදරු මවක්. ඉන්දියානු සැමියකුගේ පතිනියක්. එහෙත් සුදු ජාතික මැක්ස් නම් මහාචාර්යවරයා සමඟ විකල්ප ලිංගික සබඳතාවකට පිවිසෙන ඇය, ඌෂාගේ මුල්කාලීන කෙටිකතාවල අපට හමුවන ඉන්දියානු ස්ත්‍රියට අභියෝග කරන කුටුම්භය සහ සමාජය දෙස රැඩිකල් අදහස් දරන නූතන ගැහැනියක් ලෙස යි ඉස්මතුවන්නේ. කිරන්ගේ චිත්තවේග ඌෂා මෙහෙම අකුරු කරනවා.

"එය කුමන හැඟීමක්දැ යි හරිහැටි වටහා ගන්නට කිරන්ට නොහැකිවිය. පළමුව එය ගැඹුරු නිරාශාජනක හැඟීමකි. මැක්ස්ගේ ස්පර්ශය අහිමිවීමෙන් කීපදිනක සිට ඇගේ සිරුර දැවෙමින් තිබුණේය. ආපසු එන ගමන පුරා ඇය සිතමින් සිටියේ එළඹෙන්නට නියමිත හෝරාවකදී මැක්ස්ගෙන් හිමිවන ඒ මිහිරි පහස ගැන පමණි. එවිට ඇගේ දෙතොල් මඳක් විවර වී හීන් හිනාවකින් ඔප වැටෙන්නට විය. නිවසට ළංවෙත් ම

"මැක්ස්ගේ ස්පර්ශය අහිමිවීමෙන් කීපදිනක සිට ඇගේ සිරුර දැවෙමින් තිබුණේය. ආපසු එන ගමන පුරා ඇය සිතමින් සිටියේ එළඹෙන්නට නියමිත හෝරාවකදී මැක්ස්ගෙන් හිමිවන ඒ මිහිරි පහස ගැන පමණි."

පොපියන ආශාවකින් ඇය තව තවත් පිරිපුන්ව ගියාය."

(කොච්චර ලොකු බොරුවක්ද? : ඌෂා ප්‍රියන්වදා)

ඌෂාගේ සෑම කෙටිකතාවකම කේන්ද්‍රය ස්ත්‍රිය යි. එහෙත් ස්ත්‍රිය මුහුණ දෙන ගැටලුවලට සහ ඇගේ අසහනයට හේතුව හුදෙක් පිරිමියා බව හුවා දක්වමින් පිරිමි සංහතියට එරෙහිව ගැහැනිය ඔසවන ස්ත්‍රීවාදිනියක් ලෙස 'ඌෂා ප්‍රියන්වදා' අපට කිසිවිටකත් හමුවන්නේ නැහැ. සමාජ පරිවර්තන බොහෝමයක් සිදු වූ ආධුනික යුගයේ ස්ත්‍රියත්, පුරුෂයාත් දෙදෙනාම පොදුවේ විඳවීමකට ලක්ව සිටින බව ඇය විශ්වාස කළා. එය සාමූහික ලෙස සමාජයක් අත්විඳින විඳවීමක්. මේ හෙළිදරව්ව ඇගේ පසුකාලීන කෙටිකතා තුළින් මතුවී ආවේ විශ්වසනීය ලේඛන හරඹයක් ඔස්සේ. ස්ත්‍රිය වෙනුවෙන් පෙනී සිටිමේදී හෝ ස්ත්‍රිය යනු කවරෙක්දැ යි හඳුන්වාදීමේදී හෝ ඌෂා ස්ත්‍රීවාදිනියක නොවීම පසුකාලීන හින්දි ලේඛිකාවන්ට ඇය ලබාදුන් මහා ආදර්ශයක්.

ඌෂාගේ කෙටිකතාවල භාෂාව සුවිශේෂි යි. ඇය තම සාහිත්‍යයට යොදා ගත් සුමට, සුලලිත, භාවාත්මක, සරල බස පාඨකයාගේ බුද්ධි මණ්ඩලය විකසිත කිරීමට වඩා, සමත්වූයේ ඔවුන්ගේ සිත සංවේදී ව කැළඹවීමට යි. ඌෂා ජීවිතයේ වැඩි ඉඩක් ගතකළේ මහාචාර්යවරියක ලෙස විශ්වවිද්‍යාලවල යි. විශ්වවිද්‍යාල ශාස්ත්‍රීය වටපිටාව සහ එහි ස්වභාවය ඇගේ පසුකාලීන කෙටිකතාවල විශාල රූපපෙළක් අත්පත් කරගන්නේ ඒ හේතුවෙන්. නවකතා හයකින්, කෙටිකතා දෙසීයකට ආසන්න ප්‍රමාණයකින් හින්දී සාහිත්‍යය ගර්භය සශ්‍රීක කළ ඌෂා තම නිර්භීත සාහිත්‍යය සේවය වෙනුවෙන් 2007 වසරේදී 'පද්ම භූෂණ' සම්මානයට ද උරුමකම් ලැබුවා.

ඌෂාගේ පෞද්ගලික ජීවිතයත් නිර්මාණකරණයත් වෙන්කළ නොහැකි යි. සිය සාහිත්‍ය සහ පෞද්ගලික ජීවිතය අරඹයා ඌෂා තම කෘතියක පෙරවදනෙහි මෙසේ කුරුටු ගෑ තැබුවා. ''මගේ ජීවිතය සැබැවින්ම එක්තරා කෘතියකි. මා ජීවිතය පුරා රැස් කළ ධනයක් වේ නම් ඒ, එම කෘතියේ අන්තර්ගතය යි. එහි යම් යම් තැන් කෙනකුට මා තුළින් පැහැදිලිව දැකගත හැකි අතර ඇතැම් දේ කෙසේවත් දැක ගත නොහැකි ලෙස සැඟවී තිබේ."

ඌෂා ප්‍රියන්වදාගේ කෙටිකතා සාහිත්‍යයට පාඨකයා වහ වහා ආකර්ෂණය වන්නේ එහි ඇති පොදු මිනිස්භාවයට යි. මිනිසා පිටින් ජේන තරමට ශීලාචාර හෝ ශුද්ධ හෝ නොවෙන්නා සේ ම සැහැසි හෝ මිලේච්ඡ හෝ නොවන බව ඌෂාගේ කෙටිකතාවලින් නික්මෙන බලවත්ම සංදේශය යි. මිනිස් ඇතුළු හදට ඒ තරම් එබිකම් කිරීමක් කළ ලේඛිකාවක් හින්දී සාහිත්‍යයේ ඌෂාට පෙර අපට හමුවන්නේ නැහැ. හොඳ වුණත් නරක වුණත් ඇගේ කෙටිකතාවල සිටින්නේ මිනිසුන්ම යි. රළු වුණත්, මෘදු වුණත් ගඳ වුණත් සුවඳ වුණත් ඇගේ කෙටිකතාව දිග හැරෙන්නේ ඒ මිනිසුන්ගේ ජීවිත ඔස්සේ යි. ඌෂාගේ සමස්ත කෙටිකතා සාහිත්‍යය මිනිස් ජීවිතයත් මිනිස් චර්යා පිළිබඳවත් ගැඹුරු දැක්මකට ප්‍රවිශ්ටවීමට විවෘත කළ කවුළුවක් වැනි යි.

සංසාරේ දඩයක්කාරයා

තුසිත ජයසුන්දර

ගෙවුණු සමයේදී ලාංකේය නිර්මාණ සාහිත්‍යය සේ ම සාහිත්‍ය විචාරය ද සමතික්‍රමණයට බට ප්‍රමුඛයකු සේ සයිමන් නවගත්තේගම හඳුනා ගන්නට පුළුවන්. දෘශ්‍යමාන ව නම් විටෙක දුරවබෝධ එහෙත් ඇතුළතින් අතිශය සමීප තේමා හා චරිත ඔස්සේ ජීවිතය ද සමාජය ද කියවනු පිණිස ඔහු උත්සුක වූයේ නිර්භය, නව්‍ය හා විකල්ප පිළිවෙත් සමඟ.

සයිමන් නවගත්තේගම ලියූ මුල් පෙළේ නවකතා හා කෙටිකතා අවස්ථා ත්‍රිත්වයකදී සිනමාවට නැගී තිබෙනවා. ඒ, වර්තමාන අවස්ථා හා අතීත අවස්ථා ද්ත්වයක් වශයෙන්. අතීත අවස්ථා ලාංකේය සිනමාවේ සිහිවටන. ඉන් පළමුවැන්න වන 'සුද්දිලාගේ කතාව' (1985) සිනමාපටය සැලකෙන්නේ එහි අධ්‍යක්ෂ ධර්මසිරි බණ්ඩාරනායකගේ සිනමා භාවිතයේ වර්ධනීය අවස්ථාවක් ලෙසින්. දෙවැන්න වන සුමිත්‍රා පීරිස් අධ්‍යක්ෂණය කළ 'සාගර ජලය මදි හැඬුවා ඔබ සන්දැ' (1988) සිනමාපටයට පාදක වන්නේ එනමින් යුතු කෙටිකතා සංග්‍රහයේ එන 'ඔහු මළ පසු' නමැති කෙටිකතාව.

සයිමන් නවගත්තේගම අභිනව සිනමා පිවිසුම සහතික කරලන්නේ වර්තමාන ලාංකේය සිනමාව අර්ථාන්විත ව පොහොසත් කරනු පිණිස උත්සුක වන ප්‍රසන්න ජයකොඩි යි. සිනමාපටය 'සංසාරේ දඩයක්කාරයා'. ඊට පාදක කොටගෙන ඇත්තේ 'සයිමන් නවගත්තේගම දශකත්‍රයකට පමණ පෙර ලියා පළ කළ 'දඩයක්කාරයාගේ කතාව' නමැති නවකතාවේ පළමු පරිච්ඡේදය යි. 'දඩයක්කාරයාගේ කතාව' සුපුරුදු ආඛ්‍යාන විලාසයෙන් මිදුණු සිදුවීම් දමයක් විධිමත් පිළිවෙළකට අවිධිමත් මුහුණුවරකින් සටහන් කළ නවකතාවක්. මෙබඳු නවකතාවක් මෙන් ම එහි එක් පරිච්ඡේදයක් සිනමාවට නැඟීම පහසු කාර්යයක් වන්නේ නැහැ. එහෙත් ප්‍රසන්නගේ සිනමා භාවිතය මෙහිදී එම අපහසුතාව ප්‍රශ්න කරන්නට සූදනම්.

සිනමාපටය නිර්වචනය කළ හැකි නිවැරැදි ම ආකාරය සබුද්ධික ප්‍රේක්ෂකයාට වැටහෙන්නේ සිනමා ශාලාවෙන් නික්ම යන විට. එවිට යි සිනමාපටයේ රුව ගුණ ප්‍රතිකියැවීමකට ලක් කළ හැකි වන්නේ. ඒ අනුව භික්ෂූන් වහන්සේ සංස්කෘතියේ ප්‍රකාශකයා සේ හඳුනාගන්නට පුළුවන්. දඩයක්කාරයා හඳුනාගත හැක්කේ ස්වභාව ධර්මයේ ප්‍රකාශකයා ලෙස යි.

මෙහිදී 'දඩයක්කාරයාගේ කතාවෙ' හි පළමු පරිච්ඡේදය එහෙම පිටින් ම 'සංසාරේ දඩයක්කාරයා' සිනමාපටය කරා රැගෙන නො ඒමට යි ප්‍රසන්න උත්සුක වන්නේ. ඇත්ත වශයෙන් ම ඔහුට හසුවන්නේ එහි ආ එක් නිමේෂයක්. එය ප්‍රවර්ධනයට ප්‍රසන්න දක්වන කැමැත්ත කැපී පෙනෙනවා. මෙතැනදී පැන නගින්නේ ප්‍රසන්න හැරුණු කොට මෙබන්දකට සූදනම් අන් පරිණත සිනමාකරුවකු වර්තමානයේදී අප අතර සිටින්නේ ද යන ප්‍රශ්නයක්.

සිනමාපටය ඇරඹෙන්නේ ප්‍රේක්ෂකයා තැති ගන්වමින්. කැලෑබද ගම් පියසේ එන ගරා වැටුණු විහාරස්ථානයේ දී දම් දෙසුමකට සවන් යොමා සිටින ගෝමරී නමැති යුවතිය වහා නැගිට වනාන්තරය බලා දිව යනවා. ඈ පසුපස දිව එන පුරුෂයාව වසඟ කරගනු පිණිස ගෝමරී හැසිරෙන්නේ ප්‍රචණ්ඩකාරී ව.

සිනමාපටය ඇරඹෙන්නේ ප්‍රේක්ෂකයා තැති ගන්වමින්. කැලෑබද ගම් පියසේ එන ගරා වැටුණු විහාරස්ථානයේ දී දම් දෙසුමකට සවන් යොමා සිටින ගෝමරී නමැති යුවතිය වහා නැගිට වනාන්තරය බලා දිව යනවා. ඈ පසුපස දිව එන පුරුෂයාව වසඟ කරගනු පිණිස ගෝමරී හැසිරෙන්නේ ප්‍රචණ්ඩකාරී ව. හරියට කොටියකු සිය ගොදුර ඇදගෙන යන්නාක් මෙන් ගෝමරී ද මේ පුරුෂයා තම දෑතින් ඇදගෙන රමණයට සුදුසු ස්ථානයක් කරා පැමිණෙනවා. ඔවුන්ගේ රමණය කුරිරු යි. අතිධාවනකාරී යි. ගෝමරී සුරතාන්තයට පත් වෙමින් සිටින මොහොතේදී ම එතැනට කඩාපාත් වන වනාන්තරවාසී කොටියා සියල්ල අන් රූපයකට පෙරළනවා.

භික්ෂූන් වහන්සේට අවැසි වන්නේ එළැඹෙන වෙසක් පොහොය ද සාරසුබාවට ආගමික කටයුතු ඉෂ්ට සිද්ධ කරන්නට. එහෙත් වනාන්තරයේ කොටසක් බඳු දඩයක්කාරයා කල්පනා කරන්නේ මිනිස් ලේ රස වැටුණු කොටියාව මරා නොදැමුවහොත් සිදුවන විනාශය ගැන. සිනමාකරු ප්‍රසන්න මෙතැනදී සිනමාපටයේ අරුතට වුවමනා පසුබිම නිර්ලෝභී ව සකසා දෙනවා. ඒ භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය හා දඩයක්කාරයාගේ අභිප්‍රාය ගැඹුරු සහේතුක සංවාදයක් කරා රැගෙන යාම වෙනුවෙන්.

මෙය ආගමික සංවාදයක්. වරෙක පරිසරය පිළිබඳ සංවාදයක්. අනතුරු ව ජීවිතය හා එහි නා නා මුහුණු පිළිබඳ සංවාදයක්. භෞතික ලෝකය ඉක්මවා ආධ්‍යාත්මික ඉසව්වක් කරා මේ සංවාදය යොමු කරන ප්‍රසන්න ප්‍රේක්ෂකයා හමුවේ දිග හරින්නේ දර්ශනික පසුබිමක්. සබුද්ධික ප්‍රේක්ෂකයනට මේ වටපිටාව ගවේෂණය කරමින් ජීවිතය මතු නොව සමාජය ද කියැවීමේ මාහැඟි අවස්ථාවක් උදකර ගන්න පුළුවන්. එහෙත් ඊට උචිත ඉඩහසර සපයා දෙන්නට ප්‍රසන්න තරමක මැලිකමක් දක්වනවා. ඒ සිනමාපටය විසින් ඉල්ලා සිටිනු ලබන වපසරිය සංස්කරණයට ප්‍රසන්න පියවර ගන්නා නිසා. මේ නිසා සිදුවන්නේ ප්‍රේක්ෂකයන්ගේ පළායාමක්. ඉන් අවධාරණය කෙරෙන අනාගත හුදෙකලාව සම්බන්ධයෙන් ප්‍රසන්න නොපමාව කල්පනා කළ යුතු වෙනවා.

සිනමාපටය නිර්වචනය කළ හැකි නිවැරැදි ම ආකාරය සබුද්ධික ප්‍රේක්ෂකයාට වැටහෙන්නේ සිනමා ශාලාවෙන් නික්ම යන විට. එවිට යි සිනමාපටයේ රූව ගුණ ප්‍රතිකියැවීමකට ලක් කළ හැකි වන්නේ. ඒ අනුව භික්ෂූන් වහන්සේ සංස්කෘතියේ ප්‍රකාශකයා සේ හඳුනාගන්නට පුළුවන්. දඩයක්කාරයා හඳුනාගත හැක්කේ ස්වභාව ධර්මයේ ප්‍රකාශකයා ලෙස යි. සංස්කෘතිය හා ස්වභාව ධර්මය අතර පවත්නා වෙනස මෙතැනදී සඳහන් කෙරෙනවා. එසේ ම සංස්කෘතිය හා ස්වභාවධර්මය එකිනෙක මත යැපෙන බව ද මෙහිලා හඳුනාගන්නට පුළුවන්. ස්වභාවධර්මයට අනතුරුව යි සංස්කෘතිය විෂද කෙරෙන්නේ. සංස්කෘතිය යනු ස්වභාව ධර්මයේ නිර්මාණයක් නොව මනුෂ්‍ය වර්ගයාගේ නිර්මාණයක්. 'සංසාරේ දඩයක්කාරයා' මේ සංකීර්ණ කියැවීම ගෙන එමින් ප්‍රසන්න සමකාලීන ලාංකේය සිනමාවට ලබා දෙන්නේ දාර්ශනික වටිනාකමක්.

මහලු නොවන ටින් ටින්



ප්‍රියන්ජන් සුරේෂ් ද සිල්වා

ටින් ටින්, ස්නෝවී, කැප්ටන් හැඩොක්, තොම්සන් සහ තොම්සන් වැනි චරිත ළමයින්ගේ පමණක් නොව වැඩිහිටියන්ගේද වීරයන්. මේ අය සැබෑ චරිත නොවෙයි. බෙල්ජියානු ජාතික කාටූන් ශිල්පියකු වූ හර්ජිගේ මනසේ නිර්මාණය වූ සදාතනික චරිත. හර්ජි ටින් ටින්ගේ කතාව මුලින්ම ඇන්දේ 1929 වසරේ බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර පළ කෙරුණු Le Vingtième Siècle පුවත්පතේ Le Petit Vingtime නමැති ළමා අතිරේකය සඳහායි. පසුව එය කාටූන් කතා පොත් පෙළක් ලෙස පළවූ අතර භාෂා සිය ගණනකට පරිවර්තනය වෙමින් ලොව පුරා ප්‍රචලිත වුණා. මේ වසරට ටින් ටින්ගේ වයස අවුරුදු 90ක්. ටින් ටින් යෞවන වාර්තාකරුවෙක්. ඔහු ලොව පුරා සංචාරය කරන්නේ තම ෆොක්ස් ටෙරියර් බලු සුරතලා වන ස්නෝවී සමඟයි. මේ චරිතවලට පාදක වූයේ හර්ජි සහ ඔහුගේ සොහොයුරු පෝල්ගේ සැබෑ අත්දැකීම්. මුල්ම කතා මාලාව පළවූයේ 1929 ජනවාරි 10 වැනි දිනයි. ටින් ටින් ඉන් ද ලෑන්ඩ් ඔෆ් ද සෝවියට්ස් නමින් පළ කෙරුණු එම කතාමාලාව ඉතා ජනප්‍රිය වුණා. පසුව හර්ජි ටින් ටින් චරිතය ඇසුරින් පළ කළේ කාටූන් පොත් පෙළක්ම.

ටින් ටින් කතා මාලාවට කෘති 24ක් ඇතුළත්. ටින් ටින් ඉන් ද ලෑන්ඩ් ඔෆ් ද සෝවියට්ස්, ටින් ටින් ඉන් ද කොංගෝ, ටින් ටින් ඉන් ඇමරිකා, සිගාර්ස් ඔෆ් ද පාරාවෝ, ද බ්ලූ ලෝටස්, බ්‍රෝකන් ඉයර්, බ්ලැක් අයිලන්ඩ්, කිං ඔටොකර්ස් ස්කෙප්ටර්, ක්‍රැබ් විත් ද ගෝල්ඩන් ක්ලෝව්ස්, ෂූටිං ස්ටාර්, සීක්‍රට් ඔෆ් ද යුනිකෝන්, රැකම්ස් ට්‍රෙෂර්, සෙවන් ක්‍රිස්ටල් බෝල්ස්, ප්‍රිස්නර්ස් ඔෆ් ද සන්, ස්ෆ්ලෝරස් ලෑන්ඩ් ඔෆ් බ්ලැක් ගෝල්ඩ්, ඩෙස්ටිනේෂන් මූන්, එක්ස්ෆ්ලෝරස් ඔෆ් ද මූන්, කැල්කියුලස් එෆෙයාර්, රෙඩ් සී ෂාක්ස්, ටින් ටින් ඉන් ටිබෙට්, කැස්ටෆියර් එමරල්ඩ්, ෆ්ලයිට් 714 ටු සිඩ්නි, ටින් ටින් ඇන්ඩ් ද පිකාරස් සහ ටින් ටින් ඇන්ඩ් ද ඇල්ප් ආර්ට් එම කෘති පෙළයි. ටින් ටින්ට වසර 90 පිරීමට සමගාමීව ටින් ටින් කතා මාලාවේ පළමු පිටකවරයේ හර්ජිගේ අත්සන සහිත මුල් සිතුවම හර්ජි කෞතුකාගාරයේදී පසුගියදා වෙන්දේසි කෙරුණා. එය අලෙවි වූයේ ඩොලර් මිලියන 1.12කටයි.

හර්ජි යන අන්වර්ථනාමයෙන් ටින් ටින් නිර්මාණය කළ චිත්‍ර ශිල්පියාගේ සැබෑ නම ජෝර්ජස් ප්‍රොස්පර් රෙමී. 1907 උපත ලද ඔහු මිය ගියේ 1983 වසරේදී. ජර්මානු හමුදා බෙල්ජියම ආක්‍රමණය කළ සමයේ ඔහු ප්‍රංශයට පළා ගියා. පසුව යළි බෙල්ජියමට ගියද ඒ වන විට සියලු පුවත්පත් ජර්මානු ආධිපත්‍යය විසින් ගිලගෙන තිබුණා. ඔහු පසුව Le Soir පුවත්පතේ සේවයට බැඳුණා. එම පුවත්පතේද ඔහු ළමයින් සඳහා චිත්‍ර කතා නිර්මාණය කළා.

වසර අනූවක් ගතවුණද ටින් ටින් තාම තරුණ යි. ස්නෝවි ඒ වගේම සුරතල්. කැප්ටන් හැඩොක්ට සහ තොම්සන්ට තවමත් අර්බුදවලට මුහුණදීමට සිදු වෙනවා. ටින් ටින් සදාකාලික නිර්මාණයක් වෙලා අවසන්. ටින් ටින් කතාමාලාව කලකට ඉහත සිංහල බසටද පරිවර්තනය වූ අතර 2011 වසරේදී ස්ටීවන් ස්පීල්බර්ග් විසින් චිත්‍රපටයකටද නඟනු ලැබුවා. එය ඇමෙරිකානු ඩොලර් 375ක ආදායමක් උපයන්න සමත් වුණා.

අවැසි වන්නේ සහෘද සංවේදී නිලදරුවන්

කවර මට්ටමක රජයේ සේවකයකු වුවත් ඔවුන් සියලු දෙනාම සේවය කරන්නේ මේ රටේ පොදු ජනතාව වෙනුවෙන්. මේ නිසා රජයේ සේවකයකුට මානව සබඳතා යන්න ඉතාම වැදගත්. යහපත් රාජ්‍ය සේවාවක් මැනැවින් පවත්වාගෙන යාම සඳහා එය අත්‍යවශ්‍ය වූ කාරණයක්. කවර තරාතිරමක සේවකයකු වුවත් වැදගත් වන්නේ මහේශාක්‍ය ලීලාවෙන් සිටිමින් කටයුතු කිරීම නොවෙයි. තමන් වෙත පැමිණෙන අසරණ මිනිසුන්ගේ ප්‍රශ්න හඳුනා ගැනීමට, ඔවුන්ගේ දුක් වේදනාවලට ඇහුම්කන් දීමට නම් ඒවා තමන්ගේ බවට පත් කර ගත යුතුයි. ඒ සඳහා සුදුසුම මාර්ග වන්නේ කලාව සාහිත්‍යය ඇසුරු කිරීමයි. එමගින් උසස් සාහිත්‍යවේදියකු ද බිහි විය හැකි යි.

නිදසුනක් ලෙස විමලරත්න කුමාරගමගේ කවියාගේ ජීවිතය දැක්විය හැකියි. ඔහු ප්‍රාදේශීය ආදයම් බදු නිලධාරියෙක්. අනුරාධපුර, පුත්තලම, දළදගම, සංගිලිපාලම, කලාවැව, රත්නපුරය, කලවාන වැනි ප්‍රදේශ ගණනාවක රාජකාරි කළ අයෙක්. ග්‍රාමීය අන්ත අසරණ මිනිසුන්ගේ ජීවන රටාව ඔහු ඉතාම හොඳින් අධ්‍යයනය කර තිබුණා. අවසානයේ විමලරත්න කුමාරගම නැමැති අපූරු සාහිත්‍යවේදියා බිහිවන්නේ මේ අයුරින් ඔහු ලබන අත්දැකීම් ඇසුරෙන්. වරෙක ඔහු ලියනවා.

'ගන්තුරු තුලානේ අලියා වැටුණු වැවේ
සුන්දරහාමි එතරම් පොහොසතකු නොවේ' යනුවෙන්.

ඔහුගේ අදහස කොතරම් අව්‍යාජ ද නිර්මාණශීලි දැයි මේ අනුව ඔබට වටහා ගත හැකියි. මේ නිසා රජයේ සේවකයන්ට සිය සේවා කාලය අතරතුරදී සාහිත්‍ය රසවින්දනය සඳහා අවස්ථාව සලසාදීමෙන් සහෘද, සංවේදී මිනිසුන් බිහි කර ගත හැකියි. එය ආකාර කිහිපයකින් සිදුකළ හැකියි. ශෝකාන්ත නාට්‍ය ජවනිකාවකදී එය රසවිඳින ප්‍රේක්ෂකයන් එය තමන්ගේ කරගෙන අඬා වැළපෙමින් තමන්ගේ දුක තුනී කර ගන්නා අත්දැකීම් ඔබටත් තිබිය හැකියි. මිනිසුන්ගේ ආවේග කලා නිර්මාණ බවට පත් කර ගැනීමට උත්සාහ ගන්නවා නම් සමාජයේ ගැටලු කොතරම් විසඳා ගත හැකි ද? සමාජය කොතරම් නම් සුන්දර ද? ප්‍රශ්නයකට මුහුණදීමේදී සුහද ව කතා බස් කර ඒවා විසඳා ගැනීමට සුදුසු මානසික මට්ටමක පාසල් දරුවන් නොසිටීමත් ඛේදවාචකයක්.

'නන්නාදුනන ලෙසේ මඟතොට යළිත් හමුවෙලා
මහමෙර හිසින් දරාගෙන අපි යමු දුරස් වෙලා' යනුවෙන් කපුගේ

රජයේ සේවකයකුට මානව සබඳතා යන්න ඉතාම වැදගත්. යහපත් රාජ්‍ය සේවාවක් මැනැවින් පවත්වාගෙන යාම සඳහා එය අත්‍යවශ්‍ය වූ කාරණයක්. කවර තරාතිරමක සේවකයකු වුවත් වැදගත් වන්නේ මහේශාක්‍ය ලීලාවෙන් සිටිමින් කටයුතු කිරීම නොවෙයි.

පැවසුවත් අපේ දරුවන් එලෙස මනස සකස් කර ගැනීමට තරම් ශක්තිමත් නැහැ. සාමාන්‍යයෙන් පුද්ගලයකුගේ ආවේග පාලනය කර ගත හැකි ක්‍රම 2ක් පවතිනවා. එක් මාර්ගයක් වන්නේ ක්‍රීඩාවට යොමුවීමයි. අනෙක කලාවයි. නැතිනම් සාහිත්‍ය රසවින්දනයයි. ඉන් රජයේ සේවයේ යෙදී සිටින ඔබට සුදුසු හා පහසුම මාර්ගය වන්නේ සාහිත්‍ය රසවින්දනයයි.

නූතන ගීතය සැලකූ විට එය සෙසු කලාංග අතර වඩාත් ප්‍රබල ආකර්ශනීය කලාංගයක් ලෙසයි හැඳින්විය හැකි වන්නේ. රසවින්දනය සඳහා හරවත් වූ ගීත තෝරා ගැනීමත් අප හමුවේ තිබෙන අභියෝගයක්. සෑම විටම කටයුතු කරන්නේ මිනිසුන් සමඟ නිසා ඔවුන්ගේ මනෝභාව, සංවේදනා, චරිත ස්වභාව පිළිබඳ ව ඔබට අවබෝධයක් තිබිය යුතුයි. ඒ සඳහා රසවින්දනය ලබා දෙන්නේ අපූරු සහායක්. ගීතය රසිකයන්ට පමණක් අයත් දෙයක් නොවෙයි. එය සමාජ ප්‍රජාවටම අයත් කලාවක්. ඔබ කවර නම් වූ වෘත්තිකයකු වුවත් ඔබට රසිකත්වයෙන් බැහැර විය නොහැකියි.

වසර 1944දී පමණ එනම් දෙවැනි ලෝක යුද්ධය පැවැති සමයේ හිට්ලර්ගේ නාසි හමුදාව විසින් වසර 3ට ආසන්න වූ කාලයක් (දින 954ක්) ලේනින් ග්‍රෑන්ඩ් නගරය (වර්තමාන පීටර්ස්බර්ග් නගරය) වටලාගෙන සිටිනවා. එවකට රවුසා ගලිමෝවා මාතාව වයස අවුරුදු 04ක දැරියක්. නාසි හමුදාව විසින් එද ලෙනින්ග්‍රෑන්ඩ් නගරයේ ආහාර, ජලය, ඖෂධ ආදි සියලු පහසුකම් අවහිර කර තිබුණා. ජනතාව ජීවත් වූයේ ඉතාම පීඩාවකින්.

මේ නිසා අවසානයේ රුසියානු අණදෙන නිලධාරියා තීරණය කරන්නේ පසුබැසීමට යි.

''මේ අහිමිවන භූමිය කවදාක හෝ අපට ලබා ගත හැකි යි. එහෙත් මේ අහිමිවන ජීවිත කිසිදාක අපට ලබා ගත නොහැකි යි'' ඔහු පවසනවා. එතරම් කුරිරු යුද්ධයක් හමුවේ පවා මිනිස් ජීවිතයක වටිනාකම එද ඔවුන් අවබෝධ කරගෙන යි තිබුණේ.

මිනිසුන්ගේ ආවේග කලා නිර්මාණ බවට පත් කර ගැනීමට උත්සාහ ගන්නවා නම් සමාජයේ ගැටලු කොතරම් විසඳා ගත හැකි ද ? සමාජය කොතරම් නම් සුන්දර ද ? ප්‍රශ්නයකට මුහුණදීමේදී සුහදව කතා බස් කර ඒවා විසඳා ගැනීමට සුදුසු මානසික මට්ටමක පාසල් දරුවන් නොසිටීමත් බේදවාචකයක්.

එහෙත් 2015 වසරේ මාර්තු 2 වැනි ද රුසියාවේ පීටර්ස්බර්ග් නගරයේ ප්‍රධාන වෙළෙඳ සංකීර්ණයක අපූරු සිදුවීමක් සිදු වෙනවා. එම වෙළෙඳ සංකීර්ණයෙන් රවුසා ගලිමෝවා භාණ්ඩ මිල දී ගන්නවා. ඒ වන විට ඇය අවුරුදු 83ක මාතාවක්. ඇය මිල දී ගන්නා භාණ්ඩ අතර බිල්ගත නොවූ කුඩා වෙඩරු පැකට් තුනක් පැවතීම නිසා ඇයට සිදු වෙනවා පොලිස් අත්අඩංගුවට පත් වීමට. අවාසනාවට එහිදී හෘදයාබාධයකින් ඇය මිය යනවා.

ඇය ජීවත් වූ රුසියාවෙ යි ටෝල්ස්ටෝයි, චෙකොෆ්, දෙස්තවුස්කි, ගෝර්කි වැනි ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවන් රැසක් ජීවත් වූයේ. ගෝර්කි පැවසුවේ ''සියලු ශ්‍රේෂ්ඨයෝ අම්මාගේ දරුවෝ ය. ඉර එළියත් මවුකිරිත් ලෝකය නිර්මාණය කරයි. අම්මා අපගේ අතින් අල්ලාගෙන ලෝකයට කැටුව ආවේය'' යනුවෙන්. ගෝර්කි එසේ පැවසූ රුසියාවේ ම අවුරුදු 83ක් වූ මවකට වර්තමානයේ දී ඔවුන්ගේ බටර් කැබලි තුනක් නිසා ජීවිතය අහිමි කර ගැනීමට යි සිදුවුණේ. එය කොතරම් අවාසානවන්ත සිදු වීමක් ද? වර්තමානයේ ලෝකය පුරාම මානව ගුණාංග, මනුස්සකම් අදත් ක්ෂයවෙමිනු යි පවතින්නේ. මේ නිසා වර්තමාන ලෝකයේ මිනිසුන්ට වැඩි වැඩියෙන් අවශ්‍ය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය නොවෙ යි. මනුස්සකම යි. ඒ අහිමි වෙන මිනිසත්කම නැවත ලෝකයට දීමට හැකි වන්නේ දේශපාලඥයන්ට නොවෙ යි. විද්‍යාවට ද තාක්ෂණයට ද එය කළ නොහැකි යි. එය කළ හැකි වන්නේ කලාවට හා සාහිත්‍යයට පමණ යි.

(මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති රසවින්දනාත්මක වැඩසටහනක් ඇසුරින්)

ශ්‍යාමා සන්ධ්‍යානායකගේ

ප්‍රවීණ ගීත රචක - රත්න ශ්‍රී විජේසිංහ

දෙසතිය

පුවත් සඟරාව

ඔබ ළඟට ම ගෙන්වා ගන්න.

දෙසතිය

සඟරා දායකත්ව

දෙසතිය සඟරා දායකත්ව වාර්ෂික / අර්ධ වාර්ෂික ලබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 1,536.00/ රු. 768.00 මුදල ..... අංක හා .....

දින දරන චෙක්පත/ මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් " ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් " නමට ලියා, ගෙවන කාර්යාලය පොල්හේන්ගොඩ, උප තැපැල් කාර්යාලය, කොළඹ 05 ලෙස සඳහන් කළ යුතුය. එවිය යුතු ලිපිනය: දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05.

සඟරා ලැබිය යුතු ලිපිනය :

නම : .....

ලිපිනය : .....

.....

.....

ඔබගේ දුරකතන අංකය - .....

ශ්‍රී ලංකා නෙට්බෝල් කණ්ඩායම

ජුඩිත් ප්‍රියානි පෙරේරා

නොබෝදා එංගන්තයේ ලිවර්පුල්හි නිමාව දුටු ලෝක නෙට්බොල් තරගාවලියේ ශූරතාව දිනා ගන්නා ලද්දේ නවසීලන්ත කණ්ඩායම යි. ඒ, අවසන් මහා තරඟයේදී ලකුණු 51-52 ක් වශයෙන් ලබා ගනිමින් ඕස්ට්‍රේලියානු කණ්ඩායමට එරෙහි ව. මෙහි තෙවැනි ස්ථානය එංගලන්ත කණ්ඩායමට හිමි වුණා.

අයි.එන්.එෆ්. ලෝක නෙට්බෝල් කුසලානය සිව් වසරකට වරක් පැවැත්වෙන්නේ ලෝක නෙට්බෝල් සංගමයේ අනුග්‍රහයෙන්. එය මෙවර පැවැත්වුණේ 15 වැනි වරට යි. ප්‍රථම තරඟය 1963 වර්ෂයේ පැවතියේ ඊස්තෝරන්හිදී. ඉන් ප්‍රථම ස්ථානය ඕස්ට්‍රේලියාව දිනා ගත් අතර දෙවැනි ස්ථානය හිමි කර ගත්තේ නවසීලන්තය. ලෝක නෙට්බෝල් කුසලානය මේ වන විට වැඩි ම වාර ගණනක් දිනා ගෙන තිබෙන්නේ ඕස්ට්‍රේලියාව. නවසීලන්තය පස් වතාවක් ද ට්‍රිනින්ඩැඩ් සහ ටොබාගෝ කණ්ඩායම් එක් වතාවක් ද ලෝක කුසලානය දිනා ගත්තා.

1963 වර්ෂයේ පැවති තරඟාවලියේ 9 වන ස්ථානයට පත් වුව ද ඉන් අනතුරුව ශ්‍රී ලංකා කණ්ඩායමට සතුටුදායක ස්ථානයක් ලබා ගැනීමට හැකි වුණේ නැහැ. කෙසේ වෙතත් මෙවර තරඟාවලියේ ශ්‍රී ලංකාවට හිමි වූයේ 15 වැනි ස්ථානය යි. වැඩි ම ගෝල සංඛ්‍යාවක් ලැබූ ක්‍රීඩිකාව ලෙස තර්ජනි සිවලිංගම් අභිෂේක ලැබීම මේ තරගාවලියේ විශේෂත්වයක්. ඇය තරඟාවලිය පුරා ලබා ගත් මුළු ගෝල ප්‍රමාණය 348 ක්. එය ශ්‍රී ලංකාව ලැබූ එක්තරා ජයග්‍රහණයක්.

2019 ජුලි 12 වැනි දා සිට 21 වැනි දින දක්වා රටවල් 16 ක් සහභාගි වූ ලෝක නෙට්බෝල් කුසලානය තරගාවලියේ කණ්ඩායම් අතර පැවති තරග ගණන 60ක්. මේ සියලු ම තරඟ ලිවර්පුල් අංගනයේ පැවති අතර ප්‍රේක්ෂකයන් 11,000කට ආසන පහසුකම් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පුහුණුවීම් මධ්‍යස්ථාන හා පරිපාලන අංශ ද ඊට එක්කර තිබුණා.

ජාත්‍යන්තර නෙට්බෝල් සංගමයේ ශ්‍රේණිගත කිරීමට අනුව ප්‍රමුඛ ස්ථානයේ සිටින ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ජැමෙයිකාව, දකුණු අප්‍රිකාව සහ මලවි යන රටවල් සහ සත්කාරකත්වය හිමි වූ එංගලන්තය නිරායාසයෙන් ම ලෝක නෙට්බෝල්

සිව් වසරක අපේක්ෂාව

ලෝක නෙට්බෝල් ශූරතාව

ජයග්‍රාහී නවසීලන්ත කණ්ඩායම

කුසලානය සඳහා සුදුසුකම් ලැබූ අතර සෙසු රටවල් මහද්වීප මට්ටමින් සුදුසුකම් ලැබීමේ තරඟවලට සහභාග වීමෙන් පසුව යි මේ තරඟාවලියට ඇතුළු වූණේ. ඒ අනුව යුරෝපා මහද්වීපයෙන් ස්කොට්ලන්තය හා උතුරු අයර්ලන්තය ද ඕස්ට්‍රේලියානු මහද්වීපයෙන් ෆීජි හා සමෝවා ද අප්‍රිකානු මහද්වීපයෙන් උගන්ඩාව හා සිම්බාබ්වේ ද ඇමරිකානු මහද්වීපයෙන් ට්‍රිනින්ඩැඩ්, ටොබාගෝ හා බාබර්ඩෝස් ද සුදුසුකම් ලැබුවා. ආසියානු මහද්වීපයෙන් එම භාග්‍යය හිමිවූයේ ශ්‍රී ලංකාවට හා සිංගප්පූරුවට යි.

චතුරංගි ජයසූරිය නායකත්වය ඉසිලූ ශ්‍රී ලංකා කණ්ඩායමට දර්ශිකා අබේවික්‍රම, ගයනි දිසානායක, තර්ජනි සිවලිංගම්, තිළිණි වෑත්තේගෙදර, ගයන්ජලි අමරවංශ, හසිනා මෙන්ඩිස්, දීපිකා දර්ශනි, දුලාංගි වන්නිතිලක, දුලාංගි දනන්ජී, ඊ. සෙතුකරල, නවුවලි රාජපක්ෂ යන ක්‍රීඩිකාවන් එක් ව සිටියා.

ලෝක නෙට්බෝල් කුසලාන තරඟාවලිය පැවතියේ කාණ්ඩ කිහිපයක් යටතේ යි. මලි වටයේ පළමු කණ්ඩායමට අයත් වූ රටවල් නම් කරනු ලැබුවේ ඒ, බී, සී යනුවෙන්. එම කණ්ඩායම් අතුරින් ශ්‍රී ලංකාව "ඒ" කණ්ඩායමට අයත් වූ අතර ඊට අයත් සෙසු රටවල් වූයේ ඕස්ට්‍රේලියාව, සිම්බාබ්වේ හා උතුරු අයර්ලන්තය යි, එම රටවල් අතර පැවති කිසිදු තරගයක් ජයග්‍රහණය කිරීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් වූයේ නැහැ. ඉන් අනතුරුව පැවති මුල් වටයේ දෙ වැනි කණ්ඩායම් තරඟවලදී ඊට අයත් වූ රටවල් ඊ, එෆ්, ජී යනුවෙන් නම් කරනු ලැබුවා. ශ්‍රී ලංකාව "ඊ" කණ්ඩායමට අයත් වූ අතර සමෝවා, ෆිජි, සිංගප්පූරුව ඊට අයත් වූ අනෙකුත් රටවල්. මේ යටතේ සිංගප්පූරුව සමඟ පැවති තරඟයෙන් ශ්‍රී ලංකාව ජය ගත්තේ ලකුණු 88-50 ක් ලබා ගනිමින්. එහෙත් සමෝවා සමඟ පැවති තරඟයේ ලකුණු 55-65 ක් ලෙස ද ෆිජි සමඟ පැවති තරඟයේ ලකුණු 44-59 ක් වශයෙන් ද ලබා ශ්‍රී ලංකාව පරාජයට යි පත් වුණේ. කෙසේ වෙතත් අවසන් පූර්ව වටය සඳහා සුදුසුකම් නොලැබූ බැවින් අවසන් තරගය සඳහා ශ්‍රී ලංකා කණ්ඩායමට තිබූ සිහිනය බොඳ වී ගියා. ඒ අනුව ලෝක නෙට්බෝල් කුසලාන අවසන් ශ්‍රේණිගත කිරීම සඳහා පැවති තරගයෙන් ශ්‍රී ලංකාව ලකුණු 78-57ක් වශයෙන් ලබා 15 වැනි ස්ථානයට පත් වූ අතර සිංගප්පූරුවට හිමිවූයේ අවසාන ස්ථානය යි.

ලෝක නෙට්බෝල් කුසලානය 2023 වර්ෂයේදී 16 වැනි වරට පැවැත්වීමට නියමිත ව ඇත්තේ දකුණු අප්‍රිකාවේ කේප් ටවුන්හිදී. කෙසේ වෙතත් ආසියාවේ කිරුළ දිනා සිටින ශ්‍රී ලංකා නෙට්බෝල් කණ්ඩායමට එම තරඟාවලිය සුවිශේෂී අත්දැකීමක් වනු ඇතැ යි යන්න යි අපගේ අපේක්ෂාව.

ජගත් රිදී තිරයේ විශ්වීය රංගනය

තාරක සෙනරත්

හොලිවුඩ් නිෂ්පාදනයක් වන ඉනඩියානා ජෝන්ස් ඇන්ඩ් ද ටෙම්පල් ඔෆ් ඩූම්' සිනමාපටයට රංගනයෙන් දායක වීමට අයිරාංගනී සේරසිංහට අවස්ථාව හිමිවෙනවා. එය ඇමරිකානු ඇකඩමි සම්මානලාභී චිත්‍රපට අධ්‍යක්ෂකවරයකු වන 'ස්ටීවන් ස්පිල්බර්ග්'ගේ සිනමා කෘතියක්. ඇගේ අධ්‍යාපන පසුබිම මෙලෙස බටහිර සිනමාවට එක්වීමට ඇයට වඩාත් රුකුලක් වුණා.

1984 වසරේදී ශ්‍රී ලාංකාවේදී ද සිනමාපටයේ දර්ශන රූගත කෙරුණු අතර එයට හැරිසන් ෆෝඩ්, කේටි කැප්ෂෝ වැනි බටහිර නළුනිළියන් රැසක් රංගනයෙන් දායක වුණා. ඉන්දියාවේ පැවැති ඇතැම් අභිචාර හා සමාජ ක්‍රම ග්‍රහණය කරගත් බටහිර ක්‍රියාදාම චිත්‍රපටයක් ලෙස මේ සිනමාපටය හැඳින්විය හැකි යි. තම දරුවන් වහල් කුලීනයන් විසින් බිලි පූජාවන්ට හා වහල් සේවයට ගෙන ගිය අවස්ථාවක අසරණ වූ මවකගේ චරිතයට යි අයිරාංගනී පණ පෙවිවේ. රූගතකිරීම් අවසානයේ ස්පිල්බර්ග් "මම ඔබ විශ්වාස කළා. ඔබ එය ඉටු කළා." යනුවෙන් පැවසීම ඇගේ රංග ප්‍රතිභාවට ලබා දුන් හොලිවුඩ් සම්මානයක් වැනි යි.

2007 වසරේදී කැනේඩියානු සිනමා සම්මාන හා ඇකඩමි සම්මාන දිනූ අධ්‍යක්ෂිකාවක හා තිර රචකාවියක වන දීපා මේතාගේ 'වෝටර්' සිනමා පටයට සම්බන්ධ වීමට ද ඇයට අවස්ථාව ලැබෙනවා. ලංකාවේ ද රූගත කළ මේ සිනමාපටය ඉන්දියානු වැන්දඹුවන්ගේ අඳුරු ජීවිත ලෝකයට නිරාවරණය කරන, මහා කතිකාවක් ඇති කළ සිනමා කෘතියක්.

මෙහි වැන්දඹුවක වන නැන්දම්මාගේ චරිතයට යි අයිරාංගනී රංගනයෙන් දායක වුණේ. එහිදී ඇය ඉන්දියානු සංස්කෘතික අංග උකහා ගනිමින් එම චරිතය මනාව නිරූපණය කළේ 'ජෝන් ඒබ්‍රහම්' හා 'සීමා බිස්වාස්' වැනි ඉන්දීය නළුනිළියන් හා උරෙන් උර ගැටෙමින්.

ඉන්ඩියානා ජෝන්ස් ඇනඩ් ද ටෙම්පල් ඔෆ් ඩූම්

වෝටර්

වෝටර්

දෙසතිය
පුවත් සඟරාව
50/-
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dig.gov.lk www.news.lk

Department of Government Information
news.lk
Department of Government Information
news.lk
Department of Government Information
news.lk
GFU Sri Lanka